# 2025 නොවැම්බර් මස 04 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |

| | | | |
|---|---|---|---|
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2025.11.04 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2025.10.07 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්දජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2025.10.07 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2025.10.07 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන :-</u>

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

02(1) ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා විදේශගතවීම හේතුවෙන් මහා සභාවට පැමිණීමට නොහැකි බව මා වෙත දන්වා තිබෙනවා.

## 03 <u>සභාව අමතා එවන ලද ආයචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම අපි විපක්ෂයක් විදිහට ක්ෂණිකව කළු පටි පැළඳ ගන්නට කටයුතු කරේ, විශේෂයෙන්ම අපි දන්නවා පසුගිය මාසයේ වැලිගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ලසන්ත වික්‍රමසේකර සභාපතිතුමා නිල රාජකාරි කරනකොට, නිල කාමරය තුළ ඝාතනයට ලක් වෙනවා. ඉතිහාසයේ කළු පැල්ලමක් මොකද මහජන ඡන්දයෙන් තේරී පත්වුණු මහජන නියෝජිතයා, සභාපතිවරයෙක් ආයතනයේ ප්‍රධානියා තමන්ගේ නිල කාමරයේ මහජන දිනයේදී ඝාතනයට ලක් වෙනවා. අන්න ඒ නිසා තමයි අපි අපේ විරෝධය පළ කරන්න අතේ කළු පටි පැළඳගෙන සිටින්නේ. නගරාධිපතිතුමනි මරණය සිදුවුණාට පසු අපි දැක්කා විවිධ මාධ්‍ය තුළ විවිධ චෝදනා එල්ල වෙනවා. අපි ඇත්තටම එයාගේ පෞද්ගලික තොරතුරු නෙමෙයි මහජන නියෝජිතයෙක් විදිහට විශාල ජනවරමකින් පත්වුනේ. මම දන්න විදිහට මුළු ලංකාවම තමුන්නාන්සේලාගේ පක්ෂයට විශාල ජනවරමක් ලැබෙනකොට, 1950ක ඡන්ද ප්‍රමාණයක් අරගෙන 67% ප්‍රතිශතයක් ලබාගත්ත මහජන නියෝජිතයෙක් තමයි මේ විදිහට ඝාතනය වෙන්නේ. මේ දේවල් ඇතිවෙන්නට නරකයි. දැන් මීට සුළු මොහොතකට පෙරාතුව අපිට ආරංචි වෙනවා අම්බලන්ගොඩ නගර සභාවේ වෙඩි තැබීමක් සිදුවුණා කියලා. මේක පක්ෂ විපක්ෂයක් නෙමෙයි. යම්කිසි පක්ෂයකට නෙමෙයි, සජබෙ වෙන්න පුළුවන්, තමුන්නාන්සේලාගේ පක්ෂය වෙන්න පුළුවන් කොහොම හරි මේ වගේ අවිනිශ්චිත තත්වයක් මතු වෙන්නට ඉඩ තියෙනවා සමහරක් තමුන්නාන්සේලාගේ නගර සභාවේ සභාපතිවරයෙක් කියලා තිබුණා තර්ජනයක් එල්ල වෙනවා කියලා පාතාලෙන්. අපි දැක්කා උපසභාහපතිවරයෙක්ට පහර දීමක් වෙලා තියෙනවා. මම හිතන්නේ මන්ත්‍රීවරු විදිහට අපිත් වගකීමක් පැහැර හරිනවා අපි ජනතාවගේ නියෝජිතයින් විදියට මෙතනට පත්වෙලා ඇවිල්ලා සාමාන්‍ය කෙනෙක් දකිනවට වඩා කාර්යභාරයක් සිදු කරනවා. තමන්ගේ ගෙවල් වල රැඳෙන්නෙ නැතුව ජනතාවගේ ඕනෑ එපාකම් රැයක් දහවලක් නොබලා සෑම මන්ත්‍රීවරයෙක්ම ඉටු කරනවා. නමුත් සමහරක් අවස්ථාවලදී අපිම හැල්ලුවට ලක් කරගන්න අවස්ථා තියෙනවා අපේ තනතුර. ඒ නිසා අපි ඉතා ඕනකමින් කියනවා ලසන්ත වික්‍රමසේකර සභාපතිවරයාගේ ඒ මරණයේ අවසාන දිනයේදී පුද්ගලිකව මම සහභාගි වුණා. මම ගියේ දුම්රියේ. එතකොට ප්‍රමාදයක් තියෙන නිසා අපි මඟින් බැහැලා ඉදිරියට යන්න ගියේ අපි හතර දෙනෙක් ගියා ත්‍රිවිල් එකට නැගලා. යන ගමන් රියදුරු මහත්මයා කියනවා මේ සභාපතිවරයාගේ හොඳකමට තමයි මේ හතර දෙනෙක්ව දාගෙන යන්නේ නැත්නම් දාගෙන යන්නෙ නෑ කියලා. රුපියල් 1000 ක් විතර ගන්න ඕන හයර් එකට අපෙන් ගත්තේ රුපියල් 500 වගේ මුදලක්. අපි තව හොයලා බැලුවා ඉතාමත් ජනප්‍රිය පුද්ගලයෙක්. ගමේ මිනිස්සු හැමෝම හොඳ කියන පුද්ගලයෙක් මැතිවරණ කාලසීමාව තුළ එතුමා නිවෙස් වලට ගහපු පෝස්ටර් එහෙම්මම නිවෙස්වල තියාගෙන ඉන්නවා. එතුමාගේ අවමංගල්‍යය උත්සවය සිදුකරේ සුසාන භූමියක නෙමෙයි එතුමාගේ ඉඩමක. මම නිකම් ඇහුවා තැන හොයාගන්න ඕන නිසා එයාගේ වතගොත ඒ පැත්තේ පර්චස් එකක් කීයක් වෙයිද කියලා එක්කෙනෙක් කිව්වා ලක්ෂ පහක් විතර වෙනවා කියලා. ඒවගේම තවත් ඉඩම් රාශියක් මෙතුමට තියෙනවා ඒ කියන්නේ වත්කමක් තියෙන පුද්ගලයෙක් එතුමා. අවමංගල උත්සවයට ස්වාමීන් වහන්සේලා හැත්ත පහකට වඩා සහභාගි වුණා. විශාල ජනකායක් සහභාගි වුණා ඇත්තටම හොඳ අනාගතයක්, හොඳ දේශපාලන ගමනක් යන්න තිබුණු පුද්ගලයෙක් කියලා අපට වැටහුනා. මේ අවස්ථාවේදී අපි දැක්කා පාර්ලිමේන්තුවේදී ඒ විෂය භාර ඇමතිවරයා කියනවා අයි ආර් සී ලේබලයක් තියෙන පුද්ගලයෙක්ට ආරක්ෂාව දෙන්නේ නැහැ කියලා. පොලිස්පතිවරයා

කියනවා ආරක්ෂාව දෙන්න එතුමා නියෝග කරා කියලා. ඉතින් මෙතන ඉතාම පරස්පර තත්ත්වයක් තියෙන්නේ. ආරක්ෂාව දෙන්න බෑ කියනවා ඇමතිවරයා පොලිස්පතිවරයා කියනවා ආරක්ෂාව දෙන්න කිව්වා කියලා. එතුමා එතුමාගේ ජීවිතය ඉල්ලා හිටියා. එතුමාට ආරක්ෂාව ඉල්ලා හිටියා. එතුමාට ආරක්ෂාව ලබා දෙන්න කටයුතු කළේ නැහැ. පෞද්ගලිකව නැතත් ඒ සභාවට ආරක්ෂාව දුන්න නම් හොඳයි කියලා හැඟීමක් අපිට තියෙනවා. ඒ නිසා මන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මීට පෙර සභාව අපි පවත්වාගෙන යද්දි මේ සභා භූමියට පොලිස් ආරක්ෂාව ලබා දුන්නා. මෙතන ඉන්නවා මන්ත්‍රීවරු 51ක් ඒ නිසා මම හිතනවා වඩාත් හොඳයි සභාව තියෙන දවසට හරි ආරක්ෂාව ලබා දෙන එක කියන ඉල්ලීම කරනවා. නැවතත් ඒ ලසන්ත වික්‍රමසේකර වගේ සභාපතිවරු මහජන නියෝජිතයන් ඝාතනය නොවන තැනට අපි වැඩ කරමු කියලා ඉල්ලනවා.

**03(2)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මා ප්‍රථමයෙන්ම මට ලැබුණු ලිපියක් සභාගත කරනවා පාලිත සමන් පීරිස්, නො. 37 සමුද්‍රාසන්න පාර, අඟුලාන කියන ලිපිනයේ පදිංචි මහත්මයා තමයි මේ ලිපිය එවලා තියෙන්නේ. මොරටුව අඟුලාන දුම්රියපොළ ආසන්නයේ විශාල වශයෙන් ගස් වැවීම නිසා අද අඟුලානේ ඉන්න ජනතාව විශාල අනතුරකට, අවදානමකට ලක්වෙලා තියෙනවා. අඟුලාන දුම්රිය ස්ථානය ආසන්නයේ දෙපැත්ත රේල් පාරවල් දෙක මැද විශාල ගස් වැවිලා තියෙනවා. ඒ නිසා කෝච්චිය එනවා වත් එතනින් යන කෙනෙකුට පේන්නේ නැහැ අනතුරක් බොහොම අතලඟයි. සමහර විට ඒක නගර සභාවට අයිති නොවෙන්න පුළුවන්, සීජීආර් එකට අයිති වෙන්න පුළුවන් හැබැයි අපිට වගකීමක් තියෙනවා මහජන නියෝජිතයන් හැටියට මැදිහත් වෙලා ඒ ජනතාව මුහුණ දෙන අවදානම අයින් කරන්න. අපි විශේෂයෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරලා සේවක මහතුන් යොදවලා මෙතන සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා. මම මේ ලිපිය සභාගත කරනවා.

**03(3)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඊයේ දිනය විශේෂ දවසක්. ඔබතුමාට මේ වෙනකොට සමහරවිට ආරංචි වෙලත් ඇති. ඊයේ දවසේ අපිට පණිවිඩයක් ආවා, අපේ ජනසෙත පුස්තකාලයේ බලෙන් කවුරුහරි ඇවිල්ලා අඹ කඩනවා කියලා. එතකොටත් අඹ ගෝනි ගානක් කඩලා කියලා තමයි අපිට ආරංචිය ආවේ. අපි මන්ත්‍රීවරු හරහා සිද්ධිය සොයලා බලනකොට අපිට දැනගන්නට ලැබුණේ ඔබතුමා විසින් ජනසෙත පුස්තකාලය ඔසවා තබන්නට පත්කරපු ජනසෙත පුස්තකාලයේ පුස්තකාලාධිපති තනතුරේ වැඩ බලන පුස්තකාල සහායක තනතුරේ ඉන්න මහත්මිය ඒ අඹ ගස බදු දීලා. පසුව අපි නාගරික කොමසාරිස්තුමියට කතා කරලා ඇහුවා ඔබතුමිය අඹ ගහ බදු දුන්නද කියලා. මහා නගර සභා ආඥා පනත අනුව නගර සභාවක තියෙන දේපල වල අයිතිය තියෙන්නේ නාගරික කොමසාරිස්වරියට. මේක කොමසාරිස්වරිය දන්නෙත් නෑ. අපි මේ අවස්ථාවේදී එතුමියට ස්තූතිවන්ත වෙන්න ඕනේ? මොකද මෙතුමිය තමන් ගන්න ඕන පියවර නිසියාකාරව ගත්තා කියන ඒකයි අපේ විශ්වාසය. හේතුව ඔබතුමාට මතක ඇති කාලෙකට උඩදී තේක්ක ගස් කැපීම සම්බන්ධයෙන් නගරාධිපතිවරයාට එරෙහිව නඩුවක් තිබුණා. මම ඒ අවස්ථාව වෙනකොට නියෝජ්‍ය නගරාධිපතිවරයා. රාවතාවත්ත උසාවියේ තමයි එම නඩුව දාලා තිබුණේ. ඒක හිටපු නගරාධිපතිවරයාට දාපු නිසා ඒක නගර සභාවේ හිටපු නීති නිලධාරීගේ උදව්වෙන් ගලවගත්තා. හැබැයි අනුනමයෙන් තමයි නගරාධිපතිවරයා බේරුනේ. පොදු දේපල අවභාවිතයෙන්. මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය යොමු කරනවා. කරුණාකරලා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා මේකට අවශ්‍ය පියවර ගන්න. මෙය හොඳ දෙයක් නෙමෙයි මේක මහා

නගර සභා ආඥා පනත අනුව රජයේ නිලධාරියෙක් හැටියට ඇය කරලා තියෙන්නේ ලොකු වරදක්. ඔබතුමා අද උදේ බොහොම හොඳ වැඩක් කරලා මේ වැඩේ පටන් ගත්තේ. ඒ නිසා අපි මේක ඉදිරිපත් කරන බරත් 50ට 50ක් අඩු කළා. අපි මීට වඩා ගොඩක් කරුණුත් එක්ක තමයි ඉදිරිපත් කරන්න හිටියේ, හැබැයි ඔබතුමා අද හොඳ දෙයක් කරලා පටන් ගත්ත නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ අඹ සිද්ධිය සම්බන්ධයෙන් විනිවිද ජේන නියමාකාර තීන්දුවක් දෙන්න. ඒ ගැන නියමාකාර පරීක්ෂණයක් කරලා මේකට අවශ්‍ය නීතිමය පියවර ගනියි කියලා අපි බලාපොරොත්තුව වෙනවා.

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ආයාචනා හා පෙත්සම් යටතේ මට අදහස් කිහිපයක් තියෙනවා ඔබතුමාට ඉදිරිපත් කරන්න, රාවතාවත්ත පොදු සුසාන භූමිය සම්බන්ධව. පොදු සුසාන භූමියට භූමිදාන කටයුතු සිදුකිරීම සඳහා දිනකට මම හිතන්නේ මරණ හතරක් පහක් එනවා. සමහර දවසට මරණ හයක් විතර එන දවසුත් තියෙනවා. හැබැයි අනිවාර්යයෙන්ම මරණ තුනක් හෝ හතරක් නම් එනවමයි. මේ සුසාන භූමියට දිනකට එක වතාවක් හරි යන පුද්ගලයෙක් හැටියට, භූමිදාන කටයුතු කරන අවස්ථාවේදී ඒ මිනිවල් හාරන අපේ සභාවේ සේවකයින් මම හිතන්නේ ගොඩක් දින වලදී දෙදෙනෙකු විතරයි යොදවලා තියෙන්නේ. මම දැක්ක දෙයක් මම මේ කතා කරන්නේ. ඉතින් මේ දෙන්නෙකුට තමයි සමහර දිනවලදී මිනිවලවල් හතරක් විතර කපන්න සිද්ධ වෙලා තියෙන්නේ. හැබැයි මම ඒ ගැන නෙමෙයි කතා කරන්නේ. ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ රාජකාරි කරන්න ඕනේ. නමුත් මේ දාලා ඉන්න සේවකයෝ දෙදෙනා දෛනිකව වැටුප් ලබන අය මම ගිය මාසේ 29 වෙනිදා සුසාන භූමියට ගිය වෙලාවෙත් සභාවේ සේවකයෙක් රිසිට් එකක් අරන් ආවා හරියටම පහයි තිහයි එතනට එද්දී ඒ සේවක මහතා රිසිට් එක අරගෙන ඒත් තව වලක් කපන්න. එදා දවසෙත් මේ දෙදෙනා ම වලවල් තුනක් විතර කපලා හිටියේ. පහමාරට විතර එනවා තව වලක් කපන්න. දවසකට රුපියල් 1080 වගේ වැටුපක් තමයි මොවුන්ට ලැබෙන්නේ. හැබැයි එයාලගේ සේවය එය නිසා ඔවුන් ඒකට පැකිළුනේ නැහැ මම එතන තව පැය එකහමාරක් විතර හිටියා. ඒ වෙනකොට ඒ මිනිස්සු දෙන්නා ඒ වලත් බාගයක් විතර කපලා ඉවරයි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා ඔබතුමාගේ අවධානය යොමු කරනවා, සභාවේ අවධානය යොමු කරනවා. 1050ක් වගේ වැටුපක් ඒ සේවකයන්ට ලැබෙන්නේ. දීමනාවක්වත් ලැබෙන්නේ නෑ ගරු නගරාධිපතිතුමනි ඔවුන් ස්ථිර සේවකයන් නොවන නිසා. ඒ සේවකයෝ එතන හොඳට වැඩ කරගෙන යනවා. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මොවුන්ගේ අර වැඩි කරන වැටුප ඉතා ඉක්මනින් වැඩි කරලා මොවුන්ට ඉතාමත් කාර්යක්ෂම, සුභවාදී ලෙස සභාවට හිතවත් විදියට වැඩ කරමු. කියන ඉල්ලීම කරනවා.

**03(5)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අප සභාවට අයත් ගිලන් රථ සේවාව සම්බන්ධව කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා. මේ මෑත දින කිහිපයකදී සිද්ධීන් කිහිපයක් සිදුවුණා. මම හිතන්නේ ගිය සතියේ ඔසඳ මන්ත්‍රීතුමාව හම්බවෙන්න ආපු ලේඩි කෙනෙකුත් පඩි පෙළෙන් එන්න ගිහිල්ලා පඩි පෙළේ වැටිලා අනතුරකට ලක්වුනා. ඒ මහත්මියවත් අරන් යන්න බැරි වෙලා තියෙනවා, මම හිතන්නේ ගිලන් රථය කැඩිලා. නගර සභාවේ සේවිකාවකගේ මවකටත් අසනීප වෙලා අපිට දැනුම් දෙනකොට අපි ගිලන් රථය ඉල්ලපු අවස්ථාවේ දූල්සිරි මහත්තයා කියපු දේ තමයි ගිලන් රථය කැඩිලා තියෙන්නේ කියලා. ඒ වගේම තමයි කාලයක් අපේ පෙර පාසලේ උගන්නපු සුමනා ගුරුතුමිය එතුමියත් මම හිතන්නේ මෙහෙට ආපු වෙලාවක කලන්තයක් හැදිලා එතුමියව යවන්න සිදුවුණෙත් ත්‍රීවිලර් එකක තමයි එතකොටත් ගිලන් රථය කැඩිලා. හැබැයි අපි දැක්කා සේනක විපක්ෂක නායකතුමා කිව්වා

වගේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සාතනයට ලක් වෙනකොට මොනතරම් පරිශ්‍රමයක් යොදන්න උනාද කියලා ඒ සේවකයන්ට සභාපතිතුමාව ඒ කැබ් රථයේ දාගෙන යන්න. දෙකට තුනට නවලා තමයි සභාපතිතුමාව ඒ කැබ් රථයේ දාගත්තේ හෙට දවසේ මේ වෙඩිල්ල මොරටුවේ කෙනෙකුට වෙන්න පුළුවන්. එම නිසා අඩුගානේ මැරෙන මොහොතේ හරි බොඩි එක දෙකට තුනට නවා ගන්නේ නැතුව ඉස්පිරිතාලට අරන් යන්න මේ ගිලන් රථය ඉතා ඉක්මනට යථා තත්ත්වයට පත් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොරටුවේ අපි සභාව භාරගන්නකොට ගිනි නිවීම් සේවාවක්වත් මේ නගර සභාවේ තිබුණේ නැහැ. අපි ඒවා කරලා මේ අවශ්‍ය කරන උපකරණ ලබා දීලා අපිට පුළුවන් තරම් වැඩ කොටසක් අපි කරා. කොමසාරිස්තුමියගේ කාලෙටවත් අපේ කාලෙටවත් බැර කරන්නෙ නැතුව, ඇඟිලි දික් කරන්නේ නැතුව අත්‍යවශ්‍ය සේවාවක් විදියට හිතලා ඉතා ඉක්මනින් මේ ගිලන් රථය හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(6)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, දිගරොල්ල දිනපොළ සම්බන්ධව ගැටළුවක් තියෙනවා. මේ වෙළඳපොළේ දෛනික වෙළඳාම් කරන වෙළඳුන් හැර වෙළඳපොලේ වැඩිම වෙලාවක් හිටියේ ඔබතුමා ඔය පුටුවට එන්න ඉස්සෙල්ලා. මම මේ වෙළඳපොළට යන කෙනෙක් හැටියට මම හැම වෙලාවේම දැක්කා ඔබතුමා සභාවට වඩා නියෝජනය කළේ එතන. ඔබතුමා මේ සභාව තුළ හැමදාම දිනපොළ ගැන කතා කරපු නැති දවසක් නැති තරම්. හැම වෙලාවෙම ඔබතුමා මේ දිනපොලේ මොකක් හරි අඩුපාඩුවක් තමයි මේ සභාව තුළ පෙන්වලා දුන්නේ. හැබැයි ඔබතුමා ඔබතුමාගේ දේශපාලනය එතන කරනකොට ඒ ව්‍යාපාරිකයන් එක්ක එකතුවෙලා තමයි ප්‍රචාරණ කටයුතු කරේ. ඔබතුමා එතන ඉඳලා හොඳ පණිවිඩයක් දුන්නා මේකේ තියෙන අඩුපාඩු සම්බන්ධව. ඔබතුමාට තමයි වැඩිම දැනුමක් තියෙන්නේ ඒක අපි පිළිගන්නවා, මොකද ඔබතුමා එතන ඉන්න කෙනෙක් හැටියට හැබැයි ඒ වෙළඳ ප්‍රජාවත් විශ්වාස කරා ඔබතුමා ඔය පුටුවට ආපු ගමන්ම මේ තියෙන තත්ත්වය සමනය කරලා හොඳ වෙළඳපොලක් බවට පත් කරයි කියලා. නමුත් ඔබතුමා ආවට පස්සේ මම හිතන්නේ ඉතා හොඳ වැඩක් මම දැක්කා මීට සති කිහිපයකට ඉස්සෙල්ලා, නගර සභා සේවකයින් අරන් ගිහිල්ලා ඒ වෙළඳ කුටියට ඉදිරියෙන් ඉරක් ගහලා අඩි දෙක තුනක් ඉස්සරහින් අඩි දෙකක් විතර තියලා සතියක් විතර දැක්කා ඒක කරගෙන යනවා හැබැයි මමත් දැන් සතියක ඉඳලා එතනට යන කෙනෙක් හැටියට දැන් ඉරටත් වඩා මෙහාට දිගරොල්ල වෙළඳපොලේ ඒගොල්ලෝ අරගෙන ඒ කටයුතු කරගෙන යනවා අපිට තියෙන තත්ත්වය ඕක නෙමෙයි. ඔබතුමා ඔතන ඉඳලා ඔබතුමා ලොකු දැක්මක් දැකලා කරන්න පටන් ගත්තු වැඩෙන්ම ඔබතුමා ආසාර්ථක වෙලා තියෙනවා. ඒ නිසා එහෙම වෙන්න දෙන්න එපා මොකද අපිට වඩා මේ වෙළඳපොල ගැන මේ සේවකයන් ගැන ඔබතුමාට කැක්කුමක් තිබුණා. ඒ නිසා මේවා නිසි යාකාරව කරන්න. මේ වැඩ කිසිම තේරුමක් නැතුව යනවා. සේවකයෝ අරන් ගිහිල්ලා මේවා හරියට නැත්නම් කිසිම තේරුමක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(7)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සෞඛ්‍ය කම්ටුවේ තියෙන කැලිකසල ගෙනියන කරුණ මේකෙන් ඉවත් කරන්න එපා කියලා මම ගිය සභාවේදී ඉල්ලීමක් කරා. මොකද මේ වෙනකොට ට්‍රැක්ටර් කැඩිලා තියෙනවා. ඉදිබැද්ද ප්‍රදේශයේ, විලෝරාවත්ත ප්‍රදේශයේ ලොකු ට්‍රැක්ටරේ යන්න බැරි පාරවල් තමයි ගොඩක් තියෙන්නේ. හැබැයි මේ මාර්ග මීටර් පන්සීයක්, විතර 300ක් විතර දිගයි. ප්‍රධාන මාර්ගයට ලොකු ට්‍රැක්ටරේ ගිහිල්ලා එන්න කිව්වහම ඒ අය කුණු උඩට අරගෙන එන්නේ නැහැ. ඒ නිසා සමහරක් මාර්ගවල අය සති දෙක තුන මේ ඉදුල් කුණු දාගන්න විදිහක් නැතුව ප්‍රශ්න

ගණනාවකට මුහුණ දීලා ඉන්නවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරලා ඉතා ඉක්මනින් අත්ට්‍රැක්ටර් ටික හදලා මේ ප්‍රශ්නය විසදයි කියලා බලාපොරොත්තු වෙනවා.

**03(8)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මා හට ලිපි කිහිපයක් ලබා දී තිබෙනවා කේ.පී.ඩබ්. ටයිටස් ද සිල්වා, ආතර් පෙදෙස, කල්දෙමුල්ල, මොරටුව. අඟුලාන දුම්රිය පාරේ සිට දහම් මාවතට, ආතර් පෙදෙසට යාබඳව ඇලක් තියෙනවා ඒක පිරිසිදු කරලා දෙන්න කියලා තමයි මේ ලිපියෙන් ඉල්ලීම කරලා තියෙන්නේ. ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(9)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අයි.එම්. තිලකරත්න, අංක 31/ B, අනුර මාවත, බොරුපන. අනුර මාවතේ කාලෙක පටන් පාර කැඩිලා තියෙනවා. පාර පිළිසකර කරලා දෙන්න කියලා මේ ලිපියෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. මම එම ලිපියත් සභාගත කරනවා.

**03(10)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අජිත් ප්‍රසන්න, අරලිය පෙදෙස, කල්දෙමුල්ල, මොරටුව. මේ ලිපියෙන් ඉල්ලන්නේ එම පාර කැඩී ඇති නිසා එම පාර ඉතා ඉක්මනින් පිළිසකර දෙන්න කියලා. මම ලිපිය සභාගත කර සිටිනවා.

**03(11)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, පෙත්සම් හා පැමිණිලි යටතේ මා වෙත ලැබුණු පැමිණිලි කිහිපයක් සභාවට ඉදිරිපත් කරන්න කැමතියි. ජනාසිරි මාවත, මොරටුමුල්ල කියන ස්ථානයේ පදිංචි නිමාලි මහත්මිය විසින් අත්සන් විසිපහකින් යුක්තව කානු පද්ධතිය පිරිසිදු කර දෙන්න කියලා ඉල්ලා තිබෙනවා. පොඩි සඳහන් කිරීමක් කරොත් මොරටුව මෙතෝදිස්ත දේවස්ථානය ඉදිරිපිට ජනාසිරි මාවත මිනිස් වාසයට නුසුදුසු ඉතාම දුර්ගන්ධයක් හමන මාර්ගයක් බවට පත්වෙලා තියෙන බවයි එතුමිය සඳහන් කරන්නේ ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ජානක ප්‍රනාන්දු, නො: 61/5 මොරටුමුල්ල කියන ස්ථානයේ පදිංචි එතුමා විසින් මා වෙත ඉදිරිපත් කරලා තියෙනවා ඉහත සඳහන් මාර්ගයේ දීපානන්ද රාම පාරට අයත් අඩක් නිම කර ඇති මාර්ගය ගල් අතුරා ප්‍රතිසංස්කරණය දෙන ලෙසත් ඉල්ලීමක් කරනවා එම ඉල්ලීම සභාගත කරනු ලබනවා.

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මොරටුමුල්ල මධ්‍යම කලාපය පිරිසිදු කිරීම සම්බන්ධව කරුණු කිහිපයක් කතා කරන්න කැමතියි. මෙතෙක් මාස කිහිපයක් මගේ වැඩකටයුතු කරගන්න ලැබුණා. නමුත් දැන් සමහර නිලධාරීන් කියනවා මේ මධ්‍යම කලාපය තුළ නායකත්වය දරන්නේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන් නිසා ඒ යටතේ අපේ වැඩ ගොඩක් අතපසු කිරීම් වලට ලක් කරනවා. උදේට ඇවිල්ලා මන්ත්‍රීවරුන් පිරිසක් අපිට මෙන්න මේ දේවල් විතරයි කරන්න ඕනේ කියලා කියනවා කියලා ඒ නිලධාරීන් අපිට කියනවා. ඒ සම්බන්ධව මන්ත්‍රීතුමිය සභාවේදී කතා කරන්න කියලා නිලධාරීන් අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. අද මම මන්ත්‍රීවරියක් වෙලා ඉන්නේ රුපියලකවත් කොමිස් මුදලක් ලබාගෙන නෙමෙයි. පාරවල් හදලා අපි සල්ලි අරගෙන නැහැ අපි ප්ලෑන් පාස් කරලා අපි සල්ලි අරගෙන නැහැ. ඒ නිසා අපි ජනතා සේවයට අපේ මුදල් වියදම් කරලා තමයි අපේ සේවය කරන්නේ. ඒ නිසා මම මෙතනදි බලාපොරොත්තු වෙන්නේ ඔබතුමාගේ මධ්‍යම

කලාපයේ කණ්ඩායම අපිට අපගේ වැඩකටයුතු කරන්න බාධාවක් නොවෙයි කියන එක තමයි. ඔබතුමාට පුනපුනා ප්‍රකාශ කරන්නේ ඔබතුමා මන්ත්‍රීවරුන්ට සහයෝගය පළකරන බව මම දන්න නිසා. නමුත් ඔබතුමාගේ කණ්ඩායමේ පිරිසක් අපගේ වැඩ කටයුතුවලට බාධාවක් වෙනවා. මහා නගර සභා අඥා පනතත්, අපි පළාත් පාලන විෂය දන්න පිරිසක් විදියට හදාරන පිරිසක් විදිහට, උපතේ සිට විපත දක්වා නෙමෙයි නගර සභා පරිපාලනය තුළ උපදින්නට කලින් දරු කළලය ඉඳන් මරණින් පස්සෙත් සේවය කරන ස්ථානයක්. ඒ නිසා මහජන නියෝජිතයින් විදිහට විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා එහෙම කරන්න දෙන්න එපා. මොකද එහෙම උනොතින් නැති ප්‍රශ්නයක් ඇතිවේවි අපිට අපේ වැඩ කරන්න සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ඊයේ දිනයේදී අවසන් ගමන් ගියා නගර සභා සේවකයෙක් එතුමා මම හිතන්නේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණා ඔබතුමාට. එතුමාගේ සේවය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවෙලා තිබුනා. එතුමාගේ පවුලේ පිරිසක් මගෙන් ඉල්ලීමක් කරා මම හිතන්නේ මේ අවස්ථාවේදී එතුමාට අපි ගෞරවයක් දැක්විය යුතුයි. සභාවේ සේවකයෙක් කම්කරුවෙක් විශේෂයෙන්ම අනුන්ගේ කුණු අතගාන මිනිස්සු කියන්නේ ජීවිතය පුදුම දුකක් විදින මිනිස්සු. පණුවො ද කුණු ද හැම දෙයක්ම අතගාලා අවුරුදු පහළොවක්ම අපිට සේවය කරපු පුද්ගලයෙක් තමයි. මේ අවසන් ගමන් ගියේ එතුමාගේ අභාවය ගැන ප්‍රථමයෙන්ම අපි කනගාටුව ප්‍රකාශ කරනවා පක්ෂයක් විදියටත් මන්ත්‍රීවරු විදිහටත්. මොකද ජීවිතය අවුරුදු පහළොවක් අනුන්ගේ කුණු ඇද්දා කියන්නේ ඒ පුද්ගලයා තමන්ගේ ජීවිතය අහවරය කරපු විදිය ගැන අපිට හිතන්න ගොඩක් දේවල් තියෙනවා. අපි හැමෝම මනුස්සයෝ අපි කැමති නැහැ කුණු ගොඩවල් මැද්දේ ජීවත් වෙන්න නමුත් ජීවත්වෙන්න රස්සාවක් ඕනේ. බොහොම සංවේදී මනුෂ්‍ය ප්‍රශ්න මේවා. එතුමා වෙනුවෙන් අපෙන් විය යුතු දෙයක් තියෙනවා කියලා තමයි ඒ පවුලේ ඤාතීන් කියන්නේ. එතුමා වෙනුවෙන් අපිට කරන්න පුළුවන් මොනාද කියලා අපි සාකච්ඡා කරමු, එතුමාට දරුවන් දෙදෙනෙක් ඉන්නවා අවුරුදු 15ක සහ අවුරුදු පහක ඒ නිසා ඒ දරුවන් නඩත්තු කරන්න භාර්යාවට හැකියාවක් නැති තත්ත්වයකට පත්වෙලා ඉන්නවා එ නිසා ඔවුන් වෙනුවෙන් යමක් කරන්න කියලා ඉල්ලනවා. අපි පක්ෂයක් විදියටත් පොදුවේ මනුෂ්‍යයෝ විදිහටත් කුණු අදින සේවකයින්ට අපි කොච්චර වැටුප් ගෙව්වත් මදි. ඒ මිනිස්සු මළකුණු අදින, අපේ කාණු වල කුණු සුද්ද කරන, අපේ ගෙවල්වල තියෙන කුණු පණුවොත් එක්ක තියෙන කුණු ගෙනියන මිනිස්සු. ජීවිතය මොකක්ද කියලවත් දන්නේ නැති මිනිස්සු. ගොඩක් අයගෙන් මම ඇහුවා ඒ මිනිස්සු කියන්නේ මන්ත්‍රීතුමිය මේ ජහජරාව අතගාලා කොහොමද අපි ගෙදර ගිහිල්ලා බත් කටක් කන්නේ ප්‍රියතාවයක් නැතුව කියලා. ඕක තමයි සැබෑ තත්ත්වය. ඔබේ මන්ත්‍රීවරුන්ටත් කියන්නේ කරුණාකරලා මිනිස්සුන්ට පීඩනයක් දෙන්න එපා කියලා. මනුස්ස ජීවිතය කියන්නේ හිතෙන දේට වඩා මිනිස්සු ජීවත් වන ආකාරය වෙනස්, හම්බ කරන විදිය වෙනස්, මිනිස්සුන්ට ලැබෙන සතුට වෙනස්, මනුස්සකම කියන එකත් එක්ක මේ නගර සභාව තුළ ඉදිරි පාලනය ඔබතුමා ගෙන යයි කියලා මට විශ්වාසයක් තියෙනවා. විශේෂයෙන්ම මධ්‍යම කලාපයේ ඔබේ මන්ත්‍රීතුමාලාට අවධාරණය කරන්න මනුස්සකමින් පිරි සමාජයක් බිහි කරන්න හැමෝටම සහය දෙන්න කියලා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජේ. සෙනවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, බෝධිරාජ මාවත පටන් ගන්න ස්ථානයේ ඇති කාණුව කැඩිලා තියෙනවා. මීට පෙර මේ කාණුව පිළිසකර කිරීම සඳහා ලක්ෂ විසි දෙකක් වැනි විශාල මුදලක් වැය කරලා තියෙනවා. හිටපු නගරාධිපතිවරයාගේ නිවසට යන පාරත් මේක. ඒකට විශාල මුදලක් වෙන්කරලා

තිබුණා. පාර මුල කැඩිලා තියෙනවා. ඒ පාරේ ජනතාව විශාල පීඩාවකට ලක් වෙලා තියෙනවා. ඒ කාණුවේ එහා කෙළවරේ වතුර බහින්න පුළුවන් පැත්තට නෙමෙයි වතුර බැස්ම තියෙන්නේ. මේ කරුණ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(16)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජේ. සෙනවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෙන්ඩිස් පාරේ ජලය බැස යාම සඳහා නලයක් දාලා දීලා තියෙනවා. ඒ නලය ප්‍රමාණවත් නැති බව මෙන්ඩිස් පාර ජනතාව දැනුම් දීලා තියෙනවා. මේ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කොරලවැල්ල පළවෙනි පටුමග ජනතාව විසින් මා හට ලිපියක් භාර දීලා තියෙනවා. මම හිතන්නේ ගරු නගරාධිපතිතුමනි කොරළවැල්ල පලවෙනි පටුමග මුල සිට මීටර් පනහක් විතර තාර දාලා තමයි තියෙන්නේ. හැබැයි දැන් වාහනයකටවත් යන්න බැරි තත්ත්වයක් තමයි කොරළවැල්ල පළවෙනි පටුමග තියෙන්නේ. වලවල් ගොඩක් හැදිලා තියෙනවා. ඒ මීටර් 50න් එහාටත් කුට්ටිගල් අතුරලා තමයි තියෙන්නේ.සමහර ගල් කැඩිලා වාහනයකට තියා මනුස්සයෙක්ටවත් යන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා කොරලවැල්ලේ පළවෙනි පටුමගේ ජනතාව ලිපියක් මගින් ඉල්ලීමක් කරලා තියෙනවා පාර සංවර්ධනය කරලා දෙන්න කියලා එම ලිපිය මම සභාගත කරනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ටකරන් දෙවට මාර්ගය පිළිසකර කර දෙන්න කියලා ඒ ජනතාව විසින් ලිපියක් ලබා දීලා තියෙනවා. මම හිතන්නේ කුඩා වැස්සකටත් යට වෙනවා. ඒ වගේම තමයි ටකරන් දෙවට වෙසෙන ජනතාව රැකියාවට යද්දිත්, පාසල් ළමුන්ටත් පාසල් වලට යද්දීත් අපහසුතාවයට පත්වෙනවා වැසි ජලයට යට වීම නිසා. අයවැය යෝජනා යටතේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා ටකරන් දෙවට සංවර්ධනය කරලා දෙන්න කියලා. මේ ලිපියත් මම සභාගත කර සිටිනවා.

**03(19)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා</u>

ගරු නගරාධිපතිතුමා, හය වැනි පටු මගේ ජනතාව මා හට ලිපියක් ලබා දී තියෙනවා බුදු මැදුර ළඟ සිට අඩි එකසිය හැත්තෑවක් දුරට හයවෙනි පටුමගේ වතුර රැඳෙනවා කියලා සාමාන්‍යයෙන් වැසි දවස් වලට පාසල් ළමයින්ටවත් දහම් පාසල් යන දරුවන්ටවත් යා නොහැකි තත්ත්වයක් තියෙනවා. ඒක අනිත් පාරත් එක්ක සමානව තියෙන්නේ. ඒ නිසා කඩිනමින් පාර සහ කාණු පද්ධතිය සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(20)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනි වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මා නියෝජනය කරන කටුබැද්ද ග්‍රාම නිලධාරී වසමේ කටුබැද්ද රාහුල විද්‍යාලයේ ක්‍රීඩා පිටිය පිටුපස වීන නිවාස ව්‍යාපෘතියට මායිම්ව, වෙන්දේසි වත්ත සහ දන්දෙනිය වත්ත දෙසට දිවෙන මාර්ගයේ කොටසක් අබලන්ව ඇත මෙම මාර්ගය දෛනිකව පාසල් ශිෂ්‍යයන් සහ ප්‍රදේශවාසීන් භාවිතා කරන අතර වර්ෂා කාලයට මාර්ගයේ ඇති වළවල් වැසි ජලයෙන් පිරී යාම හේතුවෙන් පාසල් ළමුන් සහ ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවයකට හා දුෂ්කරතාවලට ලක්වන බව කියලා ඔවුන් හැට දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් අත්සන් සහිතව ඡායාරූප සහිතව ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. එම ලිපිය මම සභාගත කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, කොරලවැල්ල ටකරන් දෙවට පිළිබඳව මැනීම් කටයුතු සියලු දේ හමාර කරලා අවසන්. ඒක දැන් සිදුවෙමින් පවතින ක්‍රියාවලියක් බවට මම සහතික කරනවා. එම නිසා එම යෝජනාව පෙත්සම සහ පැමිණිලි අයිතමයෙන් අයින් කරගන්න මෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, තාම අපේ මන්ත්‍රීවරුන්ට සභා ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුමක් නැති බව තමයි අපිට පෙනී ගියේ ඒ නිසා ඔබතුමා කරුණාකරලා ඔවුන්ව දැනුවත් කරන්න කියලා ඉල්ලීම කරනවා.

**03(21)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මුලින්ම ස්තුතිවන්ත වෙන්න ඕනේ අපේ හෙල්පින් ඩෙස්ක් එක සම්බන්ධයෙන්. එය කිව්වා වගේම කර්මාන්ත අංශයට එන කට්ටියට ලොකු පහසුවක් බවට පත්වුණා. නමුත් දාලා තියෙන එක නිසි ක්‍රමවේදයක් සහිතව පටන් අරගෙන නැහැ අපිට කිව්වේ එම්.පී වගේ ආයතනයකින් ළමුන් දෙන්නෙක් අරගෙන වැඩේ පටන් ගන්නවා කියලා. මම දැක්කා කර්මාන්ත අංශයේ ළමයෙක් දාලා ඉන්නවා. නමුත් ෆෑන් එකක්වත් නැහැ. එතන හරියට හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(22)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, කටුබැද්ද සහ ලුනාව ඇවිදින මන්තීරු වල රෑට ඇවිදිද්දී ලයිට් ටික නැහැ. කුඩා දරුවොත් ඇවිදිනවා, කාන්තාවෝ ඇවිදිනවා. සමහරක් තැන්වල යනකොට මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා. ළමයි කොහොමද යන්නේ. ඒ නිසා මෙතන අනාරක්ෂිතයි. ලයිට් එකක් හරි තිබුණානම් එතන මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න බැහැනේ. ඔවුන් එතන දාන ලයිට් කඩනවද කියන්න මම දන්නේ නැහැ. ඒ නිසා ඉතා ඉක්මනින්ම හොයලා බලලා මේ ඇවිදින මන්තීරුවල තියෙන අඩුපාඩු සකසා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(23)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම ආණ්ඩු පක්ෂයේ ඉද්දි, මොරටුවේ ටවුන් එකේ අවුරුදු 18ක විතර මන්ත්‍රීවරයෙක් විදිහට ඉද්දි, ගොඩක් වෙලාවට සමන්ලාල් නගරාධිපතිත් එක්ක මරාගන්නවා කුණු සම්බන්ධව. මුල් කාලයේදී ටවුන් එකේ සහ ඒ තදාසන්න ප්‍රදේශයේ කුණු තිබුනේ නැහැ. දැන් නැවත වතාවක් ආපහු කුණු තියෙනව නගරාධිපතිතුමා. මම ඔබතුමාව දැනුවත් කරා මේ සම්බන්ධයෙන්. පදික වෙළෙන්දෝ ඇවිල්ලා වෙළඳාම් කරලා ඒ කුණු ටික පාර දාලා යනවා. මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නන් හට කීයක් හරි දීලා ඒවා තැන් තැන් වලට අරන් ගිහිල්ලා කුඩු බොන මිනිස්සු ඒවා ගිහින් තැන් තැන්වල දාලා කලවම් කුණු බවට පත්වෙනවා. දැන් නැවත වතාවක් කලවම් කුණු අදින තත්ත්වයට පත්වෙලා තියෙනවා. සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගේ දැන ගැනීම පිණිස මම කියන්නේ. සුජිත් මන්ත්‍රීතුමා දකින්න ඇති අර බෝ ගහ ගාව ලොකු කුණු ගොඩක් තියෙනවා. රවිනාත් ගුණසේකර නගරාධිපතිතුමාගේ කාලයේදීත් ලොකු කුණු ගොඩක් තිබුණු තැන අපි සුද්ධ පවිත්‍ර කරා නැවත වතාවක් ආයේ අර පේමට් වෙළෙන්දෝ තැන් තැන් වල කුණු දාලා යනවා. කලවම් කුණු කරදියානට ගිහිල්ලා දැම්මට පසුව අපිට සල්ලි ගොඩක් ගෙවන්න සිද්ධ වෙනවා. ටවුන් එක ආපහු දුගඳ හමන තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද ලක්ෂ තුනහමාරක විතර පිරිසක් මොරටුව දුම්රිය පොළ සහ බස් නැවතුම්පොළෙන් ගමන් කරනවා.

හදවත බඳු මොරටුව නගරය පිරිසිදුව තබා ගැනීම අපේ යුතුකමක් වගකීමක් වෙනවා. ඒ නිසා මේ සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ ඉදිරිපත් කරන්න යන ඉල්ලීම මම මීට කලින් ලිඛිතව ඔබතුමාට බාර දුන්නා. නමුත් පහුගිය සභාවේදීත් මම මේක ගැන කතා කරා. නාගරික ඉංජිනේරුතුමා ඒක ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ඒක කරන්න මේ සභාවේ කවුරුත් නැහැ කියලා. නමුත් මම නැවත වතාවක් පැමිණිලි හා පෙත්සම් යටතේ ඉල්ලීමක් කරනවා ලුනාව ප්‍රධාන මංසන්ධියේ සී වීව් රේසිඩන්ස් නිවාස සංකීර්ණයේ ඉදිරිපිට තියෙන කාණුවේ ඉතාම විශාල බරකින් යුතුව තිබෙන ස්ලැබ් ඉවත් කරලා බර අඩු ස්ලැබ් ලෑලි යොදලා දෙන්න කියලා ඒකෙ අඩියක් විතර පරතරය තියෙනවා කාණුවේ. ඒ නිසා කීපදෙනෙක්ම මේ කාණුවට වැටිලා තියෙනවා. ලොකු අනතුරක් සිදු වුණේ නැහැ. නමුත් ලොකු අනතුරක් සිදුවීමට ඉඩ තියෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ කටයුත්ත ඉක්මනින්ම ඉටු කරලා දෙන්න කියලා.

**03(25)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි සියලු දෙනාම සැලකිලිමත් විය යුතු කාරණාවක් පහුගිය දිනක මාධ්‍ය වල වාර්තා වුණා. ලාදුරු රෝගය හිස ඔසවනවා කියලා. එතකොට ලාදුරු රෝගය කොළඹ දිස්ත්‍රික්කයේ වැඩි ප්‍රමාණයක් පැතිරෙමින් තියෙන්නේ මොරටුව ප්‍රදේශයේ. මොරටුව බල ප්‍රදේශීයේ ලාදුරු රෝගය ඉතාමත් ශීඝ්‍රයෙන් පැතිරෙන බව සෞඛ්‍ය අංශය වාර්තා කරලා තියෙනවා. මේක ඉතාමත් භයානක සැලකිය යුතු තත්ත්වයක් මොකද මේක ලාදුරු රෝගය පැතිරීම සම්බන්ධයෙන්, රෝගය වැළඳීම සම්බන්ධයෙන් ලී කුඩු බලපානවා කියලා වෛද්‍යවරුන්ගේ මතයක් තියෙනවා. එතකොට ලී කුඩු වැඩි ප්‍රමාණයක් තියෙන්නේ මොරටුවේ නිසා මේ ලාදුරු රෝගය මොරටුවේ වැඩි ප්‍රමාණයක් පැතිරීමේ සම්භාවිතාව ඉහළයි කියලා අපිට හිතන්න පුළුවන් ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා සෞඛ්‍ය කමිටු සභාපතිතුමා ඇතුළු අපේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාත් ඒ වගේම එම්.ඕ.එච්. එකත් සම්බන්ධ කරගෙන මේ සම්බන්ධයෙන් කඩිනම් ව්‍යාපෘතියක් මේ සභාව විදිහට ආරම්භ කරන්න අපේ සෞඛ්‍ය අංශ එකතු කරගෙන කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(26)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මීට පෙරත් ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ලේඛනයක් ඉදිරිපත් කළා. කොරලවැල්ල මධ්‍යම බෙහෙත් ශාලාව නගර සභාවේ අපේ ගොඩනැගිල්ලට ගෙනල්ලා තියෙනවා. නමුත් ප්‍රදේශවාසීන් ඉල්ලන්නේ මෙය අපේ ප්‍රදේශයේ, කොරලවැල්ල ස්ථානයකට වෛද්‍යවරයා යොමු කරලා මේ සේවාව ලබාදෙන්න කියලා. මොකද මිනිස්සුන් සෑහෙන්න අපහසුතාවයට පත්වෙලා මිනිසුන්ට එන්න මුදල් නැහැ. ඔබතුමාගේ අවධානය යොමු කරලා කොරලවැල්ල ප්‍රදේශයේ ක්‍රීඩාංගන මාවතේ අපේ තියෙනවා පුස්තකාලෙ උඩ මේක ගෙනිහිල්ලා මිනිසුන් සහනයක් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මිනිස්සුන්ට ලොකු දුරක් එන්න බැරි කමක් තියෙනවා. වයස වැඩි පුද්ගලයන් ගොඩක් ඉන්නවා බොහොම අමාරුවෙන් තමයි ඔවුන් එන්නේ ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සර්වජන බල පක්ෂය වශයෙන් ලසන්ත වික්‍රමසේකර වැලිගම ප්‍රාදේශීය සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් බලවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම කියන්න කැමතියි ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් තමයි ඝාතනයට ලක්වෙලා තියෙන්නේ මේවා ජාතික

මට්ටමේ ප්‍රශ්න. හෙට ඔබතුමා වෙන්න පුළුවන් මම වෙන්න පුළුවන් ඒ නිසා මෙවැනි තත්ත්වයන් පිළිබඳව අපි කණගාටු වෙනවා. විශේෂයෙන්ම බලයට පත්වීමට පෙර මාලිමා ආණ්ඩුවේ සමහර මන්ත්‍රීවරු  ප්‍රකාශ කරා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ටියුෂන් දෙන්නත් ඔවුන්ට හැකියාව තියෙනවා කියලා නමුත් තමුන්නාන්සේලා අවංකව පිළිගන්න ඕන අද රටේ භීතියක් ඇතිවෙලා තියෙනවා. ව්‍යාපාරික මහතුන්ට විවිධ කටයුතු කරන අයට වෙඩි තියලා යන්න පුළුවන් එහෙම තත්ත්වයක් රට තුළ ඇතිවිය යුතු නැහැ කියලා අපි විශ්වාස කරනවා. මේ සම්බන්ධව ඉහළට දැනුවත් කරන්න කියලා ඉල්ලීම කරනවා. ඒ වගේම අපගේ ශෝකයේ සර්වජන බල පක්ෂය වශයෙන් ප්‍රකාශ කර සිටිනවා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී  -  ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 2025 සැප්තැම්බර් මාස 9 වන දින සභා වාරයේදී මම ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කරා. ඔලිවර් ප්‍රනාන්දු මහතාගේ ඒ ප්‍රශ්න මාලාවට සාධාරණ වශයෙන් පිළිතුරු ලැබුණේ නැහැ කියන එක එතුමා මට ඉල්ලීමක් වශයෙන් මාව දැනුවත් කරා. නැවත වතාවක් කරුණු පහක් ඉදිරිපත් කරල තියෙනවා මම ප්‍රශ්නාවලියක් වශයෙන්  එය ඉදිරිපත් කරන්නේ නැහැ, මේ කරුණු පහ මට එකින් එක කියන්න අවශ්‍යතාවයක් නැහැ මම ඉල්ලීමක් කරනවා මේ කරුණු පහට එතුමාට මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කරන්න බැරි නම් ලිඛිතව ලබන සභා වාරයට පෙර හෝ මාව දැනුවත් කරන්න කියලා මේ කරුණු සම්බන්ධය විශේෂයෙන්ම මේ සඳහා අවධානය යොමු කරලා. කොමසාරිස්තුමිය හා ලේකම්තුමා ඇතුළු මේ සභාවෙන් මා ඉල්ලීමක් කරනවා නගරාධිපතිතුමනි ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ සඳහා අවශ්‍ය පිළිතුරු ටික ලබා දෙන්න කියලා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී  -   තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පුරන්අප්පු රජමාවතේ ඔසඳ මන්ත්‍රීතුමාලගේ ගෙවල් පාරෙම ඉන්නවා එම්.පී. සිල්වා කියලා මහත්මියක්. ඒ මහත්මියගේ ගේ ඉදිරිපිට විශාල වශයෙන් කුණු එකතු වෙනවා එතන තියෙන බෝ ගස් තුනක් තියෙනවා. ඒ බෝ ගස් තුනේම කොළ වැටෙනවා. අපි අතුගානවා, නමුත් අතුගාලා පිරිමහන්න බැහැ ඒ නිසා මම ඉල්ලා සිටිනවා ඒ ගස් තුන කපලා දාන්න කියලා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී  -   සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, න්‍යාය පත්‍රයේ අංක තුන යටතේ වාචික ඉදිරිපත් කිරීමක් තියෙනවා මට කරන්න මොරටුව එගොඩඋයන  කොට්ඨාශයේ බස් සේවාව, මෝදර තුඩුවේ සිට මොරටුව දක්වා දිවෙන බස් සේවාව, දැනට ධාවනයෙන් ඉවත් වෙලා තියෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී  -   සිත්ති මෂිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම නිවැරදි නම් ලංකාවේ දිගම සෙන්ටර් ලයින් එක තියෙන්නේ මොරටුව නගරයට. නමුත් අපිට බැරිවෙලා තියෙනවා ඒ සෙන්ටර් ලයින් එක ලස්සනට තියාගන්න. මේ මෑතකදී අර වැස්ස වෙලාවේ ලොකු ගහක් කඩන් වැටිලා ඒ අතු කපලා සෙන්ටර් ලයින් එකේම තියලා තියෙනවා. ඒවත් පුළුවන් ඉක්මනට ඉවත් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී  -   ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, පැමිණිලි හා පෙත්සම් යටතේ අතුරු මාවත පිළිසකර කර ගැනීමට එම වැසියන් විසින් ලිපියක් බාර දී තිබෙනවා මා එය සභාගත කර සිටිනවා.

**03(33)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා මොරටුව අතුරු පාරවල් ගැසට් කරගෙන යන අවස්ථාවේදී සාම පෙදෙස පීරිස් මාවත යන පාරවල් දෙකත් ගැසට් කර දෙන ලෙස එම වැසියන් විසින් මා හට ලිපියක් මගින් දන්වා තිබෙනවා. පීරිස් මාවතේ නගර සභාවට අවශ්‍ය කරන ප්ලෑන සහ ඔප්පුව මේ සමග අමුණලා එවලා තියෙනවා. ඔවුන්ගේ පෞද්ගලික ඉඩමකින් තමයි මේ පාර ලබා දීලා තියෙන්නේ. ඒක නගර සභාව සතු පාරක් කරලා තියෙනවා. ඔවුන්ගේ පවුලේ අයට අවශ්‍ය වෙලා තියෙනවා පීරිස් මාවත නමින් එම පාර ගැසට් කර ගන්න ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(34)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, විශේෂයෙන් මම ඔබතුමාගේ අවධානයට කරුණු කිහිපයක් යොමු කරන්න කැමතියි පළවෙනි එක තමයි අපි දකින විදිහට මේ මොරටුවේ හදවත නැවතිලා වගේ තමයි. මේ මොරටුවේ තියෙන අපේ ඔරලෝසු කණුව ගොඩක් කල් ඉඳන් නැවතිලා තියෙනවා. මම මේ ඔබතුමාගේ අවධානය යොමු කරා. ඒ නිසා අපි මේ මොරටුවේ හදවත නැවතිලා වගේ තියෙන ඒ ඔරලෝසු කණුවට නැවතත් පණ දෙන්න පුළුවන්. ඒ ගෘහ නිර්මාණ ශිල්පියටත් ප්‍රශ්නයක් නොවන ආකාරයට ඒ ගෘහනිර්මාණ ශිල්පය ගත්තහම ඒක බොක්ස් ටයිප් එකකට තියෙන්නේ. ඒ නිසා කොමර්ෂල් ක්‍රෙඩිට් ආයතනය ඉස්සරහා තමන්ගේ මේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනවා ඒ නිසා මම හිතනවා ඔවුන්ට යම් පැවරීමක් කලොත් මේ ඔරලෝසු කණුවටත් ඔබතුමා එදා අර කියපු විදිහට පරණ තිබ්බ ඔරලෝසුවේ අර ක්‍රියාත්මක වන ක්‍රමවේදය දන්න කාර්මික ශිල්පියවත් හොයාගෙන මේකට පණ දෙන්න පුළුවන් කියලා ඒ නිසා  පිළිබඳ නීත්‍යානුකූලත්වය පිළිබඳව අවධානය යොමු කරලා නැවත වතාවක් මේ මොරටුවේ හදවත වගේ තියෙන ඔරලෝසු කණුවට පණ දෙන්න කියලා මේ සභාවට මම යෝජනා කර සිටිනවා.

**03(35)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මා ස්තූතිවන්ත වෙනවා අපේ සභාවේ සියලු දෙනාටම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව විශේෂයෙන්ම අපේ කොමසාරිස්තුමිය විශේෂයෙන් ලොකු වෙහෙසක් ගත්තා හෙල්පින් ඩෙස්ක් කියන කන්සෙප්ට් එක ගේන්න අද ඒක ස්ථාපිත කරලා ඒක ක්‍රියාත්මක කරන්න පටන් අරන් තියෙනවා. විශේෂයෙන් පළවෙනි අවස්ථාවේ අපේ ප්ලෑන් එක බාර දෙනකොට අපිට අවශ්‍ය වෙලා තිබුණා. ජනතා කාලය අපතේ නොයන පුරෝගාමී සුහදශීලී සේවාවක් අපිට පළවෙනි පාර ප්ලෑන් එක භාර දුන්නහම තුන් හතර පාරක් එන්න වෙනවා ඒ ඔක්කොම අඩුපාඩු ටික කියලා නගරාධිපතිතුමනි රස්තියාදු නොවන විදියට මේ සේවාව උපකාරක මේසේ කියන එක ආරම්භ කරා. ඒ නිසා ඔබ සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා.  විශේෂයෙන් මේ සඳහා අනෙකුත් ආයතන වලින් ගෙවීමක් කරලා ගන්න පුළුවන් ළමයි ටිකත් අරගෙන ඔවුන්ට යම් පුහුණුවක් ලබා දෙන්න ඕනා. ගැමුණු පෙරේරා වගේ හොඳ දැනුමක් තිබ්බව ඉන්ජිනේරු මහතුන් මෙහි සිටියා. සමහර කාරණා අපි ඔවුන්ගෙන් ඉගෙන ගත්තේ. ඒනිසා ඔවුන්වත් ගෙනල්ලා මේ ළමයි එක්ක සාකච්ඡා කරලා, අපේ මොරටුවේ ජනතාවට හොඳ සේවයක් කරන්න. මේ උපකාරක මේසය කියන සංකල්පය ක්‍රියාත්මක කරමු.

**03(36)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෝසම් සුළං කාලයත් එක්ක මොරටුවේ ජනතාව මොන පක්ෂය මොන ආණ්ඩුව ආවත් මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්නයක් තමයි වැස්සට මොරටුවේ තිබුණු දකුණු කලාපයේ ප්‍රධාන වශයෙන් තිබුණු පාරවල් වාරිමාර්ග බවට පත්වීම. ඒ නිසා මේකට නිශ්චිත වැඩසටහනක්

අවශ්‍යයි ධර්ම බන්ධු මාවත ගත්තට පස්සේ එකම ගංගාවක් බවට පත්වෙලා තිබුණා. අපි අහලා තියෙනවා භූගෝල විද්‍යාවේදී අපිට තියෙන ලොකුම දූපත් ටික තියෙන්නේ ඉන්දුනීසියාවේ කියලා. හැබැයි මොරටුවේ වැස්සට පස්සේ ඒ දූපත් ටික මතු වෙන්නේ පාරවල් වලින්. පින්ලන්තයේ තියෙන පංච මහා විල් මතු වෙන්නේ මොරටුවෙ පාරවල් වලින්. මරියානාගාදයට වඩා කිට්ටු ගැඹුරක් තියෙන සමහර වලවල් හම්බවෙන්නේ වැස්සට පස්සේ. අනිත් පැත්තෙන් ගත්තහම සුද්දගෙ මෝල අද වැද්දාගේ මෝල බවට අද පත්වෙලා තියෙන්නේ. ඒ නිසා මේකට පොඩි පොඩි පැලැස්තර විසඳුම් නෙමෙයි. මීට කලින් කවුරු වුණත් ගෙනල්ල තියෙන ක්‍රමවේද ඉස්සරහට ගෙනිහිල්ලා මිනිස්සුන්ට විසඳුමක් දෙන්න, විශේෂයෙන්ම අපේ ගොවියො කියනවා වැස්ස වලාහක දෙයියනේ අපිට වහින්න අපේ කුඹුර බත සරි කරගන්න කියලා. ඒ නිසා මොරටුවේ මිනිස්සුන් ඊසාන දිග මෝසම් සුළං නිරිත දිග මෝසම් සුළං සංවහන වැසි එනකොට අනේ දෙයියනේ අපේ මාර්ගයක් වාරිමාර්ගයක් බවට පත්වෙනවා නේද කියලා උඩ බලාගෙන වැස්ස වලාහක දෙවියන්ට එහෙම නැත්නම් සියලු දෙවියන්ට ආමන්ත්‍රණය කරනවා වහින්න එපා කියලා. ඒ නිසා මේ සඳහා ස්ථිරසාර වැඩසටහනක් අවශ්‍යයි. ඒ සඳහා නිශ්චිත ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**03(37)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපි හොඳ වගේම නරකත් කියන්න ඕනේ. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, කොමසාරිස්තුමියගේ අවධානයත් යොමු කරා, අලුතෙන් පත්වුණු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ අවධානයත් යොමු කරා. මේ ගලි රථ සේවාවට ඔබතුමත් අපිත් දන්න, රන් ලංකා බුක්ෂොප් එකේ අයිතිකරු ලංකා ප්‍රේමචන්ද්‍ර මහතා සල්ලි බැන්දා. සල්ලි බැන්දේ නගර සභාවේ ලීටර් 1800 ගලිය ගන්න හැබැයි ඒක පහුවදා කැඩුනා. ඊට පස්සේ ඔබතුමත් කිව්වා ලීටර් 3000 න් මේක කරන්න කියලා. අපිට ඒක කරන්න බැරි වුණා. ඒ නිසා ඔහුට ඒ වෙලාවේ ප්‍රයිවට් එකකින් කතා කරලා තිබුනා . මොරටුව මහා නගර සභාවේ ගලි රථය කැඩිලා නේද මේක අපිට කරන්න පුළුවන් කියලා. කොහොම ගියාද කියලා දන්නේ නෑ තොරතුරු. ඊළඟට නැවත සල්ලි දෙනකොට මේක අපේ අඩුපාඩුවක් නිසා ඔහු සම්පූර්ණ මුදල ඉල්ලා සිටියා. හැබැයි මුදල් එල්ලුවාට පස්සේ අපි කිව්වා බාගේ දෙන්න පුළුවන් කියලා. ගිහිල්ලා කම්ප්ලේන් කරලා තියෙනවා අපේ අඩුපාඩුව සම්බන්ධයෙන්. මොරටුවේ ජනතාව අපි කෙරෙහි තියෙන විශ්වාසය නිසා තමයි මෙතනට එන්නේ. ඒ විශ්වාසය රැක ගැනීම දේශපාලනඥයන්ට විතරක් නෙමෙයි නිලධාරීන්ගෙත් වගකීමක්. මේ යාන්ත්‍රණයේ අඩුපාඩුකම් වලට අපිට කරගන්න බැරි වුනොත් ඒක මහ දැවැන්ත ගැටලුවක්. ඒ නිසා ඔබතුමාගේ ගෞරවයත් ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවයත් මේ සේවය ලබාදීම තුළ තියෙනවා. ඒ නිසා මං ඉල්ලා සිටිනවා ඒ අඩුපාඩුවත් එක්ක ඔහුට සිද්ධ විය යුතු යුතුකම එහෙම නැතිනම් ඔහුට ඉටුවිය යුතු සාධාරණය ඉටුකරන්න ක්‍රියාත්මක වෙන්න කියලා. එහෙම නැත්නම් අපි දිගින් දිගටම අපේ සේවා අඩුපාඩු නිසා සමහරක් වෙලාවට අපිට පාරිභෝගික සේවා අධිකාරියෙන්, අනිත් පැත්තෙන් ගොඩනැගිලි පරීක්ෂණ ආයතනයෙන් complain ඇවිල්ලා මේවා කරන්න ගියොත් එහෙම අපේ තියෙන කීර්ති නාමය හැල්ලුවට ලක්වෙනවා. ඒ නිසා ඒ සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුදේශ් ඉන්ද්‍රජිත් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලනවා මේක මහජන ජනතාවගේ ආයාචනා හා පෙත්සම් පැමිණිලි අයිතමය මේකේ වාද කරන්න බැහැ එකක් අපට පාලක කණ්ඩායම විදිහට මන්ත්‍රීවරු ඉදිරිපත් කරන කරුණුවලට පිළිතුරු සපයන්නත් බෑ. ඒ නිසා මේවට කතා කරන්න පුළුවන් අයිතමයන් තියෙනවා සෞඛ්‍ය කමිටු තියෙනවා ආයතන කමිටු තියෙනවා

කමිටුවල මේ කරුණු ඉදිරිපත් කරන්න එතකොට අපිටත් මේවට උත්තර දෙන්න පුළුවන් දැන් අපට උත්තර සපයන්න බැහැ. අපි නිරුත්තරව වාඩිවෙලා ඉන්න ඕනේ. ඒ නිසා ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න.

**03(38)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ජෝන් රුද්‍රිගු මාවතේ 155 දරණ ප්‍රදේශයේ අතුරුපාර සංවර්ධනය කරලා දෙන්න කියලා මහජන පෙත්සමක් ඉදිරිපත් වෙලා තියෙනවා. මම එය සභාගත කර සිටිනවා.

**03(39)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ ඔබතුමාට වාචික ඉල්ලීමක් තියෙනවා කරන්න. අපේ සේවක මහතුන් සම්බන්ධව. අපේ සේවක මහත්වරු උදේ ඇවිල්ලා කුණු ටැක්ටර් වල නැගලා කුණු ටික ඇදලා ආයේ හවස මේ නගර සභාවට එන්නේ ඇවිල්ලා එතුමන්ලා ගෙවල් වලට යන්න ඉස්සෙල්ලා ම පොඩ්ඩක් වොෂ් එකක් දාගන්න යනවා එහා පැත්තේ බාත්රූම් එකට එතන තිබෙන වැසිකිළි පහසුකම් සම්බන්ධයෙන් පොඩ්ඩක් හොයලා බලලා ඔවුන්ගේ සනිපාරක්ෂාව සුරැකෙන ආකාරයේ ස්ථානයක් හදලා දෙන්න කියලා ඔබතුමාගේ මං ඉල්ලා සිටිනවා.

**03(40)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පටන් ගත්ත ගමන්ම වෙනදට අපිට කියන්න වෙන්නේ අපි ඉදිරිපත් කරන අදහස් වලට කිසිම ප්‍රතිචාරයක් නැහැ කියලා. ඒත් අද ඔබතුමාටත් ඔබතුමාගේ කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා ගිය සභාවාරයේදී අපි ඉදිරිපත් කරපු කරුණු දෙකකටම ඔබතුමාගේ අවධානය යොමු කරලා තියෙනවා. බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. නමුත් මම මේක කියන්නම අවශ්‍යයි මුල් අවස්ථාව නිසා. හැබැයි මම ඉදිරිපත් කරපු මහජන මාවතේ ප්‍රශ්නයත් මල අපද්‍රව්‍ය ප්‍රශ්නය පිළිබඳවත් ප්‍රශ්න දෙකටම රුක්මන් මහත්මා සමඟ මාලිමා මන්ත්‍රීතුමා තමයි ඇවිල්ලා තියෙන්නේ කමක් නෑ කෙක්කෙන් හරි කොක්කෙන් හරි වැඩේ වෙන්නයි ඕනේ. ඒ නමුත් මේ මහජන මාවතේ ප්‍රශ්නය පිළිබඳව ඉදිරිපත් කළ කරුණු විකෘති කරලා, දාපු පුද්ගලයාගේ ගෙදරට ගිහිල්ලා කරුණු ඉදිරිපත් කරල තියෙනවා ඒ නිසා කරුණාවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ මුල් අවස්ථාව නිසා මන්ත්‍රීවරුන් කරුණු විකෘති කරන්නේ නැතුව මේ කරුණු ඉදිරිපත් කරානම් හොඳයි, කියලා මම හිතනවා.

**03(41)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරනු ලැබුවා එගොඩ උයන මිරිස් කුඩු මෝලක් සම්බන්ධයෙන් තාමත් ඒ මිරිස් කුඩු මෝල ඒ විදිහටම පවත්වාගෙන යනවා ඒ සම්බන්ධව සලකා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(42)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ කොමසාරිස්තුමිය දන්නවා ඔබතුමියගේ පාලන කාලෙ ඉඳලම තට්ටයා පාලම ගාව තියෙන කුණු ගොඩ අපි විශාල පරිශ්‍රමයක් දැරුවා ඒ කුණු ගොඩ ඉවත් කරන්නට. එතන කුණු ගොඩ ගැහෙනවා. තණකොළ වැවිලා තියෙනවා එම නිසා ඉල්ලීමක් කරනවා මේ තට්ටයා පාලම අසල පවිත්‍ර කරලා දෙන්න කියලා.

**03(43)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි ඉදිබැද්ද සුධර්මාරත්නාරාම පාරේ වීදි සුනඛයින් සිටිනවා. මෙය ඉතාමත් ලොකු ප්‍රශ්නයක්, මේක ඉදිබැද්දට විතරක් තියෙන ප්‍රශ්නයක් නෙමෙයි. මුළු නගරයටම තියෙන

ප්‍රශ්නයක් ඉදිබැද්ද ප්‍රදේශයේ පාසල් ළමුන් පවා පාසලට යන්නෙත් තමන්ගේ දෙමාපියන් එක්ක දෙමාපියෝ පාසල අවසන් වන වෙලාවටත් පාරට යනවා දරුවන් එක්කන් එන්න ඉතින් මේ ප්‍රශ්නය ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ ජනතාවට. මොකද ජනතාවට කිසිම බයක් සැකක් නැතුව පාරෙ බැහැලා යන්න නැත්නම් වැඩක් නැහැනෙ. අනිත් එක වරිපනම් බදු ගෙවන ජනතාවට නගර සභාවෙන් දෙයක් වෙන්නෙ නැත්නම් වැඩක් නෑනෙ පාරවල් ගානේ වෙඩි තියලා මරලා දානවා වගේ බයෙන් තමයි මිනිස්සුන්ට දැන් පාරවල්වල යන්න වෙලා තියෙන්නේ මේ සුනඛයෙන් ගේ ප්‍රශ්නය නිසා. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනවා මේ සඳහා ඉතාමත් සාධනීය පිළිතුරක් ලබාදෙන්න කියලා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබතුමාලා යථාර්ථය පිළිගන්න. එදා කොච්චර බාධා කිරීම් ඇතුලෙද අපි මොකක් හරි කිව්වේ. අද ඒක එහෙම නෑ. ඉදිරිපත් කරන කාරණා ඔවුන්ගේ අයිතිය නේ සභාව ඉක්මනට ඉවර කරගන්න අපිට උදව් කරන්න. ඔබතුමාලා කාටත් තේරෙනවා දේශපාලන ප්‍රහාර ඒක පැත්තකින් එල්ල කරන්න උත්සාහ කරනවා. මේ අයිතම යෙදී ඇත්තටම බොහෝ ඒවා මහජන නියෝජිතයො හැටියට තමන් එකඟතාවයකින් මුහුණ දෙන ගැටලු. ඒවා හැල්ලු කරන්නේ නෑ. පුළුවන් තරම් උපරිමයෙන් ඒවා කොහොමද ඉෂ්ඨ කරන්නේ කියන උත්සාහයක අපි ඉන්නවා. නමුත් තවදුරටත් මේ දීර්ඝ කාලයක් පැවතුණු ගැටලු ප්‍රශ්න, ජලයෙන් යටවෙන ප්‍රශ්නය, සජිත් දුමින්ද මන්ත්‍රීතුමා දන්නවා අපි කොච්චර කාලෙක ඉඳලා සභාවක් විදියට දීර්ඝ උත්සාහයන් ගන්නවද කියලා. ඒවට යම් සාධනීය පියවර අරගෙන තියෙනවා.

## 04. <u>ප්‍රශ්න</u>

<u>**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 04(1) යටතේ මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරනවා.

**04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරන ලදි.**

1. මොරටුව මහා නගර සභාව මඟින් පාලනය වන ජනසෙත කලා කේන්ද්‍රය සංවර්ධන කටයුතු ආරම්භ වූයේ කවදාද?
   - 2023.03.20
2. ජනසෙත ගොඩනැඟිල්ලේ සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
   a) ජනසෙත පුස්තකාලයේ අළුතින් ඉදිකල වහලය සඳහා (සම්පූර්ණ) වඩිම්බු ගසා වැසිකිළි පද්ධතිය නවීකරණය කර කොටසක්(විමර්ශන අංශය, ලොබිය ප්‍රධාන කාර්යාලය, පුවත්පත් අංශය) පින්තාරු කිරීම.
   b) ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිළි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 2 වන අදියර.
   c) ජනසෙත පුස්තකාලයෙහි රංග ශාලාවෙහි ඇතුළත හා එහි පිටත කොටස සඳහා වන සිවිල් ඉංජිනේරුමය අලුත්වැඩියාවන් සහ තීන්ත ආලේප කර නවීකරණයකිරීම.
   d) ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිළි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 1 වන අදියර.
   e) ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව ලොබි කොටස ප්‍රධාන කාර්යාලය, පරිගණක කාමරය, විමර්ශන අංශය ඇතුළු කොටස්.

f) ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව. පත්තර කාමරය ඇතුල්වීමේ කොටස
g) ජනසෙත පුස්තකාලයේ ඉදිරිපස ඇති පිහිඹියා ගස වටා හිඳ ගැනීමට හැකි වන පරිදි බැමි බැඳ විධිමත් පරිදි සකස් කිරීම.

3. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද?

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (රු) |
|---|---|---|
| a) | ජනසෙත පුස්තකාලයේ අළුතින් ඉදිකල වහලය සඳහා (සම්පූර්ණ) වඩිම්බු ගසා වැසිකිලි පද්ධතිය නවීකරණය කර කොටසක් (විමර්ශන අංශය, ලොබිය ප්‍රධාන කාර්යාලය, පුවත්පත් අංශය) පින්තාරු කිරීම. | 4,000,000.00 |
| b) | ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිලි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 2වන අදියර. | 3,236,814.21 |
| c) | ජනසෙත පුස්තකාලයෙහි රංග ශාලාවෙහි ඇතුළත හා එහි පිටත කොටස සඳහා වන සිවිල් ඉංජිනේරුමය අලුත්වැඩියාවන් සහ තීන්ත ආලේප කර නවීකරණයකිරීම. | 1,567,385,.73 |
| d) | ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිලි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 1 වන අදියර. | 2,967,730.19 |
| e) | ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව ලොබි කොටස ප්‍රධාන කාර්යාලය, පරිගණක කාමරය, විමර්ශන අංශය ඇතුළු කොටස්. | 2,707,657.66 |
| f) | ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව. පත්තර කාමරය ඇතුල්වීමේ කොටස | 2,139,453.89 |
| g) | ජනසෙත පුස්තකාලයේ ඉදිරිපස ඇති පිහිඹියා ගස වටා හිඳ ගැනීමට හැකි වන පරිදි බැමි බැඳ විධිමත් පරිදි සකස් කිරීම. | 143,925.73 |

4. ජනසෙත ගොඩනැඟිල්ල සංවර්ධනය සඳහා සත්‍ය වශයෙන් වැය කළ මුදල කොමපණද?

| | ව්‍යාපෘතිය | කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල (රු) |
|---|---|---|
| a) | ජනසෙත පුස්තකාලයේ අළුතින් ඉදිකල වහලය සඳහා (සම්පූර්ණ) වඩිම්බු ගසා වැසිකිලි පද්ධතිය නවීකරණය කර කොටසක් (විමර්ශන අංශය, ලොබිය ප්‍රධාන කාර්යාලය, පුවත්පත් අංශය) පින්තාරු කිරීම. | 3,054,019.70 |
| b) | ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිලි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 2වන අදියර. | 3,233,500.76 |
| c) | ජනසෙත පුස්තකාලයෙහි රංග ශාලාවෙහි ඇතුළත හා එහි පිටත කොටස සඳහා වන සිවිල් ඉංජිනේරුමය අලුත්වැඩියාවන් සහ තීන්ත ආලේප කර නවීකරණයකිරීම. | 1,559,727.66 |

| | | |
|---|---|---|
| d) | ජනසෙත පරිශ්‍රයේ බැහැරදෙන අංශයේ විමර්ශන අංශය (උඩු හා යටි මහල) වැසිකිලි පද්ධතිය ඇලුමිනියම් දොර ජනෙල් යෙදීම සඳහා 1 වන අදියර. | 2,966,472.27 |
| e) | ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව ලොබි කොටස ප්‍රධාන කාර්යාලය, පරිගණක කාමරය, විමර්ශන අංශය ඇතුළු කොටස්. | 2,705,991.40 |
| f) | ජනසෙත පුස්තකාලයේ වහලය ශ්‍රම කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුව. පත්තර කාමරය ඇතුල්වීමේ කොටස | 2,122,926.68 |
| g) | ජනසෙත පුස්තකාලයේ ඉදිරිපස ඇති පිහිඹියා ගස වටා හිඳ ගැනීමට හැකි වන පරිදි බැමි බැඳ විධිමත් පරිදි සකස් කිරීම. | 116,668.26 |

5. ජනසෙත ගොඩනැගිල්ලේ සත්‍ය වශයෙන් සංවර්ධනය කරන ලද කොටස් මොනවාද?
    - ඉහත ව්‍යාපෘතීන්ට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තු වල සඳහන් සියලු වැඩ කොටස්
6. ජනසෙත ගොඩනැගිල්ලේ වැඩ අවසන් කළ දිනය කවදාද?
    - 2025.08.06
7. ජනසෙත ගොඩනැගිල්ලේ සංවර්ධනයෙන් පසු ජනතා අයිතියට පැවරූ දිනය (විවෘත කළ දිනය) කවදාද?
    - 2025.08.07
8. ජනසෙත ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුවට අනුව සියලු කොටස් වල සංවර්ධනය නිම කොට තිබේද?
    - ඔව්

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 04(2) යටතේ මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරනවා.

**04(02) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරන ලදි.**

1. මොරටුව මහා නගර සභාවේ 2025 සැසි වාරය ආරම්භ කළ දිනය කවදාද?
    - 2025 ජුනි මස 02
2. නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති ධූරවල වර්තමාන නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති දිවුරුම් දුන්නේ කවදාද?
    - 2025 ජුනි මස 02
3. 2025 වසරේ මොරටුව මහා නගර සභාවේ නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති නිල වාහන භාවිතය ආරම්භ කරන ලද්දේ කවදාද?
    - නගරාධිපති නිල වාහන භාවිතය ආරම්භ කරන්නේ 2025.06.02 දින සිටය
    - නියෝජ්‍ය නගරාධිපති නිල වාහන භාවිතය ආරම්භ කරන්නේ 2025.06.05 දින සිටය
4. ඉහත අංක 03 හි සඳහන් නිල වාහන වල රියදුරන් ලෙස කටයුතු කරන ලද්දේ කවුරුන්ද? ඔවුන්ගේ නම් මොනවාද?

- WP – PK 6810 දරණ ගරු නගරාධිපතිතුමාගේ නිල රථයේ රියදුරුගේ නම පී.එම්.වමීර ප්‍රියංකර මහතා
- WP – PK 6812 දරණ ගරු නියෝජ්‍ය නගරාධිපතිනියගේ නිල රථයේ රියදුරුගේ නම කේ.බී.ජී. මහින්දරත්න මහතා

5. ඉහත අංක 04 හි සඳහන් රියදුරන් ලෙස කටයුතු කරන ලද රියදුරු මහතුන් මොරටුව මහා නගර සභාවේ ස්ථිර පත්වීම් සහිත රියදුරු මහතුන්ද?

   එසේ නොමැතිනම් ඔවුන් කවුද?
   කුමන පදනමකින් බඳවා ගත් රියදුරු මහතුන්ද?

   - පී.එම්.වමීර ප්‍රියංකර මහතා ස්ථිර පත්වීම් සහිත රියදුරු මහතෙකි කේ.බී.ජී. මහින්දරත්න මහතා ශ්‍රම මිලදී ගැනීමේ පදනම යටතේ සේවය යොදවා ඇති රියදුරු මහතෙකි.

6. නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති 2025 සැසිවාරය ඇරඹී දිනයේ දිවුරුම් දීමත් සමඟ නිල වාහන භාවිතය ඇරඹී දිනයේ දී සිටි රියදුරන් තවමත් එම රාජකාරියේ නියුක්තව ඇත්ද?

   එසේ වෙනස් වී ඇත්නම් ඔවුන්ගේ නම් මොනවාද?

   දැනට (2025 සැප්තැම්බර් මහා සභාව පැවැත්වෙන දිනය වනවිට) නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති නිල වාහන වල සිටින රියදුරු මහතුන් කවුද?

   ඔවුන් ස්ථිර සේවකයන්ද?

   එසේ නොමැතිනම් ඔවුන්ව බඳවාගත් පදනම කුමක්ද?

   - නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති නිල වාහන භාවිතය ආරම්භ කළ අවස්ථාවේ දී අනුයුක්ත කළ රියදුරන් මේ දක්වා සේවයේ යෙදී සිටි.

7. නියෝජ්‍ය නගරාධිපති නිල රථයේ දැනට රාජකාරි කටයුතු කරන රියදුරු මහතා ස්ථිර සේවකයෙකු නොවන්නේනම් හා ඔහු දෛනික ශ්‍රම පදනම මත බඳවාගන්නා ලද රියදුරු මහතෙකුනම් ඔහුව සෘජුවම බඳවා ගනු ලැබුවේ නියෝජ්‍ය නගරාධිපති නිල රථය පැදවීම සඳහාද?

   - සභාවේ රියදුරු අවශ්‍යතා සඳහා බඳවා ගන්නා ලද රියදුරු මහතෙකි

8. ඉහත අංක 07 සඳහන් රියදුරු බඳවා ගැනීමට දැන්වීම් ප්‍රචාරණය කරන අවස්ථාවේ මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති නිල රථය සහ සභාවේ අනෙකුත් කැබ්රථ හා සැහැල්ලු වාහන සඳහා රියදුරන් බඳවා ගන්නා බව සඳහන් කර තිබුණේද?

   - 2025.05.07 දිනැතිව ශ්‍රම සැපයීමේ පදනම යටතේ රියදුරු සේවාවන් ලබා ගැනීමට අදාළව ප්‍රසිද්ධ කරන ලද දැන්වීමට අනුව මොරටුව මහා නගර සභාව වෙත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත රියදුරු සේවය ලබා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.

9. 2025 වසරේ දෛනික ශ්‍රම සැපයීමේ පදනම මත බඳවා ගන්නා ලද රියදුරන් කී දෙනෙකු සිටීද?

   ඔවුන්ගේ නම් මොනවාද?

   ඔවුන් දැන් සේවය කරනු ලබන වාහන මොනවාද?

   - කේ.බී.ජී. මහින්දරත්න මයා - WP – PK 6812
   - වී.බඳු විදානගේ අනුර ශාන්ත මයා - රථ වාහන සංචිතය

10. සභාවේ රියදුරන් බඳවා ගැනීමට යෝජනා කරන ලද්දේ කුමන දෙපාර්තමේන්තුව මඟින්ද?
බඳවාගත් රියදුරන් එම ඉල්ලීම් කරන ලද දෙපාර්තමේන්තුවේ වාහන සඳහා බඳවා ගත් රියදුරන් යොදවා සිටීද?
රියදුරන් නැති වාහන මොනවාද?

- ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- සභාව සතු රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර උපකරණ 144කි.
- අනුමත කාර්ය මණ්ඩලය රියදුරු සංගමය 55 කි.
- දැනට සේවයේ යෙදී සිටින ස්ථිර රියදුරන් සංඛ්‍යාව 34කි.
- පුරප්පාඩු රියදුරු සංඛ්‍යාව 21කි.
- සභාවේ රථ වාහන සංඛ්‍යාව හා සේවයේ යෙදී සිටින ස්ථිර රියදුරන් සංඛ්‍යාව අතර විශාල පරතරයක් පවතින අතර සභාවේ සේවාවන් අඩාල නොවී පවත්වා ගෙන යෑම සඳහා රියදුරු ආවරණ පත්වීම් යටතේ සේවකයින් යොදවා සභාවේ සේවාවන් පවත්වා ගෙන යෑම සිදු කෙරේ.

## 05. <u>යෝජනා</u>

**05(01)** මහා නගර සභා මන්ත්‍රී, **ඕ. දිනූෂි කෞශල්‍යා පෙරේරා මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව මහා නගර සභාව අයත් කොට්ඨාස 29 හී ජීවත්වන දරු දැරියන් සඳහා නගර සභාවට අනුබද්ධ ළමා සමිති පිහිටුවීම සහ ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂිකව සාහිත්‍යය හා ක්‍රීඩා තරඟ පවත්වමින් ඔවුන් ඇගයීමට ලක් කිරීමට යෝජනා කරන්නීය.
(ඒ තුළින් අනාගත පරපුර අනවශ්‍ය ඇබ්බැහිවීම වලට ලක්වීම මැඩ පැවැත්වෙනු ඇතැයි ද පුරවරයට වැඩදායක පුරවැසියන් බිහිවෙනු ඇතැයිද සිතමි.)

මහා නගර සභා මන්ත්‍රී **එල්. දිලිප් ආර්. කුමාර පෙරේරා මහතාගේ** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා **මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය** පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(02)** මහා නගර සභා මන්ත්‍රී, **ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,,**

මෝල්පේ මැතිවරණ කොට්ඨාශයේ ද සොයිසා මාර්ගයට මුහුණලා පිහිටා ඇති ගරු ජෝන් ද සිල්වා මාවතේ වැසි ජලය බැස යන ලෙස සකසා මාර්ගය බෙදී ගිය 200M පමණ වූ අතුරු මාවතද ඇතුළුව "ඉන්ටලොගින්" ගල් අතුරා සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී **එල්.ඩී. තිලක් විජේතුංග මහතා** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(02) යෝජනාව ඉදිරි කටයුතු සඳහා **කර්මාන්ත හා ඉදිකිරීම්** පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, ඕ. දිනුෂි කෞශල්‍යා පෙරේරා මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව මහා නගර සභාවට අයත් කොට්ඨාශ 29 හි ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ට, අවම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වාවත් නගර සභාව මගින් නොමිලේ ඉංග්‍රීසි පන්ති පැවැත්වීම තුළින් ප්‍රදේශයේ දරුවන්ට ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට උපකාරී වන බව යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී **එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(03) යෝජනාව ඉදිරි කටයුතු සඳහා **මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය** පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(04) මහා නගර සභා මන්ත්‍රී, පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

එගොඩඋයන උපනන්ද මාවත පාරේ තිබෙන නිවෙස් වලට වැසි ජලය ගලා ගෙන යෑමෙන් එහි ජීවත් වන නිවෙස් හිමියන් බොහෝ අපහසුතාවයට පත්ව ඇත. කුඩා දරුවන් පවා රෝගවලට ගොදුරු වී ඇත. එම නිසා එම පාර අලුත්වැඩියා කර වැසි ජලය බැස්සවිය හැකි පරිදි කාණු පද්ධතියක් සකස් කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී **එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(04) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා

**05(05) මහා නගර සභා මන්ත්‍රී, සිත්ති මසීනා බක්කර් මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව ඉදිරිපත් කරන ලදී,**

එගොඩ උයන දකුණ ප්‍රජාශාලාව කලක සිට මත්ද්‍රව්‍ය ලෝලීන්ගේ පාරාදීසයක් වූ අතර එය ප්‍රතිසංස්කරණ කර ජනතාවගේ පොදු ප්‍රයෝජනය සඳහා ලබාදීම වෙනුවට එගොඩ උයන දකුණේ පාරමී පෙර පාසල ස්ථානගත කර ඇත. එම නිසා මෙම ප්‍රජාශාලාව ස්ථිරවම පෙර පාසල සඳහා භාවිතා කරන්නේ නම් පාරමී පෙර පාසල පැවති ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ජනතාවගේ පොදු ප්‍රයෝජනය සඳහා ලබා දෙනමෙන් යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී **බී. සජිත් දුමින්ද පීරිස් මහතා** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි 05(05) යෝජනාව එගොඩඋයන දකුණ ප්‍රජාශාලාවේ කලක සිට මත්ද්‍රව්‍ය ලෝලීන්ගේ පාරාදීසයක් වෙච්ච ප්‍රජාශාලාවක් මම 2018 පත්වෙනකොට සභාවට ඉදිරිපත් කරපු යෝජනාවක් සභාව විසුරුවාට පස්සෙ තමයි මට හැකියාව ලැබුනේ ඒ ප්‍රජාශාලාව ප්‍රතිසංස් කරණය කර ගන්න රුපියල් ලක්ෂ විස්සක ප්‍රතිපාදන මධ්‍යම රජයෙන් අරන් කොමසාරිස්තුමිය දන්නවා මම බොහොම මහන්සිවෙලා ඒ යෝජනාව ඉදිරිපත් කරලා කොහොමහරි ඒ ප්‍රජාශාලාව හැදුවා 2024 දී. ඒ හදලා ඉවරවෙලා හැබැයි නගර සභාවට ටිකක් හරි යුතුකමක් තිබ්බෙ නෑ මට දැනුවත් කරන්න

ප්‍රජාශාලාව හදලා ඉවරයි දැන් අපි මේක ප්‍රයෝජනයට ගන්නවා කියලා ඒ සත්භාවයෙන් මම ඉදිරිපත් කලේ ඒ පළාතේ ඉන්න ජනතාවට පොදු පහසුකම් සඳහා ඒගොල්ලන්ගේ අවමංගල්‍ය සභාවක් හරි ඒ වගේ මොනවහරි පුළුවන් දෙයක් ඒගොල්ලන්ට කරන්න අවස්ථාවක් ලබා දෙන්න නමුත් මේක මමවත් දන්නේ නෑ මේකට එගොඩඋයන දකුණෙ තිබ්බ පෙර පාසලක් ස්ථානගත කරලා තියෙනවා. ඒකේ කිසිම වරදක් නැහැ හැබැයි මට දැනුවත් කිරීමක් කරන්න තිබ්බා මේක හදලා ඉවරයි දැන් මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මේ පෙර පාසලට ඒක නිසා දැනටය අපි මේ පෙර පාසල මෙතන ස්ථානගත කරනවා කියලා. එතකොට ඒ ජනතාවට ලබා දෙන්න තිබ්බ අවස්ථාව එතනට අහිමි වෙනවා ඒක නිසා මම ඉල්ලීමක් කරනවා ඒ පෙර පාසල කලින් තිබූ තැන ප්‍රතිසංස්කරණය කරලා ජනතාවගේ පොදු පහසුව සඳහා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ අවධානය සඳහා මම මේක යොමු කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(05) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා

**05(06) මහා නගර සභා මන්ත්‍රී, ජේ. සෙනෙවිරත්න මහතා විසින් කල් දී ඇති යෝජනාව ඉදිරිපත් කරන ලදී,**

බඹටුව වරිපනම් අංක 47/63 සිට ඇති පාරෙහි කුඩා කොටසක් ගිලා බැසීම නිසා කාණුව ද කැඩීගොස් ඇත. පාර සහ කාණුව පිළිසකර කර දෙන ලෙස යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී **එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා** විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(06) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා

**05(07) මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා විසින් කල් දී ඇති යෝජනාව ඉදිරිපත් කරන ලදී,**

මොරටුව විවිධ සේවා සමූපාකාරය මඟින් පාලන වන ව්‍යාපාරික ස්ථාන ටෙන්ඩර් කිරීමට තීරණය කොට ඇත. දැනට දීර්ඝ කාලක් පුරා සමූපාකාරයට බදු කුලි ගෙවමින් ව්‍යාපාරික කටයුතු වල යෙදෙන අයහට විශාල අසාධාරණයක් වන අතර ඔවුන්ගේ ආර්ථික ජීවිතයද අඩාල වියහැක. නියමිත පරිදි බදු කුලී නොගෙවන, අතුරු බදු දී ඇති, හිඟ මුදල් ඇති ව්‍යාපාරික ස්ථාන ටෙන්ඩර් කිරීමට අපහට කිසිදු ගැටලුවක් නොමැත. අප විසින් ඉල්ලා සිටිනු ලබන්නේ වර්තමාන තක්සේරුවට කුලී ගාස්තු සංශෝධනය කොට නියමිත පරිදි බදු කුලී ගෙවන තමන්ගේම ව්‍යාපාරයක් තමන්ම කරගෙන යන ව්‍යාපාරික ස්ථාන ටෙන්ඩර් කිරීම අත්හිටුවන ලෙස ගරු වෙළඳ හා වානිජ ආහාර සමූපකාර අමාත්‍ය වසන්ත සමරසිංහ ඇමතිතුමාට මෙසේ යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඩී. සමන්ත සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව මම ඉදිරිපත් කරන්නේ මොරටුව විවිධ සේවා සමූපකතාර සමිතියට අයත් දීර්ඝ කාලීනව බදු පදනමින් තමන්ගේ ආර්ථික ජීවිතය ගතකරන මා ද ඇතුළුව ව්‍යාපාරිකයන් පිරිසක් වෙනුවෙන්. ගරු නගරාධිපතිතුමනි, සමූපකාරය සම්බන්ධයෙන් මම මේ යෝජනාව ගැන අදහස් දක්වන්න කලින් නිර්වචනයන් තුනක් ගැන මේ සභාවට ඉදිරිපත් කරන්න කැමතියි. එක නිර්වචනයක්, සමූපකාරය සමාජවාදයට යන අඩිතාලමයි. ප්‍රථමයෙන් සමාජවාදයටත් අවසානයේදී කොමියුනිට්ස් ක්‍රමයටත් මග පාදයි - වී.අයි.ලෙනින්. තව එකක් තියෙනවා සමූපකාරය යනු පුද්ගලයන් සමූහයක් තම තමන්ගේ ආර්ථික තත්වය උසස් කර ගැනීම සඳහා සමානාත්මතා පදනම් කරගෙන සිය කැමැත්තෙන්ම එකමුතුව ගොඩනගා ගත් සංවිධානයකි. එච්.කැල්වට්. ඊළඟ නිර්වචනය ආර්ථික දියුණුව සඳහා මිනිසුන් අතර කුලල් කාගන්නා තරඟය වෙනුවට සහයෝගය වැනි සමාජ ගුණධර්ම ඇතුලත් හොඳ සමාජ පරිසරයක් පදනම් කරගත් එකා සැමටත් සැම එකාටත් ලෙස එකිනෙකා සේවය කරගන්නා ක්‍රමය සමූපකාරය වේ.-රොබට් හෝවන්. ගරු නගරාධිපතිතුමනි, මෙන්න මේ නිර්වචනයන් වලට අනුව ගත්තම සමූපකාරය මොරටුව විවිධ සේවා සමූපකාර සමිතියේ අද මේ වෙනකොට සියළු කඩ ඒ සියළු දේපල ටෙන්ඩර් කරන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා. දේපල කීපයක් මේ මේ වනකොට ටෙන්ඩර් කරලා තියෙනවා. මේ ටෙන්ඩර් කිරීම සම්බනධයෙන් ගැටළුවක් නෑ. ඔවුන් මුලින් මට කිව්වෙ ගරු නගරාධිපතිතුමනි, මේ ටෙන්ඩර් කරන්නේ ආණ්ඩුවට සල්ලි නැති නිසා කියලා. මම හොයලා බැලුවා එන්.පී.පී.එකට බලය තියෙන සමූපකාරයක් දෙකකටත් හොයලා බැලුවාම ඒ සමිතිවල මෙහෙම තීරණ අරන් නෑ. මට ඕනනම් සමිති කියන්න පුළුවන් මම බැලුව. ඒ වගේම සජබයට බලය තියෙන සමිතියක් දෙකකටත් මම කතා කරලා බැලුවා ඒ සමිතිවලත් මේ විධියට මේ ආකාරයට මේහෙම කතාවක් නෑ. නමුත් මොරටුව විවිධ සේවා සමූපකාරය කිව්වේ ආණ්ඩුවට සල්ලි නැති නිසා කඩ ටෙන්ඩර් කරනවා කියලා. කඩ ටෙන්ඩර් කලාට කමක් නෑ. ගරු නගරාධිපතිතුමනි, මේකෙ තියෙන අසාධාරණය මේකයි. මේ කඩ එහෙම නැත්නම් මේ ව්‍යාපාරික ස්ථාන කරන අවුරුදු විස්සක් විසිපහක් තිහක් මුළුල්ලේතමන්ගේම ව්‍යාපාරයක් කරගෙන යන වෙන කිසිදු ආදායම් මාර්ගයක් නැති නියමිත පරිදි මොරටුව විවිධ සේවා සමූපකාර සමිතියට අදාල බදු කුලී ගෙවන අයට නිසි විධියේ ටෙන්ඩර් කිරීමකින්, බලවත් අසධාරණයක් සිද්ධවෙනවා. මේ වෙනකොට මම එක උදාහරණයක් කියන්නම්, සොයිසාපුර සමූපකාර සමිතියට අයත් ඉඩමේ අවුරුදු තිහකට ආසන්න කාලයක් ව්‍යාපාරික කටයුතු කරපු පානදුර පහට අවදිවෙලා පොල් ටිකක් විකුණන අහිංසක කාන්තාවක් තමන්ගේ අක්කට දියවැඩියාව රෝගය හැදිලා ඉන්න තමන්ගේ අක්කව බලාගෙන කටයුතු කරපු අවුරුදු තිහකට ආසන්න කාලයක් ඒ කඩේ ටෙන්ඩර් කරලා ඒක අරගෙන තියෙන්නේ කඩ කිහිපයක් හිමි ව්‍යාපාරිකයෙක්. වැඩි ගාණක් දාලා. සමූපකාරය දියුණු කරන්න ඕන කියන එකට අපිට තර්කයක් නෑ. හාබායි සමූපකාරය දියුණු කරනවා කියලා කියන්නේ තමන්ගේ ව්‍යාපාරයක් කරගෙන හිටපු මිනිහව එළියට දාලා තමන්ගේ කාටහරි මොකක් හරි ක්‍රමයකට මම දන්නෑ ඒක මොණර කොළවලින්ද නැත්නම් බොතල්වලින්ද කියලා ඒ දියුණුව මැනෙන්නෙ. ගරු නගරාධිපතිතුමනි, ඒක හරි අසාධාරණයි. අපි කියන්නේ කමක් නෑ ටෙන්ඩර් කරන්න මේ වගේ ඒවා කුලිය ගෙවන්නේ නැති, අතුරු බදු දීලා තියෙන, නිවාස අධිකාරියේ මම දන්න විදියට අර අපි හදපු කඩ කිහිපයන් ටෙන්ඩර් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ටෙන්ඩර් කරන ක්‍රමය අතිශය නිවැරදියි. ඒ කඩ වැඩිහරියක් කුලියට දීලාතියෙන්නෙ. එතකොට ඒ කුලියට ඉන්න අයගෙන් දැනට කඩ කරගෙන යන අයට ප්‍රමුඛතාවය දීලා ටෙන්ඩර් කරන්න හදනවා. ඒක වැරදි නෑ. ආණ්ඩුවේ දෙයක් අරගෙන ඒක අතුරු බදු දෙන්න සමූපකාරෙවත්, නිවාස අධිකාරියවත් කොහෙන්වත් ඒ ව්‍යාපාර අතුරු බදු දෙන්න බෑ.නමුත් එහෙම දීලා තියෙනවා. එතකොට අතුරු බදු

දෙනවා කියන්නේ තමන්ගේ ව්‍යාපාරයක් කරනවා කියන එක නෙමේනෙ. එතකොට එහෙම එකක් ටෙන්ඩර් කලාට කමක් නෑ. නමුත් අපි ඉල්ලන්නෙ ගරු නගරාධිපතිතුමනි ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගෙන් හතුමා තමයි සමූපකාර ඇමති ඒ ඇමතිතුමා හරහා ආණ්ඩුකාරතුමාට ඒ වගේම ආණ්ඩුකාරතුමා හරහා කොමසාරිස්තුමාට මේ කතාව කියලා. මේක මේ සාධාරණය අපි ඉල්ලන්නෙ කුලිය වැඩිකලාට කමන් නෑ. හැබැයි මේ සැබෑ ලෙසම කුලිය ගෙවන සැබෑ ලෙසම තමන්ගේම ව්‍යාපාරයක් කරන මම අවුරුදු විස්සක් එතන ව්‍යාපාර කරනවා නමුත් මගේ කඩේ තියෙන්නේ පෙබරවාරි අවසන් වෙන්නෙ.නමුත් කතා කරන මට වෙන ව්‍යාපාර නෑ. මගේ ජීවත් වෙන්න තව ව්‍යාපාර නෑ. තියෙන එකම දේ ඔච්චරයි. ඊට අමතරව මම තව පේමන්ට් එකේ වෙසක් එකට, නත්තලට මොනවා හරි මේකෙ කරන්නෙ. මම එදා ඉඳලම ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න කාලෙ ඉඳලම පේමන්ට් එකෙන් ජීවත්වෙලා හිටපු මිනිහෙක්. මම තාමත් එහෙමයි. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ විදියට තමන්ගේම ව්‍යාපාර කරන කෙනෙකුට අසාධාරණයක් නොවී එයාට ඒ ව්‍යාපාරය වර්තමාන තක්සේරුවට තක්සේරු කරලා ඒක එනවානම් විසිදහද විසිපන්දහද ඒක ගෙවන්න සූදානම්. හැබැයි වර්තමාන තක්සේරුවට කරලා ඒ ව්‍යාපාරික ස්ථාන කරන අයට ව්‍යාපාර කරගෙන යන්න අවශ්‍ය කරන ඒ වටපිටාව නිර්මාණය කරලා දෙන්න කියලා තමයි අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මම විතරක් නෙමෙයි මේක අත්සන් කරපු ඔබතුමාට උදේ බාරදුන්න ව්‍යාපාරික ප්‍රජාවක් ඉන්නවා. ඒ නිසා අවසානයේ ගරු නගරාධිපතිතුමනි, සමූපකාරය කියලා මම නිර්වචනය කරපු එක ඔබතුමාට පැහැදිලියි. දැන් මේ වෙනකොට මොරටුව විවිධ සේවා සමූපකාර සමිතිය මුදලාලි කරණය වෙමින් තියෙනවා සල්ලි තියෙන ඇති හැකි ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් අතට මොරටුව විවිධ සේවා සමූපකාරයේ අහිංසක ජීවත්වෙච්ච මිනිස්සුන්ගේ කඩවල්, ජීවත්වෙච්ච මිනිස්සුන්ගේ ව්‍යාපාරික ස්ථාන වැඩිමුදලක් දාලා අත්පත් කර ගැනීමේ ඒ කුප්‍රකට මෙහෙයුම පරද්දන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් සමූපකාරයට තමන්ගේ දේපල ටෙන්ඩර් ක්‍රියාවලියක් හරහා ලබා දීම නීත්‍යානුකූල එකක්. එය නීති විරෝධි කටයුත්තක් නොවේ. නමුත් මේ ඉල්ලීම තුල තිබෙන්නේ දීර්ඝ කාලයක් මේ සමූපකාර දේපල යොදා ගනිමින් ව්‍යාපාර කටයුතු කල අයට මේ අළුත් ටෙන්ඩර් ක්‍රමයකට ගියොත් ඔවුන්ට යම් අසාධාරණයක් අකටයුත්තක් සිද්ධවෙනවා කියන එක. ඒ නිසා මම හිතන්නේ සභාවක් ලෙස යෝජනාව සම්මත කරගෙන අවශ්‍ය කටයුතු සිදු කරමු.

**ඉහත අංක 05(07) දරණ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 06. <u>2025 ඔක්තෝබර් මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශන් සළකා බැලීම.</u>

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපිට එවලා තියෙන න්‍යාය පත්‍රයේ වෙනදට තියෙන්නෙ කමිටු නවයයි. අද තියෙනවා කමිටු දහයක්. කමිටු දහයක් කොහොමද ආවෙ කියන එක ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා නිත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් මේකෙ තියෙන අවසාන කරුණ හැටියට 2025.10.27 නව දින පැවති මුදල් පිළිබඳ විශේෂ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශ සලකා බැලීම. විශේෂ මුදල් කමිටුවක් කියලා එකක් තිබිලා තියෙනවා. අපි අහන්න කැමතියි ඔබතුමාගෙන් මේ විශේෂ මුදල් කමිටුවක් තියෙන්න සභා අනුමැතියක් තියෙනවද. විශේෂ මුදල් කමිටුවක් තියෙන්න මේ මහා නගර සභා අඥා පනතේ හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ ඔබතුමාට ප්‍රතිපාදනයක්

තියෙනවද. අපි දන්න විදියට නම් 26.(1) පැහැදිලිව තියෙනවා මේ කමිටු කියන එක යටතේ සෑම මහා නගර සභාවක් විසින් ම, එක් එක් වර්ෂයේ පළමු වරට පවත්වන ඒ සභාවේ සාමාන්‍ය රැස්වීමේ දී මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවක් ද, මේකෙ කියලා නෑ මුදල් කමිටු දෙකක් තියන්න කියලා. මුදල් කමිටු එකයි තියන්න පුළුවන්. ඔබතුමා කොහොමද මුදල් කමිටු දෙකක් තිබ්බෙ. අපි නීති නිලධාරිතුමියගෙන් අහනවා මුදල් කමිටු දෙකක් තියන්න නගරාධිපතිතුමාට උපදෙස් දුන්න ද ඔබතුමිය. එහෙම තියෙනවාද. එහෙම කොහොමද කරන්නෙ විශේෂ මුදල් කමිටුවක් තියන්න ඔබතුමා තීන්දු කලේ මොන අයිතමය යටතෙද මොන බලතලය යටතෙද කියන එක අපිට කරුණාකරලා පැහැදිලි කිරීමක් කරන්න. මහා නගර සභා ආඥා පනතෙන් දීලා නැති බලයක් දෙවන වරටත් ඔබතුමා මේ කමිටු සම්බන්ධයෙන් ආරෝපණය කරන්න යනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්නට ඕනෙ මේ අනීතික දෙයක් මේ කරන්න යන්නෙ. කරුණාකරලා මේක පැත්තකින් තියලා ඉතුරු කමිටු නමය ගැන සාකච්ඡා කරමු. ඒ නිසා කරුණාකරලා අපිට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් නීති නිලධාරි හරහා හෝ කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, හරි සරලයි උත්තරය. ඒක මහා අමාරු එකක් නෙවෙයි. නොතේරෙනකමකුත් නෙවෙයි. අදාල නගර සභා පනතේ තිබෙන්නේ එක මුදල් කමිටුවක් තමයි හැබැයි කිසි තැනක නැහැ කැඳවීම කරන්න ඕන එක අවස්ථාවයි කියලා. අවශ්‍ය වුනොත් පාලනයට සභාවේ මූල්‍යමය කාරණා පිළිබඳව සාකච්ඡා කරගන්න මේ තියෙන කැඳවීම අදාල කමිටුව නියෝජනය කරන සියළු මන්ත්‍රීවරුන්ටත් දැනුම්දීමක් කරලා. ඒ කැඳවීම කරන්නේ මුදල් කමිටු එකද දෙකද තුනද එහෙම මොකක්වත් නතර කිරීමක් කරන්නෙ නැහැ පනතේ. ඒ නිසා පාලනයට පුළුවන් පාලනය පවත්වාගෙන යාමේ දී ඇතිවන තත්වයන් සලකලා මේ කැඳවීම කරගන්න. කමිටු දෙකක් වශයෙන් අර්ථගන්වන එක වැරදියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපිට දැනුම් දීලා තියෙනවා 06(10) 2025.10.27 දින පැවති මුදල් පිළිබඳ විශේෂ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම එතකොට මේකෙ කමිටු 10 ක් සලකා බලලා තියෙනවා. මම අහන්නෙ ඔබතුමාට මුදල් කමිටුව රැස් කරන්න ඔබතුමාට හිතෙන විදියට දහපාර දොළොස්පාර මුදල් කමිටුව රැස්කරන්න බැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතුමා කියන දේට පොඩි පැහැදිලි කිරීමක් නීති නිලධාරිතුමියට හරි ලේකම් තුමාට හරි කරන්න කියන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පැහැදිලි කිරීමක් කිරීමට නාගරික ලේකම්ට අවස්ථාව ලබාදෙනවා.

<u>නාගරික ලේකම් - එම්.කේ.ඩී.ටී.මුණසිංහ මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභා ආඥා පනතේ ස්ථාවර කමිටු රැස්විය යුතු වාර ගණන සම්බන්ධයෙන් නියමයක් කරලා නැහැ. සභා රැස්වීම් වලදී නම් මාසික රැස්වීමක් පවත්වන්න කියලා තියෙනවා. ඒ වගේම විශේෂ අවස්ථාවක විශේෂ රැස්වීමක් පවත්වන්න විධිවිධාන නියම කරලා තියෙනවා. ස්ථාවර කමිටුවක් රැස්විය යුතු වාර ගණන ගැන එහෙම නියමයක් මහා නගර සභා ආඥා පනතේ සඳහන් කරලා නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය.</u>

ගරු නගරාධිපතිතුමිනි, පොඩි පැහැදිලි කිරීමක් තියෙනවා. අපි කමිටුවකට සහභාගි වුනාම යම්කිසි ගෙවීමක් කරනවානෙ එතකොට ඒ ගෙවීමට යම්කිසි ඇලොකේෂන් එකක් තියෙනවා මේකෙ දීලා. එතකොට මේ විශේෂ කමිටුවක් රැස්වුනාම ඒ මන්ත්‍රීවරුන්ට ගෙවීමක් කලාද? එතකොට ඒක එහෙම කරලා නැහැනෙ.විශේෂ කමිටු අපි කිව්වොත් අපිට මහජන උපයෝගීතා කමිටුවයි, කර්මාන්ත කමිටුවයි දෙපාරක් තුන්පාරක් රැස් වෙන්න ඕන කියලා ඒ රැස්වෙන හැම කමිටුවටම ඔබතුමාලා ගෙවීමක් කරනවද එතකොට ඒ ගෙවීමට ඔබතුමාලා ප්‍රතිපාදන වෙන් කරලා තියනවද, එහෙම කරලා නැත්තම් නගරාධිපතිතුමා නීතියෙන් පරිබාහිරව තමයි ඔබ කටයුතු කරලා තියෙන්නේ. ඒක තමයි මේ සුජිත් මන්ත්‍රීතුමා පැහැදිලිව කියන්න හදන්නේ. ඒකට ඔබතුමාගේ නිවැරදි පැහැදිලි කිරීමක් අවශ්‍යයි. හේතුව මහා නගර සභා ආඥා පනතේ විශේෂ කමිටුවට 27 වගන්තිය යටතේ විශේෂයෙන් සඳහන් වෙනවා කොහොමද විශේෂ කමිටු පත්කරන්නේ කියලා. විශේෂයෙන් සඳහන් වෙනවා කොහොමද විශේෂ කමිටුවක් පත් කරන්න ඕනි කියලා එතකොට ඔබතුමා අපිට එවන වාර්තාවේ සඳහන් වෙන්නේ විශේෂ කමිටුව. එතකොට එතුමා කියන තර්කයේ යම් කිසි පොයින්ට් එකක් තියෙනවා. ඒ නිසා ඔබතුමා කියන දේ නිවැරදි නැහැ. ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරනවා විශේෂයෙන් මේක පැහැදිලි කරන්න කියලා. නීතියෙන් පරිහාහිරව කටයුතු කරලා තියෙන්නේ එතකොට ගෙවීමක් කරාද?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මමත් නීතිය පැත්තෙන් යම් විමසීම් කරමින් ඉන්නේ. මට හිතෙන හිතෙන එක කරනවා නෙවෙයි. සභාවක් ලෙස ඔබ අපි කවුරුත් දන්නවා මේ ආවරණ අනුමැතියත් එක්ක ලොකු ගැටළු සහගත තත්ත්වයක් තියෙනවා. කොච්චර ගැටළු සහගත තත්ත්වයක් තිබුණත් සභාව අකර්මණ්‍යය කරන්න බැරි නිසා තවදුරටත් ඒක ඉස්සරහට යමින් තිබෙනවා. ඉතින් ඒකෙන් ගැලවෙන්න දරන උත්සාහයක් ලෙස මට මේ පනතේ කොහෙවත් කැඳවිය යුත්තේ එකවරයි කියලා නෑ, එනිසා මම උත්සහා කරමින් ඉන්නවා. විශේෂ අවස්ථාවන් අරගෙන හරි නිවැරදි තීරුවට ගේන්න තමයි අවංකවම දරපු උත්සාහය අපිට කොහොමත් මුදල් කමිටු දෙකක් තියන්න බෑ මොකද රැස්වීම් අංශය විශාල අපහසුතාවයකට පත්වෙලා ඉන්නේ. විශාල ගැටළු සහගත තත්ත්වයකට ඒ නිලධාරින් පත්වෙලා තියෙනවා. ඒ නිසා වෙනසක් කරගන්න දරන්න උත්සහය හැබැයි නීතිය කඩාගෙන යාමක් ලෙස අර්ථකථනය කිරීම වැරදියි. මේ විශේෂ අවස්ථාවක් පාලනයට ඕන වුණොත් ඒ පාලනයේ ඒ සඳහා පාවිච්චි කර ගත යොදා ගත යුතුයි ම මොකද මේක පනතේ කොහොවත් එපා කියලා නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මේක සත්චේතනාවෙන් කැඳවන්න ඇති හරි, මට මේ මුදල් කමිටුවේ පෙන්නන්න මේ තියෙන විශේෂ කියලා. කමිටුව 27 රැස්වෙනවා 28 අපේ ගෙදරටත් එනවා ඒ අතින් රැස්වීම් අංශය මාර ඉක්මන් එක ගැන බෝහොම සතුටුයි. ඔබතුමා නිකමට බලන්න කරුණක් සුවිශේෂී කියලා තියෙන්නේ කරුණක් අපි 17 වෙනිදා මුදල් කමිටුව තිබ්බේ. හත් වෙනි මාසේ ප්‍රසම්පාදන කමිටුවේ එවත් මේ විශේෂ කමිටුවට එනවා, 8 වෙනි මාසයේ ප්‍රසම්පාදන කමිටුවේ ඒවා එනවා විශේෂ මුදල් කමිටුවට මම අහන්නේ ඇයි මේ නිලධාරීන්ගේ දූර්වලතා නගරාධිපති කරට ගන්නේ විශේෂ මුදල් කමිටුවක් කැඳවන්න හේතු තියෙනවා අන්න සුනාමියක් ඇවිල්ලා අපිට මොනවා හරි කරන්න ඕන. ඔබතුමා කියන එක හරි අපි කට්ටිය කතා වුනා තිබ්බා කමිටුවක්. ස්වාභාවික විපතක් ඇවිල්ලා එහෙම නැත්තම් විශේෂ සිදුවීමක් වෙලා මොරටුවේ ඒ වගේ වේලාවක අපි එකතු වෙන එක වෙනම කාරණාවක් හැබැයි මෙහි ඔබතුමා නිකමට කියවලා

බලන්න ඔක්තෝබර් මාසේ 17 වෙනිදාට ඉස්සර වෙලා, මාස 2ක 3කට ඉස්සර වෙලා තියෙන ගනුදෙනුත් මේකට ඇවිල්ලා තියෙනවා. ඉතින් මේවා විශේෂ මුදල් කමිටුවක් තියලා කරන්න ඕන එකක්ද. අපි කියන්නේ නිලධාරින්ගේ වරද ඇයි මේ විදිහට සුළුවෙන් තකන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණාව මං පිළිගන්නවා නමුත් මේ නීත්‍යානුකූල නෑ නෙමෙයි නීත්‍යානුකූලයි හැබැයි මම දරපු උත්සාහයේදී අදාලව ඉදිරිපත් කරන ලද අන්තර්ගත කරුණු වල අර ඔබතුමා කියන ප්‍රශ්නය තියෙනවා. මම නිරන්තරවම උත්සාහ කරමින් ඉන්නවා තවදුරටත් මේවා ළඟ තියාගෙන කාලෙකට පස්සේ සභාවට ගේන එක යුක්ති සහගත නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා සද්භාවයෙන් මේ කරන්නේ අපිත් ඔබතුමා වගේම හැම එකකට අත උස්සනවා මේ දවස් ටිකේම අපි අල්ලස් එකට යනවා ගියාම අපිට කියනවා මේ ආඥා පනත අනුව ඔබතුමාලා කටයුතු කරලා නැහැ කියලා ඒ නිසා ඔබතුමාව දැන් රිමාන්ඩ් කරනවා කියලා කියනවා එතකොට අපි බයවෙනවා ඒ නිසා මම මේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ටත් කියන්නේ ඔබතුමාලා සත්භාවයෙන් කරන්නේ, නමුත් මේ ආඥා පනතත් එක්ක යන්න නැත්නම් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, නීත්‍යානුකූල භාවය පිළිබඳ ගැටළුවක් නොමැති වුණත් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හා නිලධාරීන් දැනගන්න ඕන. අපිව දැන් දීර්ඝ ප්‍රශ්න කිරීමකට ලක් කරනවා මේ අවරණ අනුමැතිය. ඒ නිසා මුදල් කමිටුවට පෙර අනිවාර්යයෙන්ම අදාල නීත්‍යානුකූල ව මූල්‍යමය අනුමැතිය ලබාගත හැකිවන ලෙස ඒවා ඉදිරිපත් කරන්න. අපි වේගවත් හැබැයි නිලධාරීන්ගේ ෆයිල් ඉතාම ඉබිගමනින්. අපිට වැඩ කරන්න ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, මේ කතා කරපු දේවල් අනුව මේ විශේෂ මුදල් කමිටුව ඔබතුමාට ඊළඟ මුදල් කමිටුවට ගේන්න තිබුණා. අනිත් එක අපි මේකේ මුදල් කමිටු මාසෙට දහයක් තිබ්බත් මහා සභාවට එන්න ඕනේ මේක අනුමත කරන්න ඔබතුමා ඔබතුමාගේ මන්ත්‍රීවරු විශ්වාස කරලා ඒක කොයි පැත්ත උනත් කවුරු හිටියත් මන්ත්‍රීවරු විශ්වාස කරලා තමයි මුදල් කමිටුවට ගෙනල්ලා මුදල් කමිටුවෙන් අනුමත කරන්නේ? හදිසියේ මේක මහා සභාවේ අනුමත වුණේ නැත්නම් මොකද කරන්නේ ඒක ප්‍රශ්නයක් වෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ මේ වෙනස් කරගන්න තමයි උත්සාහ කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරීස් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඇත්තටම මේක සත්භාවයෙන් කරපු බව අපිට තේරෙනවා ඇත්තටම. දාහත මුදල් කමිටුව තිබුණේ මෙතුමා කියන තර්කයත් එක්ක ඔබතුමාගේ පැත්තෙන් අපි ඔතන ඉන්නවා කියලා ගත්තොත් එහෙම සාමූහිකව සභාවක් විදිහට හිතලා ගත්තොත් එහෙම 17 වෙනිදා ඉදලා අද වෙනකන් තියෙන වියදම් ටික ඉලඟ සභාවේ අනුමත කරගන්න නම් හරි සාධාරණයි. හැබැයි යම් විදියකින් අභියෝගකට ලක්වුණොත් සත්භාවය කියන එකෙන්, ඡන්දය දුන්න පිරිස ඉන්නවනෙ ආණ්ඩු පක්ෂයට හරි විපක්ෂයට හරි ඒ අයට අංක 29 දරන අල්ලස් හා දූෂණ විමර්ශන පනතට අනුව සත්භාවය කියන එක ඔප්පු කරගන්න බැරුව යනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දහ වෙනිදා මාවත් කැඳවලා. මන්ත්‍රීවරුනි, මේ වෙර දරන්නේ පොර බදින්නේ කොහොම හරි මේවා නිවැරදි කරගන්න දරන උත්සාහයක් මිසක් වෙන කූඨ උවමනාවන් මත කරන ඒවා නෙමෙයි.

**06(1) 2025.10.14 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 02(4) කරුණ පාරවල් පවරා ගැනීම සම්බන්ධයෙන්. මෙතැනදී ඔබතුමන්ලා කියනවා මේ සම්බන්ධයෙන් ඔබතුමාලා දීර්ඝ ලෙස සාකච්ඡා කරා කියලා කමිටුවේදී. පොඩ්ඩක් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද ඒ පාරවල් පවරා ගැනීම සම්බන්ධයෙන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දෙකේ හතර කරුණ සම්බන්ධයෙන් මම කතා කරන්නම් නගර සභාවේ ප්‍රධානම වගකීමක් තමයි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ප්‍රධානතම අංගයක් තමයි පාරවල් සංවර්ධනය කිරීම. දැන් 49 වගන්තියෙන් අපිට ඉඩ දෙන්නේ ඉඩමේ අයිතිකරු ඒ කියන්නේ භූමියේ අයිතිකරු, පාර තියෙන භූමියේ අයිතිකරු විසින් නගර සභාවට පවරාදීම සඳහා පමණයි. නමුත් දැන් වෙලා තියෙන තත්ත්වය හැටියට භූමියේ අයිතිකරුවන් නැහැ. භූමිය අයිතිකරුවනුත් නෑ ඔවුන්ගෙන් පැවත එන කට්ටියත් නෑ. දැන් ඉන්නේ යම්කිසි කාලෙක වෙන්දේසි ඉඩම් වල පදිංචි වෙච්ච මිනිස්සු විතරයි. ඉතින් අයිතිකරුවෙකු හොයාගන්න බැරි අවස්ථාවක අපි කොහොමද මේ ඉඩම සංවර්ධනය කරන්න පාර හොයන්නේ මේක තමයි අපිට තියෙන මූලික ප්‍රශ්නය. දැන් අපි නීති නිලධාරියෙක් ගෙන් මේක විමසුවහම නීති නිලධාරී කියන්නේ 49 වගන්තියෙන් අපිට බලයක් නැහැ කියලා අයිතිකරු හැරෙන්න වෙන කෙනෙක්ගෙන් පවර ගන්න එතකොට දැන් අයිතිකරු ඇරෙන්න වෙන කෙනෙක් නැත්නම් පවර ගන්න සභාවේ සංවර්ධනය කිරීම කියන යටිතල පහසුකම ඉෂ්ට කරන විදියක් අපිට නැති වෙනවා ඒකට විකල්පයක් වශයෙන් තමයි. අපේ ඉඩම් නිලධාරීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා ඒක තාම සම්මත වුනේ නෑ මේ පාරේ ඉඩම් කමිටුවකට ඒක යොමු කරනවා. සරල ගිවිසුමකින් ප්‍රවේශ අයිතීන් ප්‍රවේශ හිමිකරුවන් පාරේ ප්‍රවේශ හිමිකරුවන් තමන්ගේ ප්‍රවේශ අයිතිය සංවර්ධනය කිරීම උදෙසා පමණක් ප්‍රවේශ අයිතිය නගර සභාවට පවරා දෙන්න ප්‍රතිපාදනයක් නැති වෙලාවේ අයිතිකරුවාගෙන් අපිට ඉඩම පවරගන්න අපි විශ්වාස කරනවා ඒ පාර දැන් අයිති ප්‍රවේශකරුවන්ට කියන එක. හැබැයි මේක පහුගිය පාලනය තියෙනකොට බොහොම සුළු ගිවිසුමකින් ප්‍රවේශ අයිතිකරුවන් නෙමෙයි පාරේ ඉන්න නිවාස වැසියන් අත්සන් කරලා පොඩි ලියුමක් දීලා ඊට පස්සේ පාරවල් සංවර්ධනය කරලා තියෙනවා. එහෙම පාරවල් අනන්තවත් තියෙනවා මොරටුවේ. හැබැයි ඒක ඊටත් වඩා වැරදි දේ වුණත් ටිකක් හොඳ විදිහට කරන්න තමයි අපි යෝජනා කරන්නේ. පාරේ ඉන්න ප්‍රවේශ අයිතිය හිමිකරුවන්ගේන් සංවර්ධනය කිරීම සඳහා නගර සභාවට පවරන්න. සංවර්ධනය කිරීම සඳහා පමණක් ඉතින් මේකට අපි නගරාධිපතිතුමා ඉදිරියේ අත්සන් කරන ගිවිසුමක්. සාක්ෂිකරුවන් වශයෙන් තවත් ප්‍රවේශ අයිතිය තියෙන හිමිකරුවන් දෙන්නෙක් යොදාගෙන අත්සන් කරලා මේ පාරවල් තෝරා ගන්නේ සත්භාවයෙන්ම සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සඳහා පමණයි. යෝජනා කරනවා අපේ ඉඩම් නිලධාරීතුමා හදලා තියෙනවා ඒකට ගිවිසුමක් ඩ්‍රාෆ්ට් එකක් මං හිතන්නේ දෙහිවලත් ඒ වැඩේ කරනවා. මම එය සභාගත කරන්න කියලා කියනවා. නැත්නම් ඉඩම් කමිටුවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි මං හිතනවා විපක්ෂ හැටියට මේ සම්බන්ධය අපේ කරුණු ඉදිරිපත් කළ යුතු හේතුව මේක තනිකර නීතියට පටහැනිය 49 වන වගන් තියේ පැහැදිලිව සඳහන් වෙනවා නීති නිලධාරි ලිපියක් මඟින් ගිය පාර කමිටුවට ඉදිරිපත් කරලා තියෙනවා. පහුගිය කාලයේ කරපු එක වෙන කතන්දරයක් මෙතනින් එහාට කරනවා නම් මේක නීති විරෝධී. මෙතන කරන්නේ පාරක් පවරා ගැනීම ඊටපස්සේ මේක නගර සභාව සතු පාරක් බවට පත් වෙනවා. ඔබතුමා ඒ පාර සංවර්ධනය කිරීමේදී නගර සභාව සතු මුදල් යොමු කිරීම සිදුවෙනවා. එතකොට මේකේ නීතිය පැහැදිලිව සඳහන් වෙනකොට ඔබතුමන්ලා සත්භාවයෙන් යම්කිසි දෙයක් කරනවා වෙන්න පුළුවන්, අපිටත් සත්භාවෙන් ගොඩක් දේවල් කරන්න පුළුවන්. අපිට සත්භාවයෙන් මේ මොරටුව නගරය තුළ විශාල දේවල් කරන්නට පුළුවන් සත්භාවයෙන් කරන්න බැහැනේ රටේ නීතිය ක් තියෙනවනේ විකල්ප යෝජනා මේක සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවට ලියන්න ලියලා ඩිරෙක්ෂන් එකක් ගේන්න ඒ හරහා වැඩ කරන්න. මේක ඔබතුමාලා සත්භාවයෙන් කියලා ගිවිසුම් අත්සන් කරලා කොහේ තියෙන නීතියක්ද, කලින් සභාවල් වල කරා කියන එක වෙන කතාවක් ඒක වෙනස් පාලනයක්නේ එතකොට ඒ පාලනයට අනුව මේ ඇක්ට් එකට පටහැනිව යම් දෙයක් කරනවනම් එක නීතියානුකූලව කරන්න. ඒවා සම්බන්ධයෙන් මුදල් අනුමත කරනවා නම් මුළු චේයින් එකම වැරදියි අපිට විපක්ෂයක් හැටියට මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරා අපේ විරුද්ධතාවය මේ සම්බන්ධයෙන් අපි ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, මම කියන්නේ තමන්ගේ ඔලුවේ මොකක් හරි ස්ථිර අදහසක් හදාගෙන ඒක ඉදිරිපත් කරන්න. හරි පැහැදිලියි 02(4) ට අදාලව තීන්දුවක් මුකුත් අරගෙන නැහැ. ගැටළුවක් තිබෙන බව සාකච්ඡා වෙනවා, පාරක් සංවර්ධනය කිරීමේදී ඒ පාර පවරා ගැනීමට කටයුතු කිරීම සඳහා ඇතිවෙලා තියෙන නෛතික ගැටලුවක්. ඒ ගැටළුව කොහොමද අපි ඔබ කියන අර නීතියට පටහැනි නොවෙන ලෙස සභාවක් විදියට බේරගන්නේ. ඉතාම පැහැදිලිව කියනවා. විකල්පයක් සොයා බැලීම සඳහා වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කරනවා. එහෙම මොකුත් මෙතන කරලා නැහැ. විශාල මාර්ග ප්‍රමාණයක් තියෙනවා ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා ඔවුන්ගේ මාර්ග සංවර්ධනය කරගන්න, සැලකිය යුතු ලෙස පටු මාර්ග අඩි තුනේ හතරේ. මම කියන්නේ දැන් එක විටක හිටපු නගරාධිපතිතුමා සභාවේ සම්මත කරගත් යෝජනාවක් හරහා අඩුපාඩු ඇති, ඒවා වල අරමුණේ ගැටලු ඇති, හැබැයි ඒකෙන් සැලකිය යුතු ජනතාවක් තමන්ගේ මාර්ගය සංවර්ධන කටයුත්තක් කර ගත්තා. දැන් අපි තවදුරටත් බලන්න ඕන සභාවක් නීතිය කඩාගෙන යන්නේ නැතුව, අපිත් නීති හදන්න පුළුවන් ආයතනයක්. අපිට නීති හැදීමේ බලය දීලා තියෙනවා. අපි ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් කොහොමද නීතියක් අලුතෙන් හදන්නේ කියන එකට තමයි මේ උත්සාහය දරන්නේ. ඒක පදනම් කරගෙන අපි තාම තීන්දුවකට ගිහිල්ලා නෑ. ගිය නැති එකක් තීන්දුවකට ගිය විදිහකට අර්ථ ගන්වමින් කරන දේ හොඳ දෙයක් නෙමෙයි. අපි කවුරුත් උදව් කරමු. කාගේත් දැනුමෙන් අවබෝධයෙන් මේ තත්ත්වය වෙනස් කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අදහස් දැක්වීමයි අපේ ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු දෙයයි, අපේ තුසිත් මන්ත්‍රීතුමා කියපු කාරණා එක්ක මට මෙන්න මෙහෙම කාරණාවක් කියන්න තියෙන්නේ. එකක් තමයි අර නීති හදන්න අපිට බලය තියෙනවා. එය ගැටළුවක් නැහැ. හැබැයි අපිට නීති හදන්න බලය තියෙන අතුරු ව්‍යවස්ථාව හරහා ආඥා පනත අභිබවා නීති හදන්න අපට බලයක් නැහැ. අපි සමහර කරුණු ඉදිරිපත් කරන්නේ, දේශපාලන කාරණා වෙනයි. නමුත් සභාවේ බොහෝ කාරණා කමිටුවල වෙන්න පුළුවන්. මහජන උපයෝගීතා කමිටුවට මට දෙන්න පුළුවන් උපරිම දායකත්වය මම දෙනවා. එහිදී ඔබතුමාලාට වාසි වෙනවද කියන මේ පටු මානසිකත්වයක අපි නැහැ. ලිහිණි මන්ත්‍රීතුමිය පෙන්නුවේ මෙහි යම් ගැටළුවක් තියෙනවා. ඒ ගැටළුව අපි තුසිත් මන්ත්‍රීතුමා සඳහන් කරා සද්භාවයෙන් කියලා. කවුරුත් සද්භාවයෙන් වැඩ කරන්න සූදානම්. නමුත් සද්භාවයෙන් වැඩ කරලා සිටින්නේ සමහර කාරණා විපක්ෂ මන්ත්‍රීවරු මතු කරද්දී, ඒක

විවේචනාත්මක පැත්ත වෙනුවට පොඩ්ඩක් සාවදානව අපි කියන එක අහන්න. මම කියන්නේ නැහැ අපි කියන ඔක්කොම කරන්න කියලා. හැබැයි අපි වැඩේ කඩාකප්පල් කරන්න කියන දේවල් නෙමේ මේ. ඔබතුමාලා යම්කිසි විදියකින් යම් වරදක් වෙනවා නම් යම් ප්‍රමාණයක නිවැරදි කිරීමක් කරගන්න තමයි අපි කියන්නේ. අපි මේ නගර සභාව කියන ආයතනය කඩා වට්ටන්න නෙමෙයි, සද්භාවයෙන් අපිත් කියන්නෙ.

**ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ඔබ කියන දේ හරි. මට ලිහිණි මන්ත්‍රීතුමිය හරි වැදගත්. අවංකවම ලිහිණි මන්ත්‍රීතුමිය සැලකිය යුතු දෙයක් හොඳින් දැකල පෙන්නලා කතා කරන මන්ත්‍රීවරියක්. එතුමියට මුකුත් කිව්වා නෙමෙයි. මම කියන්නේ මෙතන තීන්දුවක් අරන් නැනේ. එතුමියවත් අපිට ඕනේ. නීතිය පිළිබඳව සැලකිය යුතු දැනුමක් අවබෝධයක් තියෙන හැම කෙනාම මේ වෙලාවේ අපිට උදව් කරන්න. අපි තීන්දුවක් අරගෙන නැහැ. හැබැයි අපි ඉස්සරහ ප්‍රශ්නයක් තියෙනවා. ඒ ප්‍රශ්නය නීතියට පටහැනි නොවන ලෙස නිරාකරණය කර ගැනීම සඳහා අර මන්ත්‍රීතුමා කිව්වේ ඊට අදාළ කරන ප්‍රවේශය අයිතිය තියෙන අයගෙන් යම් ගිවිසුමක් හරහා එකඟතාවයක් අරගෙන කරන්න. එය පුළුවන්ද බැරිද කියන එක සාකච්ඡාවක් තියෙයි. අපිට හැම සාකච්ඡාවකින්ම අනතුරුව තමයි අවසන් තීන්දුවට යන්න වෙන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා**

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් ඉන්දික අපේ මන්ත්‍රීතුමා ඇත්තටම මේක වරද්දගන්න එපා. අර සභාවේ සමහර ප්‍රකාශන කරන ආකාරයේදී ස්වරය වේගවත් වෙනවා. සමහර වෙලාවට ඒවා ගැටුම් වාගේ පේනවා නමුත් ඒවා ගැටුම් නෙමෙයි. ඇත්තටම අද අපේ විරුද්ධ පක්ෂයේ නායක සේනක මන්ත්‍රීතුමා එක්ක කතාකරා ආපු වෙලාවෙම. මම කිව්වා අපිට හැම දෙනාටම ප්‍රයෝජන වෙන හැමදාම ගැටළු සහගත වෙන මේ ඉඩම් කමිටුවට එනවා නොයෙකුත් පාරවල් සිය ගණනක්, ඇත්තටම ඇවිල්ලා තියෙනවා. හැබැයි මේ එකක්වත් ක්‍රියාත්මක කරන්න බැහැ. අපි නීතිය තුළ හිරවෙලා ඉන්නවා. ඒ නිසා මේ නීතිය සංශෝධනය වෙන්න ඕනේ 49 වන වගන්තිය ඔස්සේ. වගන්ති ඇතුලෙම ඉඳගෙන අපිට මේ කිසිම ප්‍රශ්නයක් බේරගන්න බැරි නම් අපි මේ සභාවේ කමිටු තියාගෙන රැස්වෙන එකේ තේරුමක් නැහැ. ඒ නිසා අපි පාර්ලිමේන්තුව හෝ ඒ තීරණ ගන්න සභාවකට වහාම ලියන්න ඕනේ මේවා බේරලා දෙන්න කියලා. මේවට අනවශ්‍ය විශාල කාලයක් ගතවෙනවා. ලිහිණි මන්ත්‍රීතුමියත් එක්ක අද මම කතා කරන්න හිතාගෙන ආවා. ඔබතුමියට නීතිය පිළිබඳ බොහෝ දැනුමක් තියෙනවා සහ අපි අනෙක් කණ්ඩායමේත් සිටිනවා නීතිඥ මහත්වරු ගණනාවක්ම. ඒ නිසා උපදෙස් දෙන්න අපිට වෙනත් මාර්ගයක් හරි පෙන්වන්න අපිට මේ ප්‍රශ්නෙ විසඳගන්න. මේ කමිටුවලට රැස්වෙනවා, එකම ප්‍රශ්නවලට. ඊට පස්සේ අපි ඒවා ගාණකාධිකාරි තුමියට, ඉංජිනේරුවරයාට යවනවා මේක විසඳෙන්නේ නැහැ. දැන් නීති නිලධාරීතුමිය අපේ එක යෝජනාවකදී කියලා එවලා තිබුණා ඉඩම් ගැසට් කිරීම සම්බන්ධයෙන්. ඒ යවපු ලියුමේ යම් වගන්තියක් ගැන ගැටලුවක් තියෙනවා කියලා මේ ඇමුණුමේ තියෙනවා. එතකොට මම කියන්නේ මේවා අපේ අභ්‍යන්තරයේ පවතින ගැටලු. අපි මේවා හරිම සුහදව කතා කරලා විසඳගමු. ඇත්තටම මේ සභාවේ පූර්ණ අනුමැතිය දෙන්න කියලා මම ඉල්ලීමක් කරා වේලස්සනත්. මම මෙතුමටත් කිව්වා. ඔබ දැනට කමිටු සම්බන්ධයෙන් ඇතිකරගෙන තියෙන යම් සම්මුතියක් තියෙනවා. අපි ගෙන ඕන යෝජනාවකට විරුද්ධව මේ වේලාවේ ඡන්දය පාවිච්චි කරනවා කියලා. දැන් එතකොට එහෙම ඡන්දය පාවිච්චි කරනවනම් අපි මේ කරන වාද විවාද වල තේරුමකුත් නැහැ අපි හිරේ යාම සහ අපිට දඬුවම් කිරීම සම්බන්ධයෙන් ඔබලා තුළ තියෙන සානුකම්පිත භාවය පිළිබඳව අපි ඔබට කෘතවේදීත්වය පළකර සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, 02(11) කරුණට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මොරටුව ඉහළ ඉදිබැද්ද සේවා පටුමගේ නොම්බර 9/5 එච්. ලලිත් පොන්සේකා මහතා විසින් ගරු නගරාධිපති නිශාන්ත ප්‍රතිනාන්දු මහතා වෙත ඉදිරිපත් කර ඇති කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලද මෙම ලිපිය ඉදිරිපත් කරනවා. මෙම ලිපියේ තාක්ෂණ නිලධාරි වාර්තාවේ තියෙනවා මේ මාර්ගය අඩි

පනස් එකක් දිගයි අඩි තුනක් පළලයි කියලා. මේ පාර පවරා ගැනීමේදී මේ මාර්ගයම දෙපැත්තේ ඉන්න කට්ටිය ගෙනල්ලා සාකච්ඡා කරන්න කියලා. හැබැයි මෙහි ඇමුණුමේ තියෙනවා. මාර්ගය පුළුල් කිරීම සම්බන්ධව ඉල්ලීම කරපු කෙනා සේවා පටුමග අතුරු මාර්ගය, නොම්බර 9/3, සේවා පටුමග, ඉහළ ඉදිබැද්ද, මොරටුව සිට 9/5, සේවා පටුමග, ඉහළ ඉදිබැද්ද, මොරටුව දක්වා ඇති පටු අතුරු මාර්ගය අඩි 03ක ප්‍රමාණයකින් පුළුල් කිරීමට. එයාගේ ඉල්ලීම තියෙන්නේ මේක අඩි 03යි පළල තව අඩි 03ක් දාලා අඩි 06ක් කරලා පුළුල් කරලා සභාවට පවරා ගැනීම කරන්න කියලා. මෙතනම මෙය නිවැරදිව විය යුතුව තියෙනවා. මොකද සභාවට පවරා ගැනීමට මම හිතන්නේ අඩි 10ය දක්වා පුළුල් විය යුතුයි. හැබැයි ලිපියේ තියෙන්නෙත්. අඩි තුනක් තව පළල් කරලා දෙන්න කියලා. මුළු මාර්ගයම වෙන්නේ අඩි හයයි. මේ ලිපිය පැහැදිලිවම තියෙනවා මෙතන පවුල් නවයක් ඉන්නවා කියලා. කරුණා කරලා මෙය නිවැරදි කරන්න. 9ක් ඉන්නවා නම් දෙපැත්තේ පදිංචිකරුවෝ දෙන්නා විතරක් මේ සාකච්ඡාවට ගෙන්නවන්න එපා. මේ ඉතුරු පවුල් 7 ත් ගෙන්නන්න. පවුල් 9 ම ගෙන්නලා මේකට නිවැරදි සාකච්ඡාවක් කරන්න. නැත්තම් නැවත අඩි 3ක් අරන් ඉවරවෙලා අඩි 6ට තමයි මේ පාර තියෙන්නේ. එතකොට මේක සභාවට ගන්න බැහැ මේ වැරදි වාර්තාවක් මේ දීලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා අපි කරුණු ඉවත් කරන්න එපා. මේ පවුල් නවයම කැඳවලා නිවැරදි ක්‍රමවේදයකට යන්න කියලා ඉල්ලීම් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබ හරි, වාර්තාව ගැටලුවක් නෙමෙයි මේ තියෙන්නේ. මේ භූමිවල තියෙන විශාල ප්‍රශ්නයක්. අපිට පුළුවන් අඩි 10 පවරාගන්න හැබැයි සමහර ස්ථාන තියෙනවා කිසි ලෙසක අඩි 10 කට යන්න බැහැ. අඩි 02,03 තියෙන්නේ. ඒ අයට අඩුම තරමේ මැරුණහම පෙට්ටිය උස්සන්නගෙන යන්නත් බැහැ. ඒ නිසා නීතිමය පැත්ත කොහොම වෙතත් ඔවුන්ගේ එකඟතාවයන් හරි හදලා උත්සාහ කරන්න පුළුවන්. ඇති තරම් මේ මිනිස්සු මේ ප්‍රශ්නවලින් පීඩාවට පත්වෙලා ඉන්නවා. අපිට පුළුවන් නම් අතරමැදි කටයුත්තක් කරලා එකඟතාවයක් ඇතුලේ අඩි හය හරි අරන් දෙන්න. සභාවට පවරගන්න බැහැ ඒක හරි. හැබැයි අඩි හයේ ඒ මිනිස්සුන්ට ඊට පස්සේ යන්න එන්න පුළුවන්.

**2025.10.14 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |

19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.10.14 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරිසිරි ජේ. ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂලාා පෙරේරා මහත්මිය
22. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණී මෙනවිය

**2025.10.14 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා)

**06(2) 2025.10.14 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, 02(7) කියලා තියෙනවා මේන් ඩෝ එක කැඩිලා ඒක අලුත් වැඩියා කරන්න කියලා, ඒ වගේ මෙතන තියෙනවා විදුලි සෝපානය අලුත් වැඩිය කටයුතු කරන්න කියලා. මම හිතන්නේ කොමසාරිස්තුමියගේ පාලන කාලේ ඉඳලම තමයි මේක තියෙන්නෙ. හැමදාම කමිටුවට එනවා. නාගරික ඉංජිනේරුතුමාට ඔබතුමා උපදෙස් දෙනවා කවදද මේක ඉවර වෙන්නේ? හැමදාම කමිටුවට ඇවිල්ලා කතා කරාට වැඩක් නෑනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, පහුගිය කමිටුවේදී මේ කාරණය සාකච්ඡාවට ගත්තා. මේ ප්‍රධාන ඉංජිනේරුතුමා සහතික කරා දොරටුව අලුත්වැඩියා කරන්න අපේ නගර සභාවේ කර්මාන්ත අංශයට බැහැ. එක නිසා පිටස්තර මිල කැඳවීමක් කරලා හැකි ඉක්මනින් ඒ කටයුත්ත නිම කරන්න. ඊලඟට විදුලි සෝපානය, එම කරුණත් සාකච්ඡා කරා. විදුලි සෝපානයේ සේවා ගිවිසුම 2023 ඉඳලා නැවත අලුත් කරලා නැහැ. යාන්ත්‍රක ඉංජිනේරුතුමා ඒ වගකීම භාරගත්තා ඉදිරියේදී ඉතා ඉක්මනින් මේ විදුලි සෝපානයේ කටයුතු අවසන් කරන්න. මේ වාර්තාව මේ කමිටුවට ගේන්නත්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය, ලේඛන දිහා බල බල ඉන්නේ නැහැ. වැඩේ කරන්න ඕන කරන මොනවා හරි වියදම් දරන්න දෙයක් තියෙනවනම් කරනවා. මේක හැමදාම බල බල ඉන්න බැහැනේ. දැන් අපිට කර්මාන්ත අංශයෙන් පැහැදිලි කිරීමක් කරගන්න බැරිද? දැන් දීර්ඝ කාලයක් තිස්සේ මේවා කතා කරනවා. අද ඉංජිනියර් සභාවට පැමිණිලා නැහැ. මේ අවස්ථාවේදී නාගරික යාන්ත්‍රික ඉංජිනේරුට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

<u>නාගරික යාන්ත්‍රික ඉංජිනේරු - එච්.එන්. ප්‍රියශාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමා, විදුලි සෝපානය කලින් ගැටළු කිහිපයක් ආවා. ඒක වැස්සකට තෙමිලා. විදුලි පද්ධති කිහිපයක්ම අක්‍රිය වෙලා තිබුණා. ඒ අක්‍රිය වුන ඔක්කෝම හැදුවා කම්පැනියෙන් ඇවිල්ලා. හදලා මාසයක් එකහාමාරක් වගේ කාලයක් තමයි තිබුනේ. පසුව නැවත සැරයක් අක්‍රිය වුනා. ඊට පසුව කම්පැනියෙන් ඇවිල්ලත් බැලුවා. ඒ බලන අතරතුර කාලයේදී එයාලාගේ සර්විස් ඇග්‍රිමන්ට් එකත් ඊළඟ අවුරුද්දට එවලා තිබුනා. නමුත් අපි ඇග්‍රිමන්ට් එකට ඇතුළත් වුනේ නැහැ. එය සභාවට දාලා අනුමත කරගන්න අතරවාරයේදී නැවත සැරයක් මේ කම්පැනියෙන් ඇවිල්ලා කිවුවා මේක හදලා වැඩක් නැහැ තෙමෙන නිසා. පීලි වලට වතුර ඇවිල්ලා පීලි ඇත්වෙලා දොරවල් හරියට වැහෙන්නේ නැහැ කියලා. තෙමෙන එක හදන්න ඕන කියලා කිවුවා මේක හදන්න. ඒ හේතුවෙන් එක නැවතුනා. තෙමෙන එක හදන්න ඕන කර්මන්ත අංශයෙන් හෝ කොන්ත්‍රාත්කරුවෙකු හට දීලා හදන්න වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමා, යාන්ත්‍රික ඉංජිනේරුතුමා විසින් ඔය කරුණ ගිය සභාවට කලින් සභාවේදීත් පැහැදිලි කිරීමක් කරා. අපිට අවශ්‍යය මේක හදන්නේ කවදද කොහොමද කියලා දැන ගන්න.

<u>නාගරික යාන්ත්‍රික ඉංජිනේරු - එච්.එන්. ප්‍රියශාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, තෙමෙන එක සම්බන්ධයෙන් මට වගකීමක් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහතා</u>**
ගරු නගරාධිපතිතුමා, එතකොට අදාල අංශයට යොමු කරලාද තියෙන්නේ මෙය.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකොන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමා, අපි ආපු දවසේ ඉඳලා මේ තෙමෙන එක කියනවා. එක්කෝ තෙමෙන එක හදන්න එක්කෝ ලිෆ්ට් එක ගලවලා දාන්න දෙකෙන් එකක් වෙන්න ඕනේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු කොමසාරිස්තුමිය, අපිට තේරුම් ගන්න තියෙන්නේ එකයි වම් අත කරන දේ දකුණු අත දන්නේ නැහැ. දැන් අපි සභාව ඉල්ලනවා ඉක්මනට ජනතාවගේ අවශ්‍යතාවයක්, ලොකු වියදමක් දරපු වැඩක්. එතකොට තව කාලයක් යද්දි මේ ලිෆ්ට් එක වියදම් කරලාවත් හදන්න බැරි වෙනවා. එක මේ පැත්තෙන් හදද්දි ගැටළුව ඔවුන් හදුන ගන්නවා තෙමෙනවා කියලා. ඉතින් හදුනගත්තනම් තෙමෙන එක කියලා ඊලඟට තමන්ගෙම ආයතනයේ ඇතුලේ ඉන්න ඉංජිනේරුතුමාට, කර්මාන්ත අංශයට කියන්න ඕනනේ. අපි කවුරුත් සභාවක් විදිහට වැඩ කරන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකොන් මහතා</u>**
ගරු නගරාධිපතිතුමා, සභාපතිතුමිය හැමදාම කමිටුවේ ඉන්නවා. එතුමිය දැන ගන්න ඕනනේ මේ වැඩේ කරගන්න. ඒ නිසා මේ සම්බන්ධව අවධානය යොමු කරන්න. 2026 ත් මේ වැඩේ වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඉස්සරහට යමු 02(11) කරුණේ දිගරොල්ල පොළ භූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්. මෙහි අලුත් දෙයක් තියෙනවද සංවර්ධනය කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහතා</u>**
ගරු නගරාධිපතිතුමා, දිගරොල්ල පොළ භූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කරන යොජනාව යටතේ තියෙනවා මාර්ගය දෙපසින් ඉඩ අරගෙන මැදින් කඩ පේලියක් හදලා දෙපැත්තෙන්ම යන්න පුළුවන් පාරවල් දෙකක් හදලා. පොළ ඇතුලට මිනිස්සුන්ට පහසුවෙන් යන්න පුළුවන් ක්‍රමයක් හදලා. කෙළවරේම වෙළඳසැලට පවා ගිහිල්ලා අවශ්‍යතාවයන් සපුර ගන්න පුළුවන් ආකාරයට මේ පොළ භූමිය සංවර්ධනය කරන්න. එහිදි අදාල තාක්ෂණ නිලධාරින් සමඟ ස්ථානීය පරික්ෂණයක් කරලා අදාල වාර්තාවක් මීලඟ කමිටුවට යොමු කරලා ඒ පිළිබඳව කටයුතු සාකච්ඡා කරන්න සුදානම් කරලා තියෙනවා.

**2025.10.14 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |

13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.10.14 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ජේ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
22. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2025.10.14 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ සියලුම නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා)

**06(3) 2025.10.14 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ 02(4) සේවකයින්ගේ නිල ඇඳුම් සම්බන්ධයෙන් අපි ආයතන කමිටුවේ ගත්ත තීන්දුව නෙමෙයි වාර්තාවේ තියෙන්නේ. ආයතන කමිටුවෙදී ගත්තේ එක කියන කැටගරි එකේ සේවකයින්ට 6000 ඉඳලා 9000 කරා. 02 කියන සේවකයින්ට 10000 ඉඳලා 12000 කරා. 03 වන කැටගරි එකේ සේවකයින්ට 12000 එහෙම්මම තිබ්බා. එක තමයි ආයතන කමිටුවේ ගත්ත තීන්දුව. මම හිතන්නේ සභාපතිතුමිය මතක ඇති, ඒ වගේම සුදේශ් මන්ත්‍රීතුමාටත් මතක ඇති. නමුත් දැන් මේකේ තියෙන්නේ අංක 01 හා 02 හි සඳහන් තනතුරු සඳහා රුපියල් 9000ක දීමනාවක් සහා කණ්ඩායම් අංක 03හි සඳහන් සේවකයින් සඳහා රුපියල් 12000 ක නිල ඇඳුම් දීමනාවක් ලබා දීමට මුදල් කමිටුවට යොමු කිරීමට නිර්දේශ කරන ලදී. මේකට අනුව 10000 ට තිබ්බ කෙනාට 1000ක් අඩු වෙලා. එහෙම එකක් වුනේ නැහැ කමිටුවේදී, අපි 10000 තිබ්බ අයටයි 12000 තිබ්බ අයටයි 12000 කරන්න කතා කරා. 6000 තිබ්බ අයට 9000 කරන්න කතා කරා. මෙය සංශෝධනය වෙන්න ඕනෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් ඇත්තටම ටිකක් ගැටළු සහගත තත්ත්වයක් මතු වුනා ඒ පිළිබඳව අදාල අය සමඟ සාකච්ඡා කරා. ඒ සාකච්ඡාව ඇතුලේ දැනුන දේ තමයි ස්ථාවර කමිටුවේ සාමාජිකයෝ මේ නිර්දේශය දීපු විදිහයි කමිටුවේ සටහන් කරද්දි සටහන් කරපු විදිහයි අතර ගැටළුවක්. එතකොට කමිටු සමාජිකයෝ කියන්නේ සත්‍යක් ඒ වෙලාවේ කරපු සටහන් පොත් දෙකක් තියෙනවා දෙන්නෙක්ගේ එවා ගෙනල්ලා බැලුවම ඔවුන් ඒ සටහන් යොදලා තියෙන විදිහත් එකයි. කෙසේ නමුත් මේ සභාවට තමයි අවසන් තීන්දුව ගන්න තියෙන්නේ. නිලධාරින්ගේ පැත්තෙන් වුන අඩුවක් තියෙනවනම් එකත් නිවැරදි කරගෙන, වාර්තාවල වල සමහර ගැටළු තියෙන්න පුළුවන්. උප නගරාධිපතිතුමිය අත්සන් නොකර හිටියා මුලින්, මේක නොකියන්න හිටියේ යම් වෙනසක් වෙලා කියලා මම ඊට පස්සේ එතුමියට කතා කරා. මම දැන් කියන්නේ මේ වේලාවේ සභාවේ තීන්දුව තමයි වැදගත්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ පැහැදිලිව ගත්ත තීන්දුව තමයි අපි එක එවෙලෙත් සුදේශ් මන්ත්‍රීතුමාත් එක්ක සාකච්ඡා කරලා තමයි ගත්තේ 6000 තිබ්බ අයට 9000 කරන්න එහෙම තමයි අපි නිර්දේශය දුන්නේ. 12000 තිබ්බ කට්ටියට වෙනසක් වුනේ නැහැ. නමුත් 10000 තිබ්බ කට්ටියට12000 යි කියලා අපි තීන්දුවක් ගත්තා. අපි ඉතින් යෝජනා කරනවා එක ඒ විදිහට කරන්න කියලා.

<u>නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒකට සභාව එකඟ නම් අපි කමිටු වාර්තාවේ අංක 02(04) නිර්දේශයේ සඳහන් නිල ඇඳුම් ලබාදීමට නිර්දේශ කර ඇති,

- කණ්ඩායම් අංක 01 හි නිල ඇඳුම් දීමනාව රු.9,000.00 ක් වශයෙන් ද,
- කණ්ඩායම් අංක 02 හි නිල ඇඳුම් දීමනාව රු.12,000.00 ක් වශයෙන්ද,
- කණ්ඩායම් අංක 03 හි නිල ඇඳුම් දීමනාව රු.12,000.00 ක් වශයෙන්

2025 වර්ෂයට නිල ඇඳුම් සඳහා නිල ඇඳුම් දීමනාව ලබාදීම සංශෝධනයට අනුමැතිය ලබාදීමට එකඟතාවය පළ කරමු.

**ඒ අනුව 2025.10.14 දිනැති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(04) කරුණ ඉහත පරිදි ඒකමතිකව සහා සම්මත විය.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 07 වෙනි කරුණ මේක ඉතාමත් වැදගත් කරුණක්. නීති නිලධාරි විසින් 2025.10.14 දිනැතිව ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන් වෙත සහා අරමුදලින් ගෙවා ඇති ඉන්ධන දීමනා සහ මුද්දර දීමනා පිළිබඳව අධිභාර මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කරුණු සලකා බැලීම. මෙහිදී අපි එදා ගත්ත තීන්දුව තමයි සාකච්ඡාවකට කැඳවන්න කියන එක. මෙහි තියෙනවා ටිකක් අපැහැදිලි ඇමුණුම් ලිපියක්. මේ ලිපියේ සඳහන් වෙනවා. ඇමුණුම් අංක 10 යේ 3 යටතේ අධිභාරකරුවන් අතුරින් ඒ.ගුණසෝම, එච්.එන්.එස්. අංගම්මන, කේ.එන්.ජී. ප්‍රනාන්දු, යූ.ඩී.සී. ප්‍රනාන්දු, එම්.ඩී. ධර්මසේන, පී.ඩී. ලොකුවැල්ල, යන අධිභාරකරුවන් 06 දෙනෙකු අධිභාර වලින් නිදහස් කරනු ලැබ ඇති අතර, එතකොට අපිට ප්‍රශ්නයක් එනවා. මේ අයව නිදහස් කරන්නයි අනෙකුත් උදවියව තියා ගන්නයි. මොකද්ද බලපාපු නීතිය කියලා ගැටළුවක් එනවා. ඊලඟට එකේම කියනවා ඩබ්.වයලට් ද මෙල්, පී.ඒ. සනි ප්‍රනාන්දු, ආර්.කිත්සිරි ප්‍රනාන්දු, හිරාන් ඩී.ගුණසේකර, වී. මිල්ටන් ද මැල්, පී. දිලිප් කුමාර තෙන්නකෝන්, සුජිත් ලක්නාත් මද්දුමගේ, පි. ගාවින් මත්තෙස් යන අධිභාරකරුවන් 08 දෙනෙකු මේ වන විට මිය ගොස් ඇත. අධිභාරකරුවන් 08 දෙනෙක් මැරිලා. එතකොට 04 වෙනි කරුනේ කියනවා විගණකාධිපති විසින් අධිභාර සහතික නිකුත් කිරීමේ තීරණයට පෙර නිදහසට කරුණු කියා සිටිමට අවස්ථාව ලබා දී තිබියදී අධිභාරකරුවන් විසින් ලිඛිතව ඉදිරිපත් කර ඇති කරුණු අධිභාර වලින් ඔවුන් නිදහස් කිරීම සඳහා පිළිගත නොහැකි බවට විගණකාධිපති විසින් අධිභාර සහතික එවා ඇති ආවරණ ලිපි වල සඳහන් කර ඇත. ගරු නගරාධිපතිතුමනි, නිලධාරින් තමන්ගේ ඇඟ බේරගෙන මන්ත්‍රීවරුන්ව තමයි අහුකරලා තියෙන්නේ. මොකද හේතුව නිලධාරින් තමයි මන්ත්‍රීවරුන් වෙනුවෙනුත් අධිභාරයට පිළිතුරු ලියන්නේ. කොයි වෙලාවකවත් අපි දැනුවත්ව මන්ත්‍රීවරු පිළිතුරු ලියන්නේ නැහැ. අපි 2006 ඉන්නකොට තමයි මේ අධිභාර ආවේ. මන්ත්‍රීවරු ගෙවන්නේ නැතුව හිටියේ නැහැ. මන්ත්‍රීවරු ගෙව්වා. ඊට පස්සේ ආපහු චක්‍රලේඛනයක් පෙන්නලා නැවත වරක් මන්ත්‍රීවරුන්ට ගෙව්වා. ඔබතුමාට මතක ඇති. ඉන්පසුව තමයි මේ අධිභාරයට ලක්වුනේ. මෙහි පස්වෙනි කරුණ පැහැදිලි නැහැ. විගණකාධිපති විසින් දීමනා ලබා ගත් මන්ත්‍රීවරුන් වෙනුවෙන් තෝරාගත් කොටසකට හා නගරාධිපතිවරයාට ද, මොන නගරාධිපතිවරයාටද කියලා ප්‍රශ්නයක් තියෙනවා. නගරාධිපතිතුමා 10/13 මේ ලිපිය එවලා තියෙන්නෙ. එතකොට නගරාධිපතිවරයා කියන්නේ ඔබතුමාද හිටපු නගරාධිපතිවරයාද කියන එක, "නගරාධිපතිවරයාට ද නිලධාරින් පිරිසකටද බලපාන පරිදි අධිභාර සහතික නිකුත් කිරීමෙන් පසු අධිභාරගත නිලධාරින් හය දෙනෙකු එක්ව ලිඛිතව අමාත්‍යවරයා වෙත අභියාචන ඉදිරිපත් කරනු ලැබ ඇති අතර එම අභියාචනය මත එකී නිලධාරින් හය දෙනා විෂයභාර අමාත්‍යවරයා විසින් අධිභාරවලින් නිලදහස් කර ඇත." විෂය භාර අමාත්‍යවරයා අධිභාරවලින් හය දෙනෙක් නිදහස් කලා නම් අනිවාර්යයෙන්ම අනිත් කට්ටියටත් පුළුවන් විෂය භාර අමාත්‍යවරයාගෙන් මේ ඉල්ලීම කරන්න මම දන්න විදියට. එකතොට ඒ ඉල්ලීම අනුව විෂයභාර අමාත්‍යවරයාට සිද්ධවෙනවා ඒ හය දෙනා වගේම අනිත් අධිභාරකරුවන්වත් නිදහස් කරන්න. මේ ලිපිය අපිට එදා ආයතන කමිටුවේදි පෙන්නුවෙ නෑ. ඒකයි ප්‍රශ්නෙ. නැත්නම් අපි එවෙලෙම මේ තීන්දුව දෙනවා. එලෙස අධිභාරවලින් නිදහස් කර ඇති නිලධාරින් හා මියගොස් ඇති මන්ත්‍රීවරුන් හැර ඉතිරි අධිභාරකරුවන් අමතා 2021.07.14 දින නාගරික කොමසාරිස් විසින් අධිභාරගත මුදල සාමූහිකව හෝ වෙන්වෙන්ව හෝ මොරටුව මහා නගර සභාවේ අරමුදලට ඔවුන් වෙතින් අයවිය යුතුව පවතින බව දන්වා යවා ඇත. ඒ කියන්නේ මෙහි මේ නගරාධිපතිවරයා කියල කියලා තියෙන්නෙ අර හිටපු නගරාධිපති. හත්වෙනි එක "ඉන් අනතුරුව මෙම අධිභාර සම්බන්ධව නැවත විමර්ශනයක් සිදු කර අධිභාරගත මන්ත්‍රීවරුන් නිදහස් කිරීමට කටයුතු සලසා දෙන ලෙස

වූ යෝජනාවක් මොරටුව මහා නගර සභාවේ ඒකමතිකව සම්මත වී ඇත. නැවත නාගරික කොමසාරිස් විසින් 2023.06.02 වන හා 2024.07.31 දිනැතිව අධිභාරකරුවන් වෙත අධිභාරගත මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දැනුම් දීම් සිදුකර ඇති නමුදු අධිභාරකරුවන් කිසිවෙකු අධිභාරගත මුදල් මොරටුව මහා නගර සභාව වෙත ගෙවීමට එකඟ වී නොමැත. ඒ අනුව මහා නගර සභා ආඥා පනතේ 226 (6) වගන්තිය යටතේ අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමුවීමට කටයුතු යොදා ඇති බැවින් අධිභාරකරුවන්ට එරෙහිව මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි" කියලා නීති නිලධාරි තමයි මේක ඉදිරිපත් කරලා තියෙන්නේ. අපි කියන්නේ මේ නඩු දාන්න යනවට වඩා මේ හතරවෙනි කරුණ මේ පස්වෙනි හයවෙනි කරුණ අමාත්‍යවරයාට හැකියාව තියෙනවා නම් නිදහස් කරන්න, පළාත් පාලන අමාත්‍යවරයා වෙන්න ඇතිනෙ මේ. මම දන්නෑ කවුද කියලා. මුදල් අමාත්‍යවරයාද? නීති නිලධාරිගෙන් අපි අහන්න ඕන මේ කවුද කියලා. නිදහස් කරන්න පුළුවන් බලය තියෙන ඇමතිවරයාට. මුදල් ඇමතිතුමාටද තියෙන්නෙ? අපිට පුළුවන් මෙය උපුටා දක්වලා නැවත වරක් අපේ මන්ත්‍රීවරුන්ගෙන් අත්සන් අරගෙන ඉල්ලීමක් කරන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න නීති නිලධාරිතුමියට අවස්ථාව ලබා දෙනවා.

<u>නීති නිලධාරි - ටී.සමරරත්න මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කල් ඉකුත්වෙලා තියෙන්නෙ. දින 14 ක් ඇතුලත කියලා තියෙන්නෙ. ඒ නිසා තමයි පළාත් සභාවේ සාකච්ඡා වලත් කියන්නෙ නියමිත කාලයේ අභියාචනයක් කලේ නෑ කියන එක.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, නියමිත කාලයේ අභියාචනා නොකිරීම මන්ත්‍රීවරුන්ගේ වරදක් නොවේ. එය අදාල හිටපු නිලධාරින්ගේ වරද. ඒ නිසා දැන් මන්ත්‍රීවරු අපහසුතාවයට පත්වෙලා තියෙන්නෙ. මම කියන්නෙ දැන් සභා යෝජනාවකුත් තියෙන නිසා මෙහි සම්පූර්ණ විස්තර ටික සහිතව දැනට ඉන්න වර්තමාන අමාත්‍යවරයාට, ඒ කියන්නෙ ජනාධිපතිතුමානේ ඉන්නෙ, ඒ සම්බන්ධයෙන් අදාල දැනුවත් කිරීම කරලා මෙය නිදහස් කරගන්න අවශ්‍ය කටයුතු කලා නම් හොඳයි. මොකද හේතුව මේ ඉන්න මන්ත්‍රීවරු බහුතරයකට මේ අධිභාරය ගෙවන්න සල්ලි නැහැ. නගරාධිපතිතුමා, ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රීවරු විසි දෙකක් ඉන්නවා. එතකොට මේ විසිදෙකෙන් බහුතරයකටම ගෙවන්න සල්ලි නැහැ. දැන් මන්ත්‍රීකම් නෑ. ඒ මිනිස්සු ජොබ් එකක් කරන්නේ නෑ. සමහරු වයසයි. අරගෙන තියෙන්නෙ ලක්ෂ දෙකයි. දැන් ගෙවන්න වෙලා තියෙනවා ලක්ෂ පහකට වැඩිය. තව මන්ත්‍රීවරයෙක් මැරුණොත් ඒකත් එකතු වෙනවා. මෙයට කඩිනම් පියවරක් ගන්න ඕන. ඒ නිසා අපි ඉල්ලනවා මේ ගැන කඩිනම් පියවරක් සභාවේ කතා කරලා ගන්න කියලා. මෙයට සභා තීන්දුවකුත් තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, දැන් මෙහෙම ගැටළුවක් පේනවා. නීති නිලධාරිනිය, දැන් බලන්න මෙම අධිභාරය පැනවෙන කාලයේ, ඒ කාලය තුල සිදුවේච්ච සිදුවීම් පෙලක් තිබෙනවා.

පළමුකොට මගේ දීමනාවෙන් මුළු එකම කැපුවා. තවත් බොහෝ මන්ත්‍රීවරු මුදල් ගෙව්වා. හැබැයි දැන් නීති නිලධාරිනියට ඒක හොයාගන්න බැහැ. ඒවා හොයාගන්න ඕනෙත් නෑ. මම දන්නෑ ඔබතුමියට ලොකු උවමනාවක් තියෙනවද කියලා අපට නඩු දම්මන්න. දැන් මේ පරණ ලියුමකට මේ අළුත් දිනයක් දාන්නෙ. මේ ලියුම අළුත් ලියුමක් නෙවෙයි. මේ ලිපියේ ඇමුණුම 10 සම්බන්ධව අපි නීති නිලධාරිනියගෙන් විමසමු.

**<u>නීති නිලධාරි - ටී.සමරරත්න මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒක අළුතෙන් හැදුවෙ. ළඟදි හදපු එක ඔය තියෙන්නෙ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේක මේ සභාවෙ අවස්ථා ගණනාවකදි ඉතාම තදින් සංවාද කරපු කාරණාවක්. මීට පෙර සමන්ලාල් නගරාධිපතිතුමාට එක අවස්ථාවක ඉතාම තදින් කේන්ති ගියා මට හොඳට  මතකයි. නිලධාරින් ටික තමන් බේරුණා. අපි වෙනුවෙන් ලියන්න ඕන අදාල නිලධාරීන් නෙ. අපි ගෙවීම් කරලා. මට මතක විදිහට අතුල මන්ත්‍රීතුමා ඇතුළු කිහිපදෙනෙක් හිටියා ගෙවීම්  නොකරපු. මෙයයි ඉතිහාසය මේ ආයතනය තුල. මම කියන්නෙ අපිට නීතිය විහිළුවට ලක්කරන්න බැහැ. නමුත් ගෙවපු මන්ත්‍රීවරුන් අධිභාරයට ලක්කරලා නඩු දාන එක සාධාරණ නැහැ. මේ ආයතනයේ හිටපු කොමසාරිස් මල්වැන්න මහත්තයා ලිඛිතව දුන්නා මගේ ගෙවීම් අවසන් කියලා. ඒවා හොයන්න පුළුවන්නෙ මගේ දීමනාවනෙ කැපුවෙ. අතින් ගෙනත් සල්ලි දුන්නත් නෙවෙයි. අපිට යුක්තිය සාධාරණය ඉෂ්ඨ කරන්න නම් නීති නිලධාරිතුමිය අපිට නඩු දාලා අපේ මුදල් ටික ගන්න නෙවෙයි වෙන්න ඕන. සාධාරණය තමයි, අදාල අවශ්‍ය ලිපිලේඛන ටික හොයාගෙන ගිහිල්ලා, අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරමු. එතුමිය දාලා තියෙන මේ ඇමුණුමයි කමිටුවේ නිර්දේශයයි දෙකක්. මෙතුමියගේ ඇමුණුම ඇතුලේ අවසානයේ කියන්නෙ නඩුව දාන්න මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි කියලා. මගෙන් මට විරුද්ධව නඩු දාන්න අනුමැතිය ඉල්ලනවා. නමුත් කමිටුව නිර්දේශ කරලා තියෙනවා අදාල අධිභාර වෙච්ච අය ගෙන්නලා සාකච්ඡා කරන්න. වඩාත්ම හොඳම එය මම හිතන්නේ. අපි එතනට යමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**.

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ 03 අයිතමය සම්බන්ධවයි. ජනසෙත පුස්තකාලය,  මෙය චෝදනාවක් විදියට කියනවා නෙවෙයි. අපේ පුස්තකාල ක්ෂේත්‍රය දැන් කඩාගෙන වැටෙනවා. අද උදේ සුජිත් මන්ත්‍රීතුමා කියපු ඒ කාරණයත් එක්ක, අඹ ටික විකුණනවා නම්, වගකීමක් රහිත පුද්ගලයෙක් දැමීම තුල, කොමසාරිස්තුමියගේ භාරයේ තියෙන පොත්පත් පවා විකුණන්න පුළුවන්. පොතපත ගැන කිසිම දැනුමක් තියෙන කෙනෙක් නෙමෙයි පත් කරලා තියෙන්නේ. එයා පුස්තකාල සහායක කෙනෙක්. අපේ ඉස්කෝලේ සර්ලා එහෙම යනවා පොත් කියවන්න. ලයිබ්‍රේරියන් වුනාම වැදගත් ඇඳුමකින් සැරසී සිටිය යුතුයි. නගරාධිපතිතුමා ගරුත්වය තියන්න ඕන නැත්නම් මේවා කඩාගෙන වැටෙනවා. ඔබතුමා විශ්වාස කලා සී.පී.එච්.අයි. යසන්තව. යසන්ත අන්තිමට පල්හොරෙක් බවට පත්වෙලා දැන් කොළඹට ගියා. ඔබතුමා විශ්වාස කරපු කට්ටිය තමයි ඔබතුමාව වට්ටන්න හදන්නෙ. දැන් ටී.එල්.සී.පුස්තකාලය ගත්තම මොකුත්ම කරන්න බැරිවුනා. ඒ නිසා හොඳ ලයිබ්‍රේරියන් කෙනෙක් ගෙන්නනන්න. මම හිතන්නෙ මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් ගෙන්නලා එම තනතුරේ කෙනෙක්ව තියන්න. මොරටුව මහා නගර සභාව දෙවනි උනේ යාපනය පුස්තකාලයට පමණයි. යාපනය පුස්තකාලය එක අපි දෙක. දැන් අනිත් පැත්තෙන් එකද දන්නෙත්

නෑ. හොඳ කෙනෙක් පත්කරලා මෙය විධිමත් කරන්න ගරු නගරාධිපතිතුමා. නැත්නම් කෝටි ගණන් වියදම් කරලා හදපු පුස්තකාල ටික අභාවයට යනවා. ඔබතුමා විශ්වාස කරලා මිනිස්සු පත්කලාට, මිනිස්සු වැඩ කරන්නේ නෑ. පොතපතේ දැනුමක් නැති මිනිස්සු ඉන්නෙ. ඒ නිසා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා මෙතනට හොඳ කෙනෙක් දාන්න. නැත්නම් අපේ පොත්පත් ටිකත් විකුණලා දායි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කොමසාරිස්තුමියගෙන් මහා නගර සභා ආඥා පනතේ මට මතක විධියට 72 වගන්තිය යටතේ මම ඉල්ලීමක් කලා කලි02/මග102/2013, කලි02/මග/62/2013, කලි02මග86/2013, කලි02මග110/2013, කලි02මග115/2013, කලි02මග/135/2013, කලි02මග/71/2013, කලි02මග/91/2013, කලි02මග/52/2013, කලි02මග/46/2013, කලි02මග/59/2013, කලි02මග/65/2013, කලි02මග/131/2013, කලි02මග/74/2013, කලි02මග/121/2013 කියන මේ ලිපි ගොනු ටික මට පරීක්ෂා කිරීමට අවශ්‍යයි කියලා මම ඉල්ලීමක් කලා. හැබැයි ම ඊට පස්සේ ලැබුණ පිළිතුර තමයි ඒ ලිපිගොනු නගර සභාව සතුව නැහැ. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනවා.මේ ලිපි ගොනු සමාන්‍යයෙන් කුමන හෝ ආයතනයකින් ගෙනියනවනම්, අපි දන්න විදිහ තමයි එකේ පිටපතක් නගර සභාව සතුව තියන්න ඕන. අපි දන්නේ නැහැ මේ හිටපු කොමසාරිස්වරිය හෝ වරයා මේ ලිපිගොනු නිදහස් කරනකොට කිසිදු ලේඛනයක් තමන් සතුව තියා ගන්නේ නැතුව ලිපි ගොනු නිදහස් කරන්න ඕන. එතකොට අපිට ප්‍රශ්නයක් පැන නඟිනවා හදිසියකදී අපේ මොරටුවේ මහා නගර සභාව හැටියට ලිපි ගොනුවක් පරික්ෂා කර ගන්නේ කොහොමද කියන ගැටළුව අපිට පැන නගිනවා. අනිත් එක තමයි මේ ලිපි ගොනු ගෙනියලා මේ ලිපිගොනු සම්පූර්ණයෙන්ම නිවැරදිව තියෙනවද කියන වගකීම කවුද ගන්නේ. ඉතින් මේක තනිකර කොමසාරිස්වරයා සතු වගකීමක් ඒ නිසා හිටපු කොමසාරිස් කවුරු හෝ මම දන්නේ නැහැ කවුද හිටියේ කියලා. කවුරු හෝ ඒ වගකිම පැහැර හැරලා තියෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා නගරාධිපතිවරයා හැටියට නියෝගයක් දෙන්න. එහෙම නැත්නම් මම දන්නේ නැහැ මොකද්ද කරන්න ඕන, මීට පස්සේ කවුරු හෝ ගරු අධිකරණයට ලිපිගොනුවක් ගෙනියද්දිත් සීල් කරලා තමයි අරන් යන්න ඕන. මේ ෆයිල් ගෙනියලා තියෙනවා. මගේ පෞද්ගලික අවශ්‍යතාවයකට මම පරික්ෂා කරලා බැලුවා ෆයිල් ටික හොයාගන්න බැරි වුනා. ඒ නිසා කරුණාකරලා මීට පසුව යම් ලිපිගොනුවක් අරගෙන යනවනම් ඒ ලිපිගොනුවේ පිටපතක් නගර සභාව තුල තියලා නිදහස් කරන්න කියලා නාගරික කොමසාරිස්වරියට කියන්න. නැත්නම් අපි ලොකු අපහසුතාවයකට පත්වෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙතුමා කියපු ලිපිගොනු සම්බන්ධව අදහසක් කොමසාරිස්තුමියට තියෙනවද? අල්ලස් එකට යනකොට ඒ ලිපිගොනුවේ පිටපතක් අපි ලඟ තියා ගන්නේ නැද්ද, තියාගන්න බැරිද? මන්ත්‍රීතුමා මේක ඉතාම නරක තත්ත්වයක්. 2015 ෆයිල් 115කට වඩා ප්‍රමාණයක් අල්ලස් එකට අරන් ගිහින් තියෙනවා. අපිට අඩුම තරමේ ලිපිගොනුවේ පිටපතක් තියාගන්න ඕනේ. ඉතාම බරපතල තත්ත්වයක්. නීති නිලධාරිනිය, අපිට මීට අදාල ක්‍රියාමාර්ගයක් මුකුත් ගන්න බැරිද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා.**</u>

ගරු නගරාධිපතිතුමනි, අල්ලස් එකට ගෙනියපු ෆයිල් ලක්ෂ ගානක් ඇති. මේ වගකීම කවුද ගන්නේ? ෆයිල් කොපමණ ගෙනිච්චද කියලා කවුද දන්නේ? අපේ ෆයිල් ඇතුලේ තියෙන දේවල් වලට මොකද වෙන්නේ?

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.**</u>

මහා නගර සභා මන්ත්‍රීවරුනි, ගෙනියපු ෆයිල් වල ලියුමක් අපිට භාර දීලා තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා.**</u>

ගරු නගරාධිපතිතුමනි, එතකොට ෆයිල් ඇතුලේ තියෙන දේවල් වලට මොකද වෙන්නේ? වගකීමෙන් කියන්නම් මේ දවස් වල අල්ලස් එකේ ඉන්න නිසා. ෆයිල් අරන් පෙන්වනවා. අපේ සභා වාර්තාත් පෙන්වනවා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි ඉක්මන් ලිපියකින් දැනුම් දීමක් කරලා ෆයිල් ටික ගෙන්න ගමු. එවෙලාවේ බය වෙලා හිටපු අය අල්ලස් එකෙන් ඇවිල්ලා ඉල්ලපු ගමන් ඔක්කොම ටික දීගන දීගන ගියා. පොඩි වෙලාවක් ගන්න ඕනෙනේ. අද මට එන්න කිවුවේ අල්ලස් එකෙන්. මම කිවුවා අද එන්න බැහැ මට වෙන දිනයක් දෙන්න කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, 02(2) කරුණ සම්බන්ධවයි. මේ Gov Pay එකට සම්බන්ධ කිරීම 2025.11.03 වෙනිදා රජය විසින් නිකුත් කරලා තියෙනවා ප්‍රවෘත්තියක්. ආයතන 200 ක් මේ වෙනකොට සම්බන්ධ කරලා තියෙනවා. රජයට බිලියන් එකකට වඩා ආදායම් ලැබිලා තියෙනවා මේ Gov Pay Platform එක හරහා. එතකොට දැනට සිස්ටම් එකක් තිබුණට ඒ සිස්ටම් එකයි මේකයි දෙකම ඉන්ටිග්‍රේට් කරන්න පුළුවන්. මම හොයලා බැලුවා. මේ ඩිජිටල්කරණය ගැන කතා කරන්නේ. ඔබතුමා මේ අවස්ථාවෙ ෆයිල් ගැන කතා කළා. මම කතා කරනවා මෙහි අයිතමය 06 වෙනි කොටස ගැනත්. එහි තියෙනවා ඔබතුමාලා මීටිමක් තිබ්බා කියලා තාක්ෂණික තොරතුරු සම්බන්ධයෙන්. ආයතනය ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන්. මම මෙය හැමදාම කතා කරනවා. අපි මේ සම්බන්ධයෙන් මීට වඩා උනන්දුවෙන් කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරන්න කැමතියි. ඩිජිටලයිස් නම් මේ ෆයිල් ආර්චයිව් කරන්න. ඒවා සේව් කරන්න පුළුවන්. අපි රටක් හැටියට ඉස්සරහට යන්න ඕන. ආයතනයක් හැටියට ඉස්සරහට යන්න ඕන. මේ Gov Pay එකට සම්බන්ධ කරන්න වියදමක් යන්නේ නැහැ. ඇග්‍රීමන්ට් එක අත්සන් කරලා දෙන්න විතරයි තියෙන්නේ. ඒගොල්ලන්ට අපේ සිස්ටම් එකත් එක්ක ඉන්ටිග්‍රේට් කරන්න පුළුවන්. මම ඉල්ලීමක් කරනවා මේවා නිලධාරීන්ට කියලා ඉක්මනට ක්‍රියාත්මක කරන්න කියලා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සාකච්ඡාවක් කළා. එහි වාර්තාව මීළඟ කමිටුවට එන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මාසෙකට පාරක් මෙතනට එනවා. කොළ ගණන් වාර්තා එනවා. වාර්තා වල දාන්නේ නැහැ කවදද මේවා ක්‍රියාත්මක කරන්නේ කියලා. ජනතාවගේ මුදල් වලිනුයි අපි හැමෝම මෙතන ඉන්නෙ. කිසිම තේරුමක් නැහැ. අපි කාටද මේ කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි ඉහත සාකච්ඡා කළ පරිදි ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ අංක 02(04) දරණ නිර්දේශය සඳහන් නිල ඇඳුම් දීමනාව, කණ්ඩායම් අංක 01 හි සඳහන් තනතුරු සඳහා රු.9,000.00 ක් ලෙස හා කණ්ඩායම් අංක 02 හා 03 හි සඳහන් තනතුරු සඳහා රු.12,000.00 ක් ලෙස සංශෝධනය කිරීමට යටත්ව ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා ඡන්දය විමසනවා.

**2025.10.14 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(04) දරණ කරුණ ඒකමතිකව සහා සම්මත වූ අතර, එම කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2025.10.14 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(04) දරණ කරුණ ඒකමතිකව සහා සම්මත වූ අතර එම නිර්දේශය හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |

7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2025.10.14 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ අංක 02(04) දරණ කරුණ ඒකමතිකව සභා සම්මත වූ අතර එම නිර්දේශය හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මෙම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා)

**06(4) 2025.10.15 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ තියෙනවා තුන්වෙනි කරුණේ කොඩිබට සම්බන්ධව ඒකෙ තියනවා දැනට රාජ්‍ය ආයතන ආගමික පූජනීය ස්ථාන පාසල් වලට නොමිලේ කොඩිබට 25 ක් ලබාදීමට සිදු කෙරේ. ඊට පස්සේ කියනවා උක්ත කරුණු සලකා බැලූ කමිටුව ඉහත රාජ්‍ය ආයතන ආගමික පූජනීය ස්ථාන පාසල් වලට නොමිලේ කොඩි කණු 15ක් පමණක් උපරිම වශයෙන් දින තුනක් සඳහා ලබාදීමට නිර්දේශ කරන ලදී. සාමාන්‍යයෙන් කොඩි කණු 25ක් කියලා කියන්නේ ඒක අත්‍යවශ්‍ය දෙයක් පාසලක්, පන්සලක්, පල්ලියක් කියලා කියන්නේ සාමාන්‍යයෙන් ලොකු උත්සවයකටනේ කොඩි කණු ගහන්නේ ඉතින් කොඩි කණු පහළවක් ගහලා ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මොකද ඒකෙන් කාටවත් හානියක් වෙන්නේ නැහැ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේකෙ තියෙන්නෙ මෙහෙමයි 25 ක් නොමිලේ දෙන කියන එකට තීන්දුවක් අරගෙන තියෙන්නෙ මීට කලින්, එතකොට සමහරක් වෙලාවට අපි මේ කොඩි විසිපහක් ගහන්න යන්නේ කොඩි දහයක් විතර ඇති තැනකට හැබැයි අර විසිපහක් නොමිලේ ගහන්න පුළුවන් නිසා එතන පහළොවක් ගහන්න කියලා කියනවා. මේක මේ අපි ප්‍රායෝගිකව මුහුණ දීපු ගැටළුවක්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි කාටවත් කියන්න ඕන නැහැනේ 25ක් ගහන්න පුළුවන් කියලා. අපි හැම තැනටම 25ක් ගහන්න ඕනෙත් නැහැ නමුත් විසිපහ තියලා එක්කෝ මේකට නිර්දේශයක් දාමු විසිපහට යටත්ව අදාළ නිලධාරියාගේ අනුමැතිය පරිදි ගහන්න කියලා. එතකොට නිලධාරියා තමයි

තීන්දු කරන්න ඕනේ කීයක් ගහනවද කියලා. එහෙම තීන්දුවක් ගත්තනම් හොඳයි මේක මේ කොඩ් කුණු පහළොවකට අඩුකරනවට වඩා එහෙම උනොත් එහෙම අපිට 25ක ඕන තැනකදී නිකන් ඉන්න වෙනවා එතකොට ඉතුරු ටික ගහගන්න කියන්න වෙනවා. ඒ නිසා 25 තියලා ඕනි නම් දාමු නිලධරයෙක්ගෙ නිර්දේශය මත තීන්දු කරන්න කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම අපිට සමහර තීන්දු වල ඉන්න බැරිවෙනවා මෙන්න මේ අවස්ථාව දැන් මේ ගමන මට හුභාක් තදටම දැනිච්ච එක තමයි එකවර පන්සල් ගොඩකින් ඉල්ලනවා. අපි ළඟ තියෙන්නෙ දෙසීයයි සමහර පන්සල් සතිය දෙක තියාගන්නවා. ඒනිසා දින තුන කරමු. අවශ්‍යතාවය සලකා අංක 03 කරුණ පහත පරිදි සංශෝධනය කරමු.

**රාජ්‍ය ආයතන, ආගමික, පූජනීය ස්ථාන, පාසල් වල අවශ්‍යතාවය සළකා බලා නොමිලේ උපරිමය කොඩ් බට 25 ක් වන පරිදි දින 03 ක කාලයක් සඳහා ලබාදීමට තීරණය කරන ලදී.**

**ඒ අනුව 2025.10.15 දිනැති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03 ඉහත පරිදි සංශෝධනය කිරීම ඒකමතිකව සභා සම්මත විය.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, හතර වෙනි කරුණ ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරී විසින් 2025.10.15 දින ඇතිව කමිටුවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණු සලකා බැලීම. නාගරික පශු වෛද්‍ය දෙපාර්තමේන්තු භූමියේ අපද්‍රව්‍ය දැමීම සම්බන්ධවයි කියලා තියෙනවා. මේකේ පොඩි වරදකුත් තියෙනවා හතරවෙනි ඡේදයේ මේ හේතුවෙන් දැඩි දුර්ගන්ධයක් කියලා තියෙන්නේ. ඒක දුර්ගන්ධයක් වෙන්න ඕනෙ නාගරික පශු වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටා ඇති භූමියේ කටුබැද්ද කලාපයෙන් එකතු කරන අපද්‍රව්‍ය දමන අතර අපද්‍රව්‍ය වර්ග කිරීමද සිදුවේ. එතකොට මේ අපද්‍රව්‍ය වර්ග කරන්නේ ඇයි දන්නේ නෑ නේද දැන් සාමාන්‍යයෙන් අපද්‍රව්‍ය අපි ගන්නකොටම වර්ග කරලනෙ ගන්නේ එතකොට මේවා වර්ග කරන්නේ ඇයි? අපිට තියෙන ප්‍රශ්නය ඒකයි. පාරේ කුණු කියලා කියන්නේ අපි අතුගාන කුණු ටිකනේ, ඒ ටික විතරක් නෙමෙයි මෙතන දාලා තියෙන්නේ පාරේ අතුගාන කුණු ලොකු ප්‍රමාණයක් එකතු වෙන්නේ නැහැනේ. එතකොට පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවේ විසින් දිනපතා මස් පරීක්ෂාව සිදු කරන බැවින් මෙම ගැටළුව නිසා මස් පරීක්ෂාව සිදු කිරීමට මේ පරිසරය සුදුසු නැත මේ හේතුවෙන් දැඩි දුර්ගන්ධයක් හමන අතර මැස්සන් බෝවීම ශීඝ්‍රයෙන් සිදුවෙන නිසා කාර්යය මණ්ඩලයට සහ පැමිණෙන මහජනතාවට ද ප්‍රශ්න වලට මුහුණ දීමේ අවදානමක් ඇත. මේ අවදානමම තමා සොයිසාපුර තියෙන්නේ. මේ තියෙන්නේ පශු වෛද්‍ය කාර්යාලය ලඟ. සොයිසාපුර එහා පැත්තෙ තියෙන්නේ ක්ලිනික් එක මාතෘ සායනය ඩෙන්ටල් එක, එතකොට ඒ මිනිස්සුන්ව මැස්සො කන්නේ නැද්ද. අපි සාමාන්‍යයෙන් තැන් තැන්වල කරේ නැහැ. දැන් මේ පටන් අරගෙන තියෙන්නේ තැන් තැන්වල කුණු වර්ගීකරණය කරන්න අපි කලේ වර්ගීකරණය කළ කුණු මිනිස්සුන්ගෙන් අරගෙන ඒක ගෙනැල්ලා බාරදෙන එක විතරයි. මෙතනට දැන් වෙලා තියෙන්නෙ සොයිසපුර වෙනම කටුබැද්දෙ පශු වෛද්‍ය කාර්යාලට හානියක්, එතන පරිසරය දූෂණය වෙනවා. සොයිසාපුර දූෂණය වෙනවා මොකද හේතුව එතන වටේම තියෙන්නෙ පැලැට්ස් එහා පැත්තෙ පන්සලක් තියෙන්නේ හාමුදුරුවෝ මැසිවිලි නඟනවා පන්සලේ දැන් මැස්සො වැඩිවෙලා කියලා. මෙහෙන් ක්ලිනික් එකට එන මිනිස්සු ලොකු අපහසුතාවයකට පත්වෙනවා ඒ නිසා අපි කියන්නේ ඔබතුමාට කරුණාකරලා මේ වැඩේ නතර කරවන්න. අපේ සේවකයන්ට උපදෙස් දෙන්න කුණු ගන්නකොට වර්ග කරලා ගන්න කියලා. කලින් කරපු විදියටම කරගෙන යන්න කියන්න වර්ග කරන්නට බැරි හේතු තියෙන ඒවා

කොහොමත් අපි ගිහිල්ලා කරදියන්නට දානවනේ ඒ නිසා තැන් තැන්වල මේ කුණු වර්ග කරන එක නතර කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, 05 කරුණ හොඳ යෝජනාවක් දාලා තියෙනවා මේ ශාන්තිනී වල්ගම ගරු මන්ත්‍රීතුමිය පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින් මොරටුව පාසල් මට්ටමෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කියලා තමයි එතුමිය දාලා තියෙන්නේ මම හිතන්නේ යෝජනාව දානකොටම දැම්මම හරි මොකක්ද වැඩසටහන කියලා හැබැයි පාසල් සමග එකතුවෙලා වැඩ සටහන් සංවිධානය කරනකොට ඒකට වෙනම ක්‍රමවේදයක් තියෙනවා ඒ ක්‍රමවේදයට මේ දරුවන් ට තරග පවත්වන්න ඒවා දරුවන්ගේ දැනුම මිනුම චිත්‍ර තරග පවත්වන ඒවා ඒවගේම දේශන වගේ දේවල් සංවිධානය කරන්න පුළුවන් ඉතාමත් හොඳයි මේ යෝජනාව ඒ තුළින් දරුවෝ දැනුවත් කරන්න පුළුවන් දරුවාන් දැනුවත් කරන එක ඉතාමත් යෝග්‍යයි හැබැයි මේක පිළිවෙලකට කරන්න ඕනේ. දැන් මේකේ අවසානයේ තියෙන්නේ උක්ත කරුණු සලකා බැලූ කමිටුව මේ සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකට පැවරීමට නිර්දේශ කරන ලදී. මේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක කියන තනතුරට තියෙන වැඩත් එක්ක මේකට සුදුසු වැඩපිළිවෙලක් සංවිධානය කර ගන්න පුළුවන් කමක් තියෙයිද කියලා මං දන්නෙ නෑ මේක මේ මාස ගානක් ඇදි ඇදී තියෙයි නමුත් මේ යෝජනාව හොඳ යෝජනාවක් ඵලදායී යෝජනාවක්. පුළුවන් තීරණයක් ගන්න අනිත් එක මේක සෞඛ්‍ය කමිටුවට එන්න ඕන එකක් නෙමෙයි මේක මහජන උපයෝගීතා කමිටුවට එන්න ඕන එකක් සෞඛ්‍ය කමිටුවට මොකටද මේ වගේ එකක් එන්නේ? ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක දීලා හරියන්නෑ මේක ඒ නිසා මේක කමිටු දානකොට හරි කමිටුවලට දාන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනි වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, පරිසර සම්බන්ධ කරුණක් නිසා තමයි පරිසර කමිටුවට ඉදිරිපත් කරේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පරිසර සෞඛ්‍ය නෙමෙයි මේක මහජන උපයෝගීතා කමිටුවට තමයි එන්න ඕනේ ඒගොල්ලෝ තමයි පාසලත් එක්ක සම්බන්ධ වෙලා මේ වැඩේ කරන්න පහසු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුදේශ් ඉන්දුජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ සම්බන්ධයෙන් මට පැහැදිලි කිරීමක් කළ යුතුයි. සෞඛ්‍ය කමිටුව සහ විශේෂයෙන්ම මේ සොයිසපුර සම්බන්ධයෙන් සහ කටුබැද්ද කාරණාව සම්බන්ධයෙන් අපි කිසිසේත්ම කියලා නෑ මේ කලාප වල කසල ගොඩ ගහන්න කියලා, කසළ වෙන් කරනවා මේ වෙනකොට අපිට වාහන අර්බුදයක් තියෙනවා එතකොට සේවක අර්බුදයක් අපිට තියෙනවා. ඊට පස්සේ අපි ගොඩක් වෙලාවට කියලා තියෙන්නේ නොදිරන කසල යම් නිසි ක්‍රමවේදයකට ජනතාව දෙන්නේ නැති ටික ජනතාව වෙන් කරලා දෙන ටික අපි ආයතන වෙන් කරන්නේ නැහැ. ජනතාව වෙන් කරලා දෙන්නේ නැති ටිකක් තියෙනවා අපේ වගකීම කසල එකතු කරන එක අපිට ජනතාව වෙන් කරලා නෑ කියලා කසල ටික දාලා එන්න බැහැ ඒ නිසා අපි හැම වෙලාවෙම කසල ටික එකතු කරනවා. එකතු කරලා ඒක අපි දැන් සොයිසපුර ගත්තත් තාම අපි නිශ්චිත ලෙස ආරම්භ කරේ නැහැ ඔය දවසක් දෙකක් ප්‍රමාද වෙනවා තියෙන වාහනය සහ ඒ සේවක ප්‍රශ්න නිසා නැත්නම් අපි කිසිසේත්ම එතන කසල දින ගණන් තියන්නේ නෑ. එතකොට ඒ ආදායම් ලබන්න පුළුවන් කසල ටික අපි එතන නැවත ජනතාව විසින් වෙන් නොකරන කසල නැවත එතන වෙන් කරලා ඒ වෙන් කරන කිරීම ඇතුලේ තමයි අරන් යන්නේ සමහර ඒවා තියෙනවා අපේ වාහනේ ආපු ගමන් ඒ පිටින්ම දානවා අපිට වෙන් කරන්න බැරි ඒවා

ටික නමුත් අපි දින ගණන් තියන්නේ නැහැ ක්ලිනික් එක තියෙන්නේ ඊට වඩා ගොඩක් එහා අනිත් එක ක්ලිනික් එකට එහෙම ලොකු බලපෑමක් වෙනවා කියලා කලාපෙට නම් එහෙම කම්ප්ලේන් එකක් ආවේ නැහැ විහාරස්ථානයේ හාමුදුරුවන්ගෙනුත් මේ දක්වා අපිට එහෙම දෙයක් ආවේ නැහැ ආවනම් අපි සැලකිල්ලට ලක් කරනවා අපි දැනුම් දීලා තියෙන්නේ කසල රඳවන්න එපා එතන හැබැයි ඒ වර්ගීකරණය කළ යුතු කසල, ජනතාව වර්ගීකරණය නොකරන කසල අපි විසින් නැවත වර්ගීකරණය කරන ඒක අපේ වගකීම කසල ටික එකතු කරල දෙන්න අවශ්‍යයිනේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම සුදේශ්මන්ත්‍රීතුමාට බාධා කරනවා නෙමෙයි මේ කසල වර්ගීකරණය කරන්න අරගෙන ගොඩක් කල් වෙනවා ජනතාව පුරුදු වෙලා හිටියා මම දන්නෙ නෑ කොමසාරිස් පාලනයේදී කොහොම වුණාද කියලා. විපක්ෂ ඉන්නකොටත් අපි දැකපු දේ තමයි ජනතාව පුරුදු වෙලා හිටියා මේ කුණු ටික වෙන් කරලා දෙන්න අපේ නිවාස වල දැනටත් සතියකට එක දවසයි එන්නේ ඉඳුල් ගෙනියන්න හැබැයි ඉතින් ඒක පණුවෝ ගැහුවත් මොනවා උනත් අපි ඒක තියාගෙන ඉන්නවා. මොකද ඉඳුල් ටික හරියට දැම්මේ නැත්නම් එහෙම ගෙනියන්නේ නැහැ සේවකයෝ. ඒක අපිටත් එකයි අනිත් අයටත් එකයි හැබැයි අපේ පැතිවල ඒක එහෙම වෙන්නයි තව පැත්තක ඒක නොවෙන්නයි එහෙම බැහැ. ඒ නිසා කරුණාකරලා මේ තැන් තැන්වල කසල වෙන් කරන කතන්දර තියාගන්න එපා ඒ නිසා අපි කියන්නේ ඔබතුමාට කසල වෙන් කිරීම ට්‍රැක්ටර් වලට එක එක දවස් දීල තියෙනවා ඒ ඒ දවස්වලට වෙන් කිරීම් කරලා තියෙනවා ඒව ඊට පස්සේ කෙලින්ම ගෙනල්ලා බාන්න විතරයි තියෙන්නේ. සමහර දවස්වලට අපි දන්නවා කසල වෙන්කරනවා කියලා වෙන් කරන තැන්වල නගර සභාවට එන්න ඕන කසල ටික වෙන වෙන තැන් වලට යනවා බෝතල් පත්තර කඩවලට යනවා. ඉතින් එහෙම තැනකට ගියාම අපිට ලැබෙන්න තියෙන ආදායමක් අහිමි වෙනවා. අපේ ප්‍රශ්න තියෙනවා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ කසල වෙන් කරලම ගන්න කියලා කියන්න. ගන්න බැරි කසල තියෙනවනම් ඒ ගන්න බැරි විශේෂ හේතු මොනවා හරි තියෙන්න පුළුවන්නේ ඒ ටික විතරක් කරදියානට ගිහිල්ලා දැන් බලන්න ඔබතුමා කරදියානට කොච්චර ගෙවනවද කියලා දැන් මේ සැප්තැම්බර් මාසේ මුදල් කමිටුවේ තියෙනවා විසිනම ලක්ෂයක්. ඒ කියන්නේ තිස් ලක්ෂයක් අපි ගෙවලා. එතකොට දැන් අපි ඒ කාලේ උපරිම ගාන ගෙව්වේ, මෙය ආරම්භ කරාට පස්සේ ලක්ෂ දහතුනක් වගේ ගානක් තමයි. ඒකත් අඩුවෙන් තමයි අපි ගියේ. එතකොට ලක්ෂ 29ක් ලොකු මුදලක්. දැන් මම කියන්නේ අපිට පොඩි කෘෂර සතුටක් විඳින්න පුළුවන් දැන් වැඩියෙන් ගෙවනවා හොඳයි කියලා. නමුත් ඒක නෙමෙයිනේ. ඒක පුරුදු උනොත් එහෙම මොන පාලනය ආවත් මේක ආපහු හදන්න බැහැ ඒ නිසා අපි ඔබතුමාට කියන්නේ මේක දේශපාලනය නෙමෙයි මේක කාගෙද අඩුපාඩුව කියන එක නෙමෙයි අපි අර පුරුදු කරගත්තු දේ වල් අපි කරගෙන යමු ඉස්සරහට එහෙම නැත්නම් මොන පාලනය ආවත් ජනතාව ආපහු පුරුදු උනොත් එහෙම කලවම් කුණු දෙන්න එහෙම උනොත් එහෙම අපිට කරදියන්නට බාගන්නත් බැරි වෙනවා. ඔබතුමා දන්නව කරදියානට බාන්න ගියහම වෙන ප්‍රශ්න. කරදියන්නට බාගන්නත් බැරි වෙනවා ඊට පස්සේ අපි ලොකු අපහසුතාවයකට පත්වෙනවා. දැන් කානුපස්ටික දාන්න තැනක් නැතුව අපි අපහසුතාවයට පත්වුණා වගේ ඊට පස්සේ කුණු ටික දාන්නත් තැනක් නැතුව අපි ලොකු අපහසුතාවයකට පත් වෙනවා මොකද මට වඩා අත්දැකීම් ඔබතුමාට තියෙනවා කුණු දාන්න ගිහිල්ලා අපහසුතාවයට පත්වෙච්ච තැන්. රවිනාත් ගුණසේකරගේ කාලේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුදේශ් ඉන්ද්‍රජිත් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මට අවස්ථාව දෙන්න නැත්නම් වැරදි මතයක් සමාජගත වෙනවා අපි කොහෙවත් ඉඳුල් නම් ඒ තැන්වල රඳවන්නේ නැහැ ඉඳුල් පටව ගත්තා කරදියානෙට ගිහිල්ලා

එවෙලෙම දානවා. ඉඳුල් සම්බන්ධ කිසි ගැටලුවක් නෑ කොහෙවත්. මේ සිද්ධ වෙන්නේ දැන් එතුම සඳහන් කරන්නේ එතුමලාගේ කාලයේ ලක්ෂ දහතුනයි කියලා වෙන්න පුළුවන් දැන් පහුගිය කාල පුරාවට ඔබතුමා දන්නවා අපි විශාල කානු ප්‍රමාණයක් සුද්ද කරා අපි කසල එකතු කරන්න පටන් ගත්තා විශාල වශයෙන් ඒක කසළ දැන් අපි මේ වෙනකොට අපේ මධ්‍යස්ථානයට ක්‍රමානුකූලව අපි එක රැගෙන එන ගමන් ඉන්නේ ඒක තවත් පහසු කරන්න අපි යම් ජනතාව වෙන් නොකරන සමහර දේවල් අපිට ජනතාව වෙන් කරන්නේ නැහැ කියලා කුණු ගන්න එක ප්‍රතික්ෂේප කරන්න බැහැ. අපි ජනතාව දැනුවත් කරමින් ඉන්නවා ඒගොල්ලන්ට අපි අවබෝධය දෙනවා නමුත් ඒ කිච්චත් තවමත් එහෙම තමයි සමහර තැන්වල පාරවල්වල කලවම් කුණු විසික් කරලා යනවා. ඒවා එකපාරට අපිට හදන්න බැහැ නමුත් අපිට ඒක ප්‍රතික්ෂේප කරල පැත්තකට දාලා එන්න බැහැ අපි එකතු කරනවා එකතු කරලා අපේ සේවකයෝ යොදවලා අපි එතන යම් ප්‍රමාණයකට වෙන්කර ගන්නවා. ඒක අපි දවස් ගණන් තියන්නේ නැහැ අපිට අවශ්‍යයි දැන් මේ වෙනකොට අපි පහුගිය මාස කිහිපය ඇතුළත ලක්ෂ විස්සකට අධික ආදායමක් බේල් එකෙන් අපි ලබලා තියෙනවා දැන් ක්‍රමානුකූලව මේ බඩු ටික බේල් එකට එනවා දැන් අපි ගැනුම්කරුවන් රේජිස්ටර් කරලා කොටේෂන් අරගෙන තව සුමානයක් යනකොට ඒ ගැනුම්කරුවොත් එක්ක ගිවිසුමකට යනවා භාණ්ඩ පහළවකට වැඩි ප්‍රමාණයක් ඒගොල්ලෝ මිලදීගන්න සූදානම් වෙලා තියෙනවා. අපි යම් ක්‍රමානුකූල ක්‍රමවේදයකට මේක කරගෙන යනවා අපිට වුවමනාව තියෙනවා කලාප වල ජනතාවට ඒ අයට ලේසිය වෙන විදිහට නොදෙන කසල ගෙනත් දීලා යමක් ඔබතුමාගේත් යම් අදහසක් තියෙනවා අපේ නොදෙන කසල ජනතාවට වෙන්කරන්න උගන්වන ගමන් කසල පාර තැන් තැන්වලට නොදා ඉන්න මට්ටමට අපේ අයගෙන් යම් මිලදී ගැනීමකට හරි ගන්න වැඩපිළිවෙළකුත් හදමින් යනවා. අපි ඒ වගේ පොඩි ආදර්ශමත් වැඩ කිහිපයකුත් කරා ඒ නිසා කියන්න කැමතියි අපි මේ ආපස්සට යෑමක් නෙමෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරීම ඉතා වටිනවා කර්මාන්ත කමිටුවේ සභාපතිතුමා එතුමා සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමා රංගන මන්ත්‍රීතුමා. වටිනවා ඉතින් කමිටුවෙන් මතුවන ප්‍රශ්නය අපි හදාගත්තු ක්‍රමවේදයක් අනුව එතුමා තමයි මේ ගැටළු ටික මතු කරන්න ඕන. කාරීකත්වය හා දක්ෂතාවය වෙනයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සමහර ප්‍රශ්නවලදී අදාළ වෙන්නේ මන්ත්‍රීතුමා ඒ නිසා තමයි මේ ප්‍රශ්න වලට සුදේෂ් මන්ත්‍රීතුමා කතා කළේ. අපි මෙය ඔක්කොම සම්බන්ධවෙලා සාමූහිකව කරන්නේ. මම සභාහපති උනත් අපි දෙන්න සම්බන්ධ වෙලා තමයි මේක කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සභාවේ කාලය අපතේ යනවා. මේක අපේ කණ්ඩායම් විසින් බේරගත යුතු එකක් සභාපති උත්තර දෙන්නේ නැත්නම් මොකද සමහර වෙලාවට සභාපතිට වඩා ප්‍රශ්නෙට මැදිහත් වෙන්න පුළුවන් කෙනෙක් ඉන්නවනම් මැදිහත් වෙයි. සභාහපතිම උත්තර දෙන්න ඕන කියලා කොහෙවත් සඳහනක් නැහැ. සභාපතිට උත්තර දෙන්න පුළුවන් නම් හොඳයි. හැබැයි සභාපති අපහසුතාවයට පත්වෙන්නේ නෑ හැමතිස්සෙම සභාපතිගේ අවබෝධය හදමින් තමයි සමහර ඒවා අපි කරන්නේ. මන්ත්‍රීතුමා තව කාරණයක් කාලේ ගන්න එපා. මෙතුමා මේ කියන එක ඇතුලේ පිළිගත යුතු එකක් තියෙනවා. පශු වෛද්‍ය කාර්යාලය ළඟ එතන කසල වෙන් කිරීම කරන එක නෙමෙයි මෙතන අනවශ්‍ය විදිහට ලොකු කාලයක් කසල ගෙනත් දාලා තියන් ඉන්නවා. ඒ නිසා

ඒක වහාම ඉවත් කරන්න ඕනේ වගේම ඉතා ඉක්මනින් සෞඛ්‍ය කලාප කාර්යාලය හදන එක කරන්න ඕනේ පශු වෛද්‍ය කාර්යාලය ඉදිරිපිට නිරන්තරයෙන්ම කුණු ගොඩක් තියෙන එක හොඳ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි දිගින් දිගටම දැනුවත් කරලා තියෙනවා මෙතන කුණු තියන්න එපා කියලා නමුත් ඒක කරනවා මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්න සිදුවෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි සොයිසාපුර දීර්ඝ කාලයක් වාසය කරන පුද්ගලයෙක් හැටියට මට වැඩි අයිතියක් තියෙනවා සොයිසපුර ගැන කතා කරන්න මමත් මේ දකින දේ තමයි කුණු එකතු කිරීම අපේ වගකීමක් ඒක ඇත්ත නමුත් සොයිසා පුර නිවාස සංකීර්ණය කියන්නේ මොරටුව නගරයේ ආසන්නයේ ඉතාම වැදගත් ගමක් ප්‍රසිද්ධ තැනක්. ඒ වගේ තැනක මෙච්චර කල් නැති කුණු ඔක්කොම එකට ගෙනල්ලා එතන තෝරන එක මෙච්චර කල් කෙරුනේ නැහැ . අනිත් එක පරිසරය විනාශ කරන්න එපා. එතනට ගෙනල්ලා කුණු වර්ගීකරණය කරන්න තියන්න එපා ඔච්චර ලස්සනට තිබිච්ච ගම්මානයක් නිවාස සංකීර්ණයක් අපි අපවිත්‍ර කරන්න හොඳ නැහැ බොහොම අමාරුවෙන් මෙච්චර කල් එය ආරක්ෂා කරගෙන හිටියා ඒ නිසා එය කරන්න එපා මම දන්නවා ගැටලු තිබෙනවා කියලා නමුත් එය කරන්න එපා මොකද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියත් එක්ක අපිට ලොකු ගැටලුවක් තියෙනවා මේ සැරේ ඔක්කොම කුණු ගෙනැල්ලා එතනට දාලා ලොකු වැස්සක් ආපු වෙලාවේ කවුරුත් ආවේ නෑ අපේ ගෙවල් යට වෙනකොට බලන්න. අපේ ගරු විපක්ෂ නායකතුමා ඒ වෙලාවේ ඇවිල්ලා අපේ දුක සැප බලල ගියා මොකක්ද මේ වෙලා තියෙන්නේ කොහොමද යට වුණේ කියලා විස්තර අහලා ගියා. එතකන් කවුරුත් ආවේ නෑ ඊට පස්සේ ආරංචි වුණා අපේ ගරු මන්ත්‍රීතුමා ඇවිල්ලා එක කොටසක කාණු සුද්ද කරලා ගියා කියලා. නමුත් කවුරුත් දන්නෑ මේ එන වතුර ටික බහින්නේ අපේ සොයිසාපුර උතුරු පැත්තෙන් තමයි කියලා. ඒ කාණු ටික බලන්නනම් කවුරුත් එන්නේ නැහැ මම දන්නවා අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කිසිම කෙනෙක් මෙය බලන්න එන්නේ නැහැ. ඒ නිසා මගේ ගේත් මේ සැරේ ගංවතුරට යටවුණා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ පෞද්ගලිකව මුහුණ දීලා තියෙන ගැටලුවක් මේ වෙලාවේ ඉදිරිපත් කරනවා පොදු ප්‍රශ්නයක් කරගෙන. හැබැයි ප්‍රශ්නය පැන නැග්ගේ කසල වෙන් කිරීම සම්බන්ධයෙන්. දැන් එතන ගැටලුව තියෙන්නේ කසල වර්ගීකරණය කිරීම හරහා ජල බැස්ම හිරවෙලා නම් ඔබේ නිවස යටවෙන්නේ කානුවතුර බසින්නේ නැත්නම් සාධාරණයි ඒක එහෙම මතු කරලා තර්කයක් ලෙස ඉදිරිපත් කරලා ඒකට විසඳුම් හොයන එක. විශේෂයෙන් මම දන්නවා අපේ ඔය පන්සලේ හාමුදුරුවෝ පොඩි එහා මෙහාවක් වුණත් ඉක්මනටම කතා කරනවා. එවැනි තත්ත්වයක් තියෙනවා නම් සමාජයේ පැත්තෙන් විශාල විරෝධයක් එනවා. දැන් මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් තමයි මේක මතුවෙන්නේ. සැලකිය යුතු එකක් තියෙන බව මං තේරුම් ගන්නවා. එය ගැටලුවක් නොවෙන විදියට කොහොමද කරන්නේ, කරගන්නේ කියන එක පිළිගනිමින් තමයි මේ කතා කරන්නේ. දිගින් දිගටම අපිට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. අපි මහජන නියෝජිතයෝ අපි ප්‍රශ්න ඉදිරිපත් කරන්න ඕන. මට රෑ එළි වෙනකම් උනත් ඉන්න පුළුවන් මට වෙන ජීවිතයකුත් නැහැ. හැබැයි ඒක නෙමෙයි මගේ වගකීම මේ නිලධාරීන් ඔබ හැමදෙනාම යම් නිශ්චිත කාලයක් ඇතුලේ අවශ්‍ය කටයුතු ටික සාකච්ඡා කරලා සාකච්ඡාවෙන් ප්‍රතිඵලය ජනතාවට යන්න ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමා සමග එකඟයි. නමුත් මම කියන්න හැදුවේ මේ එක ප්‍රශ්නයක් තමයි මෙතන කුණු වර්ග කිරීම . මෙය සොයිසාපුර කරන්න එපා මින් ඉදිරියට මෙතන බේල් එකක් හදල තියෙනවනේ මේ මෙච්චර මිලියන ගානක් වියදම් කරලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කතාවට මම විරුද්ධයි. කුණු වෙන් කිරීමක් මෙතන කිසිසේත්ම සිදු කරන්නේ නැහැ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියලගෙ අදහස් ඔබතුමියලා කියන්න. මම ඔබතුමියට බාධා කළේ නෑ. ඔබතුමිය ඕන තරම් කතා කරන්න මම හරි දේ පෙන්නලා දුන්නා. නමුත් මේ ඔබ තමයි දන්නේ ඔබ ඒ කාලේ ඔය විදියට කතා කරනකොට ඒ පාලනයේ හැසිරිච්ච විදිය. මගේ මතකයේ ඒවා ඕන තරම් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සුදේශ් මන්ත්‍රීතුමා දැන් කතා කරා වගේ 02(13) වැනි කරුණේ තීන්දුවක් අරන් තියෙනවා සභාපතිතුමා උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත වාර්තාවේ ඉල්ලා ඇති කරුණු සම්බන්ධව මේ කියන්නේ බේල් එක භාරව ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විජේසිරිවර්ධනගේ නිර්දේශයත් එක්ක ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත යොමු කිරීමටත් ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානය වෙත කසළ ලබාදීමට පැමිණීමේදී කසල එකතු කරන ලද රථ වාහන වල සේවකයන් විසින් කසල තේරීමෙන් අනතුරුව භාරදිය යුතු බවත්, එහි වගකීම අදාළ කලාප භාර සෞඛ්‍ය පරිපාලකවරුන් විසින් භාරගත යුතු බවත් නිර්දේශ කරන ලදී. දැන් මෙහෙම කමිටුවෙන් තීන්දුවක් දීලා තියෙනවා නගරාධිපතිතුමා. එහෙම තියෙද්දි සුදේශ් මන්ත්‍රීතුමා කියනවා සමහරක් අයගේ කුණු එළියට දාන්න බෑ එහෙම්ම අරන් යනවා කියලා. අපේ පැති වල නම් එහෙම අරන් යන්නේ නැහැ. මොනව හරි කලවම් දේවල් තිබ්බනම් විසික්කරලා යනවා. නැත්නම් රුපියල් සීයක් දෙසීයක් වගේ දුන්නම අරන් යනවා. එහෙම අරන් යන ඒවද දන්නේ නැහැ ඔතනට එන්නේ. සුදේශ් මන්ත්‍රීතුමා ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්න අවශ්‍යයි. ඒ වගේ දේවල් සිද්ධ වෙනවා. ඒ වගේම අපේ කටුබැද්ද නාගරික පශු වෛද්‍යය කාර්යාල ඉදිරිපිට තියෙන කුණු ටිකත් ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම නගරාධිපතිතුමා 02(10) කරුණ සහ 02(11) කරුණු දෙකම එකට ගන්න කැමතියි කොන්ක්‍රිට් කොම්පෝස්ට් බින් ලබාදීම සඳහා අපේ තුසිත් මන්ත්‍රීතුමත් කතා කරලා තියෙනවා ඒ කතාවෙදී මේ වෙනකොට ෆයිනල් ප්‍රොජෙක්ට් එකක් පටන් අරගෙන තියෙනවාද නැද්ද කියලා අපිට පොඩ්ඩක් කියන්න පුළුවන්ද, ඒක හොඳ වැඩක්. බොරුපන ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තද කියලා දැනගන්නා කැමතියි. එතකොට දැන් මේක කවදා වගේ ක්‍රියාත්මක වෙයිද. මොකද කොම්පෝස්ට් බින් එකක් ලබා දෙනවා කියන එක ඉතාමත් හොඳ වැඩක්.මට මතක විදිහට මේ වැඩෙ 2006,2010 කාලයේ ක්‍රියාත්මක වුණා ඊට පස්සේ තාම ක්‍රියාත්මක වුණේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, තෙලවල උතුර කොට්ඨාශයේ මේ වෙනකොට ආරම්භ කරලා තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මන් පොඩ්ඩක් පැහැදිලි කරන්නම් විශේෂයෙන්ම මම මැදිහත් වෙන්නේ සභාපතිතුමාගේ අවසරයත් එක්ක. එතන දැන් තීරණයක් ගත්තේ එක ප්ලේස් එකක් අපි තෝරා ගත්තා නියමු ව්‍යාපෘතියක් විදියටත් තෙලවර උතුර යෝගාශ්‍රම පාර දැන් සමීක්ෂණය මේ කමිටු වාර්තාවේ තියෙනවා. එතකොට දැන් ඒ වාර්තාවත් එක්ක අපි කොච්චර බින්ස් ප්‍රමාණයක් ගන්න ඕනද මොකක්ද අපි කරන්න ඕනේ කියලා කමිටුවේදී එන නිර්දේශයත් එක්ක එන වාර්තාවත් එක්ක අපි ඉදිරියට යනවා. අපි කොච්චර ගන්නවද අපි කොහොමද මිනිස්සුන්ට දෙන්නේ නොමිලේ ලබා දෙනවද, නැත්නම් සල්ලි වලට දෙනවද කියන එක ඊළඟ කමිටුවේදී අපි තීරණය කරනවා. අපිට අදහස් ගන්න වෙන්නේ අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් එක්කත් කතා කරලා තමයි ඒකට නදීන් මහත්තයා පත් කරලා තියෙන්නෙ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දැනට ප්‍රදේශයක් තෝරගෙන තියෙනවා අපි කරනවනම් මෙන්න මේ ඒරියා එකේ කරන්න. ඊළඟට එතන තත්ත්වය සැලකිල්ලට අරගෙන අපි මොනතරම් ප්‍රමාණයකට යන්න ඕනද කියල අඩුම තරමේ අපි ගෙවල් දෙසීයකටවත් ආරම්භය දෙන්න පුළුවන් නම් හොඳයි. ඊට පස්සේ අනිත් ගෙවල් වලට කොම්පෝස්ට් බැරල් ටික කොහොමද සපයා ගන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි මේ සභාවේ මේ ගැන කතා කරන්නේ මෙය ඉතාමත් හොඳ වැඩක් නිසා. අපි බලාපොරොත්තු වුණ වැඩක්. පහුගිය අපේ පාලන කාලේ සිද්දවුණු නැති වැඩක් ඒක නිසා මේ බින්ස් ටික හදනවනම් මිලදී ගැනීමට හැකියාවක් තියෙනවද, මුලින්ම අපි ෆයිනල් ප්‍රොජෙක්ට් එකක් කරද්දි මොරටුවැල්ල උතුර කියලා කියන්නකෝ. අපිටත් බින් එකක් ඕනේ අපිට සල්ලි දීලා ගන්න පුළුවන් හැකියාව තියෙනවද කොහෙද මෙය හදන්නේ? මොනාද කරන්නේ කියලා අපිට දැනගන්න අවශ්‍යයි ඒ නිසා ඊළඟ කමිටුවේදී අපිට මේ සම්බන්ධයෙන් වාර්තාවක් දෙන්න.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ආරම්භ කරන කටයුතු ටික සූදානම් කරගෙන ඔබ කියන තැනට යමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, 02(16) දැන් මේ පී.එච්.අයි. මහත්වරු දෙන්නෙක් එස්. එච්. ආර්. ලක්ෂාන් සහ ඩබ්.එම්.එම්. චතුරංග යන මහත්වරුන් දෙදෙනා නිල ඇඳුම් දීමනාව ඉල්ලලා තියෙනවා. 2025.09.17 දිනැති කමිටු නිර්දේශය පරිදි ඉල්ලා ඇති නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයාගේ වාර්තාව 2025.10.17 දිනැති ආයතන කමිටුවේ කරුණු අංක 05 යටතේ ඉදිරිපත් වී ඇත. එකී ආයතන කමිටු නිර්දේශය පරිදි මහජන සෞඛ්‍ය පරීක්ෂක නිල ඇඳුම් ලබා දීම සම්බන්ධව නැවත වතාවක් පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබා ගැනීමට නිර්දේශ කරන ලදි. නැවත වතාවක් අපි ඇයි ඉල්ලන්නේ, මේ දෙදෙනා විතරක් ඉල්ලන නිසා අපිට අනුමැතියක් දෙන්න බැරිද, මේ නිල ඇඳුම් දීමනාව සම්බන්ධව පොඩ්ඩක් අපිට කරුණු පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙහි ගැටළුව වෙලා තිබුනේ මේ දෙන්නගේ සම්බන්ධ වුනාට පස්සේ, මන් හිතන්නේ ලේකම්තුමා වැඩි අවබෝධයක් තියෙනවා. සම්බන්ධවුනාට පස්සේ ඒ කලින් හිටපු අය දීමනාව අරගෙන තිබුනේ. එතකොට දැන් ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා මේ අවුරුද්දට ඒ දීමනාව

අරගෙන ඉවරයි. එතකොට දෙන්න ගියාම තමයි ඒ ගැටළුව මතු වෙලා තියෙන්නේ. ඒ නිසා මෙය නැවත සාකච්ඡාවකට යන්න ඕන කියලා තමයි දාලා තිබුනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එය දෙන්න පුළුවන් අපිට සාකච්ඡාවක් අවශ්‍ය වෙන්නේ නෑ මොකද ඒ දෙන්නගේ අලුත්ම පත්වීම් දෙක ඒගොල්ලෝ වෙන කොහෙන්වත් මෙය අරගෙන නැහැ. එතකොට අපිට තියෙනවා නම් පී.එච්.අයි.ලට අපි නිල ඇඳුම් දීමනාව දෙන්න පුළුවන් කියලා තීරණයක් මෙයාලා කොහෙන්වත් අරගෙන නැනේ අලුත්ම පත්වීම් දෙකනේ ඒ මිනිස්සු නිල ඇඳුම අඳින්න ඕනනේ. සභාව බැඳිලා ඉන්නවා ඒ මිනිස්සුන්ට මේ නිල ඇඳුම් දීමනාව දෙන්න ඒ නිසා මේ පළාත් පාලන කොමසාරිස්ගෙන් අහා අහා ඉන්න ඕන නැහැ තාත්තගෙන් අම්මගෙන් අහන්න යනවා වගේ හැම එකක්ම. ඒ නිසා අපිට පුළුවන් තීන්දුවක් ගන්න නිල ඇඳුම් දෙනවද නැද්ද කියලා කිසිම ප්‍රශ්නයක් නැහැ අපි නිල ඇඳුම් දීලා තියෙන්නේ මේ වෙනකොට අන්න පී.එච්.අයි.ලට අලුතෙන්ම නිල ඇඳුම් දෙනවනම් තමයි පළාත් පාලන කොමසාරිස්ගෙන් අහන්න ඕනේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ අනවශ්‍ය ගැටලුවක් මේ හදාගෙන තියෙන්නේ ඒ නිසා කොමසාරිස්තුමිය එක්ක කතා කරලා මොකක්ද කරන්නේ කියලා අපි සාකච්ඡා කරමු. අපේ කාඩර් එකේ නිශ්චිත ගානක් තියෙනවා. ඒ ගානට නිල ඇඳුම් දීමනාව දුන්නා ඒ දීපු එකෙන් දෙන්නෙක් මාරුවෙලා ගියා කියන ගැටළුව මතු කරන්නේ. මීට පෙර අපේ හිටපු පී.එච්.අයි මහත්වරු නිල ඇඳුම් අරගෙන තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ ගියපු දෙන්නට වෙන තැනකින් මේ දීමනාව ලැබෙන්නේ නැහැනේ. එතකොට ඒ වගේම අපිට කවුරු හරි වෙන තැනකින් මාරුවීමක් අරගෙන මෙතැනට ආවොත් ඒ කෙනාටත් අපි දෙන්නේ නැනේ මොකද ඒ කෙනා එහෙන් අරගෙනනේ එන්නේ. මේ පී.එච්.අයි මහත්වරුන්ට එක තැනකින් විතරනේ ගන්න පුළුවන්. එතකොට දැන් මේ අය ආවේ කොහෙන්වත් නෙමෙයි මේ අයගේ අලුත්ම පත්වීම මේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපිට තර්ක හදන්න පුළුවන් ඕනෑම විදිහකට, නමුත් දැන් අපි බලන්න ඕන මේ දෙන්නට කොහොමද නිළ ඇඳුම් දීමනාව දෙන්නේ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ අපි සභා යෝජනාවක් ගෙනල්ලා දෙමු කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි මේ සම්බන්ධයෙන් ඉදිරියටත් කමිටුවේදී සාකච්ඡා කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ මතු කරපු කාරණාවන්ට අමතරව අපේ පී.එච්.අයි විජේසිරිවර්ධන මහතා විසින් යොමු කර ඇති කාරණා අතර වාර්ෂිකව සේවකයන් සඳහා සිදුකළ යුතු සෞඛ්‍ය පරීක්ෂාව. මම හිතන්නේ අවුරුද්දකට වතාවක් අපි එක ඉටු කරනවා. තාරක මුණසිංහ මැතිතුමත් ඉන්න නිසා, එතුමා වාර්ෂිකව අපි නගර සභාවේ කරන පරීක්ෂණයක් යම් විදියකින් ටිකක් පුළුල් කරලා සේවකයන්ට අවශ්‍ය කරන සියලු රෝග පරීක්ෂාව ඒවගේම රුධිර පරීක්ෂාව සහ සියළු දේම කරමු 2026 අවුරුද්ද පටන් ගන්න කලින් තාරක මුණසිංහ මැතිතුමන් ලොකු උනන්දුවක් ගන්නවා. එ

නිසා වාර්ෂිකව හෝ දෙවාර්ෂිකව පැවැත් වූ ඒ පරණ සෞඛ්‍ය වැඩසටහන ඒ කඳවුර දෙසැම්බර් මාසයෙන් ඉස්සෙල්ලා පැවැත්වුවොත් ගරු නගරාධිපතිතුමා අලුත් අවුරුද්දට සෞඛ්‍ය සම්පන්නවම මේ සේවකයෝ ටික අරගෙන යන්න පුළුවන්, ඒ නිසා මේ වැඩසටහන දෙසැම්බර් වලට කලින් කරමු කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි අපේ රුධිර පරීක්ෂණය ආයතනය අපි හොඳ මට්ටමින් පවත්වාගෙන යනවා. ඒ නිසා මං ඉල්ලීමක් කරනවා එතන භාවිතා කරන සමහර රසායනික ද්‍රව්‍යයන්ට අමතරව එකක් හෝ දෙකක් කරාට පස්සේ අපිට පුළුවන් අපේ අක්මාවේ තියෙන හුඟක් වෙලාවට පැටීලිවර් කියන තත්ත්වයත් එක්ක ලොකු ආසාදන තත්ත්වයක් ඇති වෙනවා. මේවා පිටින් කරගන්න ගියොත් එහෙම ලොකු වියදමක් යනවා. අඩුම තරමේ අපේ මේ මොරටුව මහා නගර සභාවේ ඉන්න සේවකයෝ ටිකකට හරි, අනිත් එක වකුගඩු පරික්ෂාවට කරන්න තියෙන්නෙත් එක රසායනික ද්‍රව්‍යක් විතරයි. එතකොට ඒකෙදී විශේෂයෙන් අපිට එතන ප්‍රධාන පරික්ෂාවක් කරනවා සුදු රුධිරාණු, රතු රුධිරාණු සහ රුධිර පට්ටිකා ඒ සුදු රුධිරාණු තියෙන්න ඕන නියෝට්රෝපියා කියලා එකට අමතරව තවත් එකක් තියෙනවා පරික්ෂා කරන්න එක කරන්නත් අවශ්‍ය තවත් එක මුලද්‍රව්‍යක් පමණයි. එක කරොත් මම හිතන්නේ සමාන්‍ය රුධිර පරික්ෂාවක් පිටින් කරගන්න ගියොත් රු.30000ක් විතර වියදම් වෙන එකක්. ඒ නිසා එ ටික මේ සභාවේ සේවකයින් සඳහා හරි කර ගන්න තිබ්බනම් හොඳයි කියලා හිතනවා. පුංචි එක මූලද්‍රව්‍යයක් රසායනයක ද්‍රව්‍යයක් ලබා ගැනීම තුළින් කටයුතු දෙකම කර ගත්තොත් මම හිතනවා අපිට 2026 වැඩසටහනේදී පරිපූර්ණ නිරෝගිමත් සෞඛ්‍ය සේවකයෙක් හදාගන්න එකේ මූලික කටයුතු ටික කරන්න පුළුවන් කියලා.

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ අපි සමහර හොඳ පුරුදු දිගින් දිගටම පවත්වා ගත යුතුව තිබෙනවා ඒත් එක්කම සමහරක් වෙලාවට අපිට රැඩිකල් තීන්දු වෙන්න පුළුවන් සමහරක් විට සෘජු තීන්දු වෙන්න පුළුවන් සමහරක් විට අපහසු තීන්දු වෙන්න පුළුවන් කොහොම වුණත් නගරාධිපතිතුමනි දැනට මට තේරෙන එකක් තමයි අපි පුංචි හරි බුරුලක් අපි ගෙනිච්ච ප්‍රතිපත්තියෙන් පිටට අපි ගෙනිච්චොත් අපි අනිවාර්යයෙන්ම ප්ලාස්ටික් පොලිතීන් ඒවගේම කඩදාසි මේවා වෙන් කරලා ගන්න එක අපි පොඩ්ඩක් හරි පාලනෙන් තොරවෙච්ච ගමන් මිනිස්සු මහා පාරට කුණු දාන එක කරනවා. හැබැයි දෙවැනි පාර බුරුළු දුන්නොත් එහෙම අපිට කන්ට්‍රෝල් කරගන්න බැරි මට්ටමක ආරම්භයක් එනවා. ඊට පස්සේ ගියාම අපිට කන්ට්‍රෝල් කරන්න බැරිවෙනවා. එම නිසා අපෙත් වගකීම වගේම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ඒ වගේම අනිත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ඒ වගේම පරිපාලකවරු සහ අපේ සේවකයන්ගේ සමස්ත වගකීම අපෙත් වගකීම ඒ නිසා විශේෂයෙන්ම මම මගේ ටික හරියටම මැනේජ් කරනවා. කොහේ ගියත් ඒ නිසා මම හිතන්නේ මේකට බුරුලක් දෙන්නම නරකයි. ඒ නිසා එහෙම උන ගමන් වෙන්නේ ඔබතුමාගේ පාලනයටත් නගර සභා පාලනයටත් සමස්ත පාලනයටත් කන්ට්‍රෝල් කරන්න බැරි මට්ටමක් එනවා ඒ නිසා අපි ගත්තු ප්‍රතිපත්තියක් තියෙනවා නම් ඒක ඩිවෙලොප් කිරීමයි කරන්න ඕනේ. මම හැමදාම කියන කතාවක් තමයි මේකෙ අපි වර්ග හතළිස් එකක් දක්වා යන්න පුළුවන් ලොකු ආදායමක් එනවා. ඊළඟ අපිට තියෙන ප්‍රශ්නයක් තමයි ඉන්සි ආයතනයෙන් හරි කෙළවරපිටියේ කසල බලාගාරයේ යම් විදියකින් අක්‍රියතාවයක් වුණොත් එහෙම අපිට මේ තියෙන ට්‍රෙක්ටොපැක් ටික යවාගන්න බැරිවෙනවා. එතකොට සතියක් දෙකක් මේක මිනිස්සුන්ට ඉවසගන්න බැරි වුනොත් පාරට ආවොත් එහෙම මොකද කරන්නේ. ඒ නිසා දැනටමත් හුඟක් ගෙවල් වලින් නොවුනත් ගොඩක් ව්‍යාපාර කියනවා අපිට මේක වෙන් කරන්න බැහැ කියලා. මටත් ගොඩක් හිතවත් කට්ටියක් කිව්වා. මං කිව්වා ඒවා වෙනයි මේක අනිවාර්යෙන් කරන්න ඕනේ කරන්න බැරිනම් වෙන තැනකට ගිහිල්ලා දාන්න. ඒ නිසා අපි අපේ නගර සභාවේ ප්‍රතිපත්තිය අපි

අනිවාර්යයෙන්ම ඒ ප්‍රතිපත්තියේ ඉන්න ඕනේ. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපි ඒ තීන්දු කිසිවිටක ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ මහජන පරීක්ෂකවරු හෝ පරිපාලකවරු කිසි ලෙසකින් මේ තියෙන අඛණ්ඩතාවය බිඳ නොහෙලිය යුතුයි. ඒ නිසා මේ සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අපේ මන්ත්‍රීතුමිය කරපු යෝජනාව ගත්තහම ඉතාමත් වැදගත් වෙනවා. එකේ මොඩල් එක යම් විදියකින් මෙතුමා කතා කළා. අපට මොඩල්ස් තියෙනවා. අපි පිළිසරු පොළ ව්‍යාපෘතිය ගෙනාවා ඔබතුමත් දන්නවා නිකසල පුරවරගෙන ආවා. ඒත් එක්කම ලොකු ප්‍රතිඵලයක් ලබා ගත්තා. හුඟක් වෙලාවට අපේ පාසල් වල දරුවන් ආදායම හොයා ගත්තේ ලක්ෂ 2ක් වගේ, මුලින්ම කරේ මේ පිළිසරු ව්‍යාපෘතියෙන් ගත්ත කසල ටික මේ ගැනුම්කරු විකුණුම්කරු හම්බවෙන කසල පොලේ දී විකුණලා. ඒකත් එක්ක අපි කොහොමද මේ නිකසල දරුවෙක් හදන්නෙ කියන වැඩසටහන තමයි මෙතුමිය කියන්නේ. එතකොට ඒකට තියෙන්න ඕන මොඩ්ල් එක අපිට තියෙනවා. ඒ මොඩල් එක අපිට තියෙනවා මම ඒ වැඩසටහන් වලට සම්බන්ධ වෙලා තියෙනවා. ව්‍යාපෘති හදලා තියෙනවා, සැලසුම් හදලා තියෙනවා. එත් එක්කම ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධකම් ඇති කරගෙන තියෙනවා. එතකොට මම කියන්නේ අපේ සියලු දෙනාව එකතුවෙලා මේ වැඩේ කරන්න පුළුවන් නම් පාසල් මට්ටමින් පෙර පාසල් මට්ටමින් අපි කොහොමද සිරිත් පාසලක් බවට පත් කරගෙන ඒ කසල වෙන් කරන වැඩසටහන පාසලෙන් කොහොමද කරන්නේ කියලා කිව්වොත්. ආණ්ඩු මාරු වුනා කියලා පාලනය මාරු වුනා කියලා මේක මේ විදිහට උනොත් එහෙම අපිට අර තිබුණ සුබිත මුබිත රටක් අත්පත් කර ගන්න වෙන්නේ නැහැ.

මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි කොම්පොස් බින් ලබාදීම සම්බන්ධයෙන් අපේ තුසිත් මන්ත්‍රීතුමා හොඳ දක්ෂ මන්ත්‍රීවරයෙක් ඒ වගේම උවමනාවක් තියෙන මන්ත්‍රීවරයෙක්. එතුමා ගෙනාපු යොජනාව නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තියෙන ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවේ රෙඩිකෝ ආයතනය තමයි ඒක හදන්නේ. ඒ නිසා අපිට යම් විදිහකින් සිමෙන්ති වලින් හදලා ඒ ගන්න පුළුවන් ඕන නම් ඒ රෙඩිකෝ ආයතනය හරහා, රජයේ ආයතනයක් ඒක ගන්න පුළුවන්. ඒකඟතාවයකට ආවොත් 50% ගන්න පුළුවන් අපි නම් කරේ පහුගිය කාලේ පරිසර අමාත්‍යාංශයෙන් බස්නාහිර පළාත් සභාවේ මුදල් අරගෙන එක කරා. ඒ වගේම විමධ්‍යගත අරමුදල් වලින් කරා. විශේෂයෙන් මම දැක්කා මේ සංගණනය කරනකොට යම් පිරිසක් කැමති සල්ලි දීලා ගන්න. සමහර අය කැමති නිකන් දෙනවනම් ගන්න. සමහර පිරිසක් හිටියා නිකන් දුන්නත් ගන්න අකමැති. ඒ නිසා මගේ අදහස තමයි ඉසස්ර වෙලාම සල්ලි දීලා ගන්න වුවමනාව තියෙන මිනිස්සු ටිකක් ගෙනුත් මේක ආරම්භ කරා නම් මං හිතන්නේ ඉතාමත් වැදගත් කියලා.

**2025. 10.15 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ ඒකමතිකව සභා සම්මත වූ අංක 03 කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |

10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025. 10.15** **දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ ඒකමතිකව සභා සම්මත වූ අංක 03 කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**2025.10.15 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ ඒකමතිකව සභා සම්මත වූ අංක 03 කරුණ හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මේ අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභාවේ නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය)

**06(5) 2025.10.15 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 02(2) සහ 02(3) ද සොයිසා ජාතක ක්‍රීඩාංගනයේ තණතීරු සම්බන්ධව ක්‍රීඩා භූමි භාරකරු කියලා තියෙනවා. කාරණා දෙකක්ම අපිට කවදද එක හදන්නේ කියලා දැන ගන්න අවශ්‍යයි. ඒ වගේම තමයි අද උදේ අපේ මළල ක්‍රීඩකයෝ දෙන්නෙක් ඇවිල්ලා කිවුවා දුවන එක ගැන. 02(9) කරුණේ ද සොයිසා ක්‍රීඩාංගනයේ අලෝක පද්ධතිය නැවත පිහිටවීම. මෙහි තියෙනවා නාගරික ඉංජිනේරුට කිහිප වතාවක්ම දැනුවත් කර ඇතත් කියන කාරනය සහ 02(7) ද සොයිසා ක්‍රීඩාංගනයේ පවත්වනු ලබන පුහුනු වීම් සම්බන්ධව එකේ තියෙනවා ප්‍රවේශ ගාස්තු සහ ඊට අදාල ගාස්තු නොගෙවා පුහුණු විම් සිදුකරන බව ඉදිරිපත් කරමි. අද දින ගරු නගරාධිපතිතුමා දුරකථනයෙන් මා වෙත දැනුවත් කර උපදෙස් දුන් බැවින් ඔවුන් හට දැන්වීම සඳහා දැන්වීමක් පළ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමි.දැන් ඔබතුමා කියලා තියෙනවා දුරකථනයෙන් ඒ ක්‍රිඩාභූමි භාරකරු ඔබතුමා කියලා තියෙනවා කටවත් සල්ලි ගෙවන්නේ නැතුව පුහුනු වීම් කටයුතු කරන්න දෙන්න එපා කියලා. දැන් එතුමා එහෙම ඒ ලිපියෙන් ලියලා තියෙනවා. එතකොට එක කියලා තියෙන්නේ ගිය මාසේ එපිට මාසේ මේ ලියුමේ කියනවා දැන්වීමක් සකස් කරලා දෙන්නලු එතකොට අද ආපු අර මෙඩ්ල් ගත්ත දරුවන්ගේ පුහුනුකරු කියනවා එයා රුපියල් 400ක් දවසට දෙනවලු එයාගේ පුහුණුවීම් ලබන පහළොස්දෙනා 100 ගානේ දෙනවලු. ඇත්තටම මේ අපේ මොරටුවේ දරුවොනේ. එයාලාගෙන් සල්ලි ගනන්වද නොගන්නවද කියන එක ඔබතුමාලාගේ තීන්දුවක්. නමුත් ක්‍රිඩාභූමි භාරකරු කියනවා ඔබතුමා කිවුවලු කාටවත් සල්ලි දෙන්නේ නැතුව ක්‍රිඩා කරන්න දෙන්න එපා කියලා. පුහුණුකරුවෙකුගෙන් 400ක් සහ කුඩා දරුවෙකුගෙන් 100ක් දවස ගානේ සල්ලි ගන්නවලු එයාලා ග්‍රවුන්ඩ් එකට ආවත් ගන්නවලු. දැන් අපේ මන්ත්‍රීවරයෙක් ආණ්ඩු පක්ෂයේ ඉන්න කාලේ කරපු වැඩකින් තමයි මේක සිදුවුනේ. සයිට් වලට ගිහින් ග්‍රවුන්ඩ් එක් භාරනවලු ඒ නිසාලු මුදල් අය කරන්න ආවේ. මේ මොරටුවේ දුප්පත් දුවා දරුවෝ ඇත්ලටික් කරලා ඉස්සරටහ යන්න අවස්ථාව දෙන්න. මේකට හරි ක්‍රමවේදයක් හදන්න. "උක්ත කරුණ සලකා බැලු කමිටුව මුදල් නොගෙවන පුහුණුකරුවන් හට ප්‍රවේශ ගාස්තු සහ පුහුණු කිරීමේ ගාස්තු ගෙවීමට දැන්වීමටත්, ඒ දැන්වීම සඳහා ප්‍රියන්ත කියලා තියෙනවා බොඩ් එකක් දෙන්න කියලා". තවද සභාව මඟින් වෙන්කරනු ලබන ක්‍රිඩාංගන පිළිබඳව ක්‍රීඩාභූමි භාරකරුවන් දැනුවත් කිරීම මේ සභාවේ පණිවිඩ කරුවන් මඟින් යවන්නලු. මේ සම්බන්ධව නාගරික ගණකාධිකාරිව දැනුවත් කිරීමට නිර්දේශ කරන ලදි. ඔබතුමා මොකක් හරි උපදෙසක් දෙන්න සභාපතිතුමාට හරි මේ විදිහට ක්‍රියාත්මක කරන්න කියලා නැතිනම් අර දරුවෝ අසරණ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මා මේ සඳහා පිළිතුරක් ලබා දෙන්නම්. පුහුණුකරුවන් සිව් දෙනෙක් සිටිනවා. හතර දෙනෙක්ගෙන් එක පුහුණුකරුවෙක් පමණයි නිත්‍යානුකූලව ගෙවන්නේ ජයශාන්ත කියන

